## 2020/12/08 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2020/12/08 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩ්රආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

### 01. ආගම සිහි කිරීම

2020.12.08 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

මම පළමුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ආගම සිහි කිරීමේදි මූලසුන දිහා බලාගෙන ආගම සිහි කරන්න. ආගම සිහි කරන්න මූලාසනේ දිහා බලාගෙන. ඒකයි සාමාන්‍යයෙන් ක්‍රමවේදය. අද විශේෂිත වූ සභාවාරයක් වුනත් අපේ මන්ත්‍රීතුමන්ලගෙ, මන්ත්‍රීතුමියන්ලගෙ පැමිණීමේ දුර්වලතාවයක් පෙන්වනවා. මොකද කාල වේලාව ඉක්ම ගිහිල්ලා. නමුත් පැමින සිටින මන්ත්‍රීවරුන්ගෙන් සභාව මෙහෙයවීම අපේ වගකීමක්. ඒ අනුව මේ අවස්ථාවට පැමිණි අපේ උප සභාපති ගාමිණී සුසන්ත මැතිතුමා ප්‍රමුඛ සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පිළිගන්නවා. විශේෂයෙන්ම අද නවක මන්ත්‍රීතුමියක් සභාවට පත්වී ඇවිත් තියෙනවා. එක්සත් ජාතික පෙරමුණෙන් ලැයිස්තුවෙන් පත්කරපු අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය ඉල්ලා අස්වීම වෙනුවෙන්, පුරප්පාඩු වූ ඒ මන්ත්‍රී ධූරය වෙනුවෙන් ගම්මැද්දෙගොඩ කොට්ඨාසය නියෝජනය කරමින් කාරියවසම් හේවමානගේ නදීකා දර්ශනී මන්ත්‍රීතුමිය අද පැමිණ තියෙනවා. මීට දවස් කීයකට උඩදි ගැසට් නිවේදනය අනුව දිවිරුම් දීල මන්ත්‍රීතුමියක් හැටියට පත් වුනා. එතුමිය ඉතාමත් ගෞරවයෙන් මේ අවස්ථාවෙ පිළිගන්නවා. කොහොම නමුත් සභා නීති රීති පිළිපැදගෙන, සභාවෙ කටයුතුවලට සහය දක්වමින්, තමන්ගෙන් වියයුතු සමාජ සේවාවන් ඉදිරි කාලයෙදි කරන්න ඔබතුමියට ධෛර්යය වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අපේ සභා කටයුතුවලට පූර්ණ දායකත්වය, සහයෝගය ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව මේ අවස්ථාවෙ පැමිණි ගරු උප සභාපතිතුමා මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සියලුම දෙනා ඉතාමත් ගෞරවයෙන් මේ අවස්ථාවෙ පිළිගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරනවා.

**(අ)01. 2020.11.10 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත.**

**2020.10.13 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රි විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. ග්‍රාමීය මාර්ග සහ අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මගින් මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා මාර්ග පිළිබ තොරතුරු කැඳවීම මැයෙන් 2020.10.16 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. ආර්.කේ.නාගොඩවිතාන මයා, සිත්නෙත් ක්‍රීඩා සමාජය, ඇල්ලෙගෙවත්ත, යටලමත්ත විසින් ක්‍රීඩා පිටියක් තැනීම සඳහා බිම් කොටසක් ලබා ගැනීම යන මැයෙන් ගාලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරාල මැතිතුමා වෙත 2020.11.22 දිනැතිව යොමු කරන ලද ලිපියේ පිටපත සභා ගත කරන ලදී.

03. එම්.ඒ.වසන්ත මයා, රියදුරු, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් පී එෆ් 7360 කැබ් රථයේ රක්ෂණ සහතිකය හා ආදායම් බලපත්‍රය අලුත් කිරීම සම්බන්ධව 2020.11.30 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

04. ප්‍රාදේශීය සභා ගරු උප සභාපති එම් කේ. ගාමිණී සුසන්ත මහතා විසින් යොමු කරන ලද සිළිංඩර් ලබාගැනීම සම්බන්ධව 2020.08.18 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. හත්තිටියගොඩවත්ත, ඌරල, වදුරඹ ප්‍රදේශවාසීන් විසින් ඌරල හත්තිටියගොඩවත්ත මාර්ගය අවධානම් තත්වයකට පත්වී ඇති බව දන්වා 2020.11.18 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

06.කේ.ඒ.පද්මසිරි මයා, දික්හේනගොඩකන්ද, කුරුපනාව විසින් යොමු කරන ලද මාර්ගයක් කොන්ක්‍රීට් කර ගැනීම සම්බන්ධව 2020.11.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

07. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන ලද යෝජනා ඉදිරි කටයුතු සහා යොමු කිරීම මැයෙන් 2020.11.12 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී

08. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් ප්‍රාදේශී සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්ථන)-2019 මැයෙන් 2020.11.09 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

09. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා මගින් දීප්ති ක්‍රීඩා සමාජය, උඩුගම විසින් උඩුගම දකුණ මහජන ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

10. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් මාර්ග සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධව 2020.12.07 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

11. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් 2020 දෙසැම්බර් මාසික සභා රැස්වීම සඳහා මදක් ප්‍රමාද වී පැමිණෙන බව දන්වා 2020.12.07 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

12. ඉංජිනේරු කාර්යාලය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, උඩුගම ඩිපෝව සහකාර කළමනාකාර (ඉංජිනේරු) විසින් අංක 252-6478 කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා වාර්තාව ලබා දීම යන මැයෙන් 2020.12.04 දිනැතිව යොමු කරන ලද අළුත්වැඩියා වාර්තාව සභාගත කරන ලදී.

13. ප්‍රියන්ත සෙනවිරත්න මයා, දලුක්ගල්දෙණිය, යටලමත්ත විසින් දලුක්ගල්දෙණිය සිට අරාලකන්ද දක්වා මාර්ගය පිළිසකර කර ගැනීම සම්බන්ධව 2020.11.18 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

14. එන්.කේ.ගුණසේන මයා, කනත්තගොඩ, යටලමත්ත විසින් යටලමත්ත විලකොළදෙණිය පාර ඉද්දදෙණිය පාරට සම්බන්ධ වන පාර ජේ.සී.බී.යන්ත්‍රයක් යොදා සකස් කර ගැනීම සම්බන්ධව 2020.11.20 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

15. 2021 වර්ෂයට අදාළව නාගොඩ ප්‍රාදේශීය සභාවේ පවාර්ෂික දේපළ බදු දීම සම්බන්ධ ප්‍රසම්පාදන දැන්වීම සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

1. ප්‍රධාන කාර්යාලයේ තීන්ත ආලේප කිරීම සහ ගේට්ටු අළුත්වැඩියාව හෝ අලුතින් සෑදීම
   **ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2. උඩුගම උප කාර්යාලයේ පුස්තකාලයේ ඉදිරිපිට ගේට්ටු කණු සමඟ ගේට්ටුව සෑදීම
   **ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

3. උඩුගම උප කාර්යාලයේ පැති තාප්පය සෑදීම සහ කොඩි කණු ස්ථාපිත කරන ස්ථානයක් සෑදීම
   **ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

4. මාපලගම වෙළඳ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කොට අළුත්වැඩියා කිරීම
   **ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

5. පී.එෆ් 7360 දරණ කැබ් රථයේ රක්ෂණ සහතිකය සහ ආදායම් බලපත්‍රය කල් ඉකුත් වීමට සීමිත දින ප්‍රමාණයක් ඇති බැවින් එය අලුත් කිරීම සඳහා කැබ් රථය දුම් පරික්ෂාවට ලක් කර රක්ෂණ සහතිකය හා ආදායම් බලපත්‍රය ලබා ගැනීමට යෝජනා කරමි.
   **ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

6. අප ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන පෙර පාසල් 15 තුල 2020 වර්ෂයේ අධ්‍යාපනය හදාරා විධිමත් පාසල වෙත යන දරුවන් 245 දෙනෙකු සඳහා ත්‍යාග ලෙස පොත් සහ පාසල් උපකරණ ලබා දීමට සහා අරමුදලින් රු. 250,000.00 ක් වියදම් දැරීමට යෝජනා කරමි.

   **ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

7. උඩුගම සති පොළෙහි නව කඩ කාමර ඉදි කිරීමට අදාළව පළමු අදියර වශයෙන් කඩ කාමර සඳහා කොන්ක්‍රීට් කණු සිටවා වහලය සකස් කිරීමේ කටයුතු ඍජු ශ්‍රමික කටයුතු යටතේ සිදු කිරීමට යෝජනා කරන අතර, ඒ සඳහා පැරණි පොළ කොටසින් භාවිතයට ගත හැකි අමුද්‍රව්‍යයන් යොදා ගැනීමටත්, තල්ගස්වල පොළ භූමියෙන් කපා ඉවත් කරන ලද ඇලස්ටෝනියා ගසෙහි කඳෙන් අවශය ලී ප්‍රමාණයන්ද ඉරා යෙදීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

8. 2021 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා අරමුදලේ ලැබීම් හා වියදම් සම්බන්ධයෙන් හා සභාවට අවශය උපදෙස් ලබාදීම සඳහාත් ඊට අදාළ කාර්ය කටයුතු පිළිබඳව මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහාත් මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවසන් තීරණ සභාවට සළකා බැලීම සඳහා යොමු කිරීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගෙන් සමන්විත සංයුතිය 05 ක් වන කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**I. මුදල් හා ප්‍රතිපත්ති කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා,
ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය
තරංග සුදර්ශන මන්ත්‍රීතුමා
අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2021 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල ල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහාත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත සංයුතිය 06 ක් වන කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**II. කාර්මික සේවා කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා
ගරු මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2021 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල ල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්ල අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහාත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත සංයුතිය 06 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**III. නිවස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
ගරු මන්ත්‍රිනී කේ.එච්.එම්. නදීකා දර්ශනී මහත්මිය

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2021 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල ල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්ල පරිසර විෂයෙහිලා බලපත්‍ර ලබාදීමේදී නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් ල පරිසර ගැටළු සම්බන්ධව උපදෙස් ලබා දීම හා නිර්දේශ ලබා දීම සඳහාත් සංයුතිය 05 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් සහා නිලධාරීන්ගන් සමන්විත කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**IV. පරිසර කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා
ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා
ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මහතා
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා
මහජන සෞඛ්‍ය පරීක්ෂක (කොට්ඨාශයට අදාළ)
මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරී
අවශ්‍යතාවය මත බාහිර ආයතනික නිලධාරීන්

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2021 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල ල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්ල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත්ල සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**V. ටෙන්ඩර් කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා
ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2021 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල ල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහාත්ල මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්ල ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවශ්‍ය නිර්දේශ ලබාදීම සඳහාත් සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමටත්ල අවශ්‍යතාවය මත තාක්ෂණ දැණුම ඇති බාහිර ආයතනික පුද්ගලයින්ගෙන්ද සමන්විත කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

**VI.තාක්‍ෂණ ඇගයුම් කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී ගයාන් මධුෂංක මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය
ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2021 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහාත් මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් පුස්තකාල කටයුතු සම්බන්ධයෙන් අවසන් තීරණ සබාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත් සංයුතිය 05 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමටත් පාඨක සමාජ සාමාජිකයන් ඇතුළුව කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

**VII. පුස්තකාල උපදේශන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මහත්මිය
ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රිනී කේ. ඒ. චන්දිමා දිල්රුක්ෂි මහත්මිය
ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2021 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල  කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත්  සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**VIII . ප්‍රසම්පාදන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා
ගරු මන්ත්‍රී අජිත් එඩේර්ආරච්චි මහතා

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

9. මෙහෙයුම් හා කාර්යසාධන විගණනය - 2020 , ආදායම් අය කිරීම සම්බන්ධ පරික්ෂාව යන ජාතික විගණන කාර්යාලයෙන් සිදු කරන ලද විගණනයේදී පෙන්වා දී ඇති දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස් විසින් අත්සන් කරන්නට යෙදුනු අංක දපපා/සං/02/05/17 දරණ පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1/2009- සං අනුව ප්‍රා දේශීය සභාවන් සතු පොළ කළමනාකරණය සඳහා පොළ කළමනාකරණ හා මූල්‍ය කමිටුව සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව වශයෙන් කමිටු දෙකක් පිහිටුවීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

10. මෙහෙයුම් හා කාර්යසාධන විගණනය - 2020 , ආදායම් අය කිරීම සම්බන්ධ පරික්ෂාව යන ජාතික විගණන කාර්යාලයෙන් සිදු කරන ලද විගණනයේදී පෙන්වා දී ඇති දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස් විසින් අත්සන් කරන්නට යෙදුනු අංක දපපා/සං/02/05/17 දරණ පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1/2009- සං, 03 වගන්තිය ප්‍රකාරව පොළ නඩත්තු කටයුතු සඳහා වෙනම ගිණුමක් ආරම්භ කර එහි වාර්ෂික ආදායමෙන් 20% ක් එම ගිණුමට බැර කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

11. ආර්.කේ.නාගොඩවිතාන මයා, සිත්නෙත් ක්‍රීඩා සමාජය, ඇල්ලෙගෙවත්ත, යටලමත්ත විසින් ක්‍රීඩා පිටියක් තැනීම සඳහා බිම් කොටසක් ලබා ගැනීම යන මැයෙන් ගාලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරාල මැතිතුමා වෙත 2020.11.22 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය අනුව ඇල්පිටිය වැව්ලි සමාගම සතු යටලමත්ත හංදිය ආසන්නයේ සුහද අවමංගල්‍යාධාර සමිති ශාලාව අසළ යටලමත්ත - නාගොඩ ප්‍රධාන පාරට මුහුණලා පිහිටි ඉඩමෙන්, ඉඩම් කැබැල්ලක් ලබා දීම සුදුසු බවට අමාත්‍යතුමා වෙත දන්වා යැවීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 38 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

<u>2020.12.08 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2020 නොවැම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 9722.75 |
| 8617046104 | - උඩුගම බහුකාර්‍ය මධ්‍යස්ථානය | - රු. 1319.70 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1722.30 |
| 45109082908 | - උක්ඹිවිට පෙර පාසල | - රු. 258.30 |

**2020 ඔක්තෝම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 8619142704 | - රන්කැකුළු පෙර පාසල | - රු. 258.30 |

**2020 සැප්තැම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 313.20 |

**2020 අගෝස්තු මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 276.60 |

**02. 2020 ඔක්තෝම්බර් මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912296537 | - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම | - රු. 3294.97 |
| ii. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 4620.61 |
| iii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 512.49 |
| iv. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 3482.98 |

**03. මොබිටෙල් පුද්ගලික සමාගම**
පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2020.10.25) - රු. 669.73
සම්බන්ධතාවය විසන්ධි කිරීම සඳහා ගෙවීමට ඇති මුළු හිඟ මුදල පියවීම

**04.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

| | | |
|---|---|---|
| 33/53/003/008/11 | - උඩුගම උප කාර්යාලය (2020.10.21- 2020.11.21) | -රු. 1549.80 |
| 33/53/003/009/10 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.10.21- 2020.11.21) | -රු. 2111.06 |

<u>**05 .2020 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා)**</u>

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 2886.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**06. 2020 දෙසැම්බර් මස ගමන් වියදම්**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 788.00 |

**07. 2020 නොවැම්බර් මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 700.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 3030.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 1420.00 |

**08. 2020 සැප්තැම්බර් මස ගමන් වියදම්**

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| දම්මි ගීතානි විජේසේකර | - පෙර පාසල් ගුරු | - රු. 810.00 |

**09. අතිකාල දීමනා ගෙවීම්**

**2020 නොවැම්බර් මස**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.04 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 416.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8500.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 3575.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8666.40 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 5555.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1458.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8596.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 7169.40 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - අනියම් විදුලි කාර්මික | - රු. 3543.00 |
| ජී.එල්. උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1753.12 |
| කේ.එච්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - අනියම් රියදුරු | - රු. 5157.00 |

**10. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

| | |
|---|---|
| i. 2020 නොවැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත | - රු. 78000.00 |

**11. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**2020 නොවැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 487ක් | - රු. 50648.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 193 ක් | - රු. 20072.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 130 ක් | - රු. 13520.00 |
| LL 7366 ට්‍රක් බවුසර් රථය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5200.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 160 ක් | - රු. 16640.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 30 ක් | - රු. 3120.00 |
| DS 40 Oil 2L | - රු. 1500.00 |
| ගබඩාව පෙට්‍රල් ලීටර් 25 | - රු. 3425.00 |

2T Oil ලීටර් 1 - රු. 500.00
විෂබීජනාශක දියර ලීටර් 05 - රු. 1000.00

එකතුව **- රු.115625.00**

**12.නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයාල ගාල්ල**

i. 2020.12.07 දින කැඳවූ එල් 13814 ( ගල්වාන පිංවත්ත පාර) දරණ නඩුවට අදාළව වෙනුවෙන් නීතිඥ හා පෙනී සිටීමේල - රු. 3000.00

**13. ඒ.ඩී.කරුණාරත්න මයා, නාගොඩ**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 නොවැම්බර් - රු. 7120.00

**14. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 නොවැම්බර් - රු. 6030.00

**15.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

පාරිභෝගික ජල අවශ්‍යතා වෙනුවෙන් ණය පදනම මත ජල ඒකක 30 ක් ලබා ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම - රු. 4050.00

**16.දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ**

වැටුපෙන් අයකරගත් මුද්දර බදු හා බලපත්‍ර ගාස්තු ලෙස අය කල 10% මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශනය කිරීම - රු. 8460.00

**17. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ,**

PF 7360 දරණ කැබ් රථය රක්ෂණ කිරීමේ ගාස්තුව - රු. 74839.00

**18.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 නොවැම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු27500.00
ii. 2020 නොවැම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු.1365.00
iii. 2021 අයවැය වාර්තාව පිටපත් 45 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු.12745.00

**19. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා දෙසැම්බර් මස මාසික කුලීය ගෙවීම- රු. 5000.00

**20. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

i. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා අත්මේස් මිළදී ගැනීමේ බිල්පත - රු. 1000.00

**21. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**

i. ප්‍රාදේශීය සභාවේ 2020.11.10 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 6400.00

**22. කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්, යක්කලමුල්ල**

i. වීථි පහන් උපාංග ලබා ගැනීමේ බිල්පත - රු. 47506.25

ii. වීථි පහන් උපාංග ලබා ගැනීමේ බිල්පත - රු. 50900.25
iii. වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය තම්බ්ලර් ස්විච් මිළදී ගැනීමේ බිල්පත - රු. 5400.00

**23. සදරු ග්‍රයින්ඩ් ඇන්ඩ් ග්‍රොසරි, නාගොඩ**

i. ප්‍රාදේශීය සභාවේ 2020.11.10 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 4702.00
ii. පුස්තකාලවල පොත් විෂබීජානුහරණය සඳහා කපුරු බෝල පැකට් මිළදී ගැනීමේ බිල්පත - රු. 630.00
iii. සෞඛ්‍ය කම්කරුවන් සහ වැඩ/ක්ෂේත්‍ර කම්කරුවන් සඳහා සබන් මිළදී ගැනීමේ බිල්පත - රු. 5952.00

**24. ජයන්ත ඉලේපෙරුම, ජේ.පී.කමියුනිකේෂන්, නාගොඩ**

I. අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා අවශ්‍ය නියෝග සහ සිහිකැඳවීම් ලිපි ඩුප්ලෝ මුද්‍රණය සඳහා අදාළ බිල්පත - රු. 3950.00
II. 2021 අයවැය වාර්තාවේ වර්ණ මුද්‍රණ, මුල් කවර සහ අවසන් කවර මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 11700.00

**25. විගණකාධිපතිල විගණන කාර්යාලය**

i. භිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**26. සෙල් එක්ස් කම්පියුටර්ස්, කිතුලම්පිටිය**

උඩුගම උප කාර්යාලයේ ඇඟිලි සළකුණු යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 5000.00

**27. අරුණ ඉලෙක්ට්‍රිකල්ස්, යක්කලමුල්ල**

වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 34400.00

**28. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 නොවැම්බර්) - රු.13000.00

**29. චාමින් හාඩ්වෙයාර්, නියාගම**

කොම්පෝස්ට් පොහොර හලන යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සහා යොදා ගත් ද්‍රව්‍ය සඳහා මුදල් ගෙවීම - රු. 11185.00

**30. නිව් විජය මෝටර්ස්, ගාල්ල**

පී එෆ් 7360 කැබ් රථය සඳහා රෝද 4 වැල් කරවල් 4 අලුතින් දැමීම, වීල් බැලැන්ස් කිරීම සහ එලයිමන්ට් චෙක් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම - රු. 3550.00

**31. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**

තල්ගස්වල සති පොළ භූමියෙහි පැවති අනතුරුදායක ගස් දෙකක් ඉවත් වහලයට සිදු වූ අලාභය පිළිසකර කිරීමට වැය වූ බිල්පත - රු. 10490.00

**32. ඊ.ඒ. සමන් කුමාර මයා, උඩුගම**

LL 7366 දරණ බවුසරයේ දුම් බටයේ දැල අලුතින් සෑදීම සහ සවි කිරීමේ බිල්පත - රු. 5900.00

**33. ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**

පී එෆ් 7360 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 18180.00

**පොදු අරමුදල් කර්මාන්ත**

**34. සී/ස බද්දේගම බටහිර ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, බද්දේගම**

සංවර්ධන අංශයේ පිටුපස කොටසේ වහල සැකසීම සඳහා යොදාගත් වයි කණු සඳහා ගෙවීම් කිරීම - රු. 4700.00

**35. ටී.චාමර සුපුන් සුරංග මයා, නාගොඩ**

ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශයේ වහල අළුත්වැඩියා කිරීමට අදාලව වඩු කුලීය සඳහා ගෙවීම් - රු. 2400.00

**රජයේ ආධාර**

**ග්‍රාමීය මාර්ග කි.මී.1000 සංවර්ධනය - 2019**

**36.උඩලමත්ත නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය, උඩලමත්ත**

උඩලමත්ත අලුත්නුවර සිට ධර්මදූත බෞද්ධ මධ්‍යස්ථානය දක්වා ගමන්ගන්නා මාර්ග සංවර්ධනය කිරීම කර්මාන්තයේ රැදවුම් මුදල් ගෙවීම - රු. 59501.65

**37. කුරුපනාව ගොවි සංවිධානය, කුරුපනාව**

ප්‍රියදර්ශනාරාම පන්සල පාර සංවර්ධනය කිරීම කර්මාන්තයේ රැදවුම් මුදල ගෙවීම - රු. 51217.18

**38. මන්ත්‍රී ප්‍රතිපාදන - ගරු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමා**

උඩුගම රෝහල අසළ පිවිසුම් මාර්ගය සඳහා $2^1 x 8^1$ ප්‍රමාණයේ හියුම් පයිප්ප 03 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 31275.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**10.** 2021 වර්ෂයට අදාල අයවැය වාර්තාව සභා අනුමැතියට ඉදිරිපත් කිරීම

## 2021 අයවැය ගැන සභාපතිතුමාගෙන්.................

සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීමේ අරමුණ යථාර්තයක් බවට පත් කිරීමේ ක්‍රියාන්විතයක් පිළිබඳ සාකච්ඡා කෙරෙන මෙම වකවානුව තුළ එයට සමගාමීව අප ප්‍රාදේශීය සභාව ද අවශ්‍ය සැලසුම් සම්පාදනය කරමින් සිටින අතරතුර 2021 වර්ෂයේ සභාව සතු අයවැය ඉදිරිපත් කිරීමට ලැබීමත් සතුටට කරුණක් බව ප්‍රථමයෙන් ප්‍රකාශ කර සිටිමි. පසුගිය කාල වකවානුව තුළ සිදුවන විවිධ දේශපාලනික හේතුන් මත මධ්‍යම රජයට පවා නිශ්චිත අයවැයක් රටට ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාව ගිලිහී ගිය බව ඔබ අප කවුරුත් දන්නා පැහැදිලි සත්‍යයකි. යම් විදියකින් මධ්‍යම රජයේ අයවැය ඉදිරිපත් වූයේ නම් අප සභාවද මීට වඩා සංවර්ධනාත්මක පියවර කිහිපයක් ඉදිරියට තබන්නට හැකියාවක් තිබුණි. එමෙන්ම 2020 වර්ෂයේ මුල් භාගයේ සිට මේ දක්වා ලෝකයටම මහා හිරිහැරයක් වුණ covid 19 වසංගතය නිසා අප රට ද යම් පසුබෑමකට ලක්ව තිබේ. රටක් සංවර්ධනය විය යුත්තේ එරට වැසියාගේ ජන ජීවිතය පදනම් කරගෙනය. ඒ අනුව අප සියලු දෙනාගේ එකම අරමුණ විය යුත්තේද ජනතාව මෙම වසංගතයෙන් බේරා ගැනීමයි.

ලෝකයේ සෙසු රටවලට සාපේක්ෂව අප රටේ මිනිසුන් වාසනාවන්ත වූයේ මරණ අනුපාතය අවම කර ගැනීමට සමත්වීම නිසාය. මෙම අභියෝගාත්මක අවස්ථාවේ එයට මුහුණ දීමත් රටේ

සංවර්ධනයත් යන ක්‍රියාදාමයන් දෙකම එකවිට සිදු කිරීමට සිදු ව තිබේ. අප සභා බල ප්‍රදේශයේ යෝජිත සංවර්ධන කාර්යයන් පසුගිය වර්ෂය තුළ විශාල ප්‍රමාණයක් ක්‍රියාවට නැංවීමටත් ඒවා යම් ප්‍රමාණයක් අවසන් කිරීමට හැකිවීමත් අප ලද ජයග්‍රහණයක් කොට සැලකිය හැකිය. කුමන තත්වයක් මත හෝ ජනතාව මරණ බියෙන් ගලවා ගැනීම අප රජයේත්, අපගේත් එකම අරමුණ බව තරයේම ප්‍රකාශ කරනු කැමැත්තෙමු.

නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාගේ නිල කාලය තුළ ඉදිරිපත් කෙරෙන තෙවැනි අයවැය ලේඛනය, මෙම ලේඛනය වන අතර ඒ සඳහා සියලු පාර්ශවයන්ගෙන් ලැබුණු දායකත්වය හා සහයෝගය මෙහි දී අගය කරන අතර, ඒ සඳහා ස්තුතිය පුද කරමි.

මෙහිලා විශේෂයෙන් සඳහන් කළයුතු කරුණු කිහිපයක් ඔබගේ අවධානය පිණිස යොමු කරවීම මාගේ යුතුකමක් හා වගකීමක් ලෙස සලකමින් පහතින් සටහන් කරමි.

එහි දී ප්‍රථමයෙන්ම සඳහන් කළ යුත්තේ පසුගිය වර්ෂය පුරාම පාහේ රටතුළ උද්ගතව පැවති කොරෝනා වසංගතය හේතුවෙන් ජන ජීවිතයට අදාල බොහෝ දේ මෙන්ම සභාව මගින් යෝජිත සංවර්ධන කටයුතු ද බොහෝමයක් අඩාල වීමයි. එහෙත් සභාව මගින් කළ යුතු අත්‍යාවශ්‍ය සේවා නොකඩවා සිදු කිරීමට වග බලා ගත් අතර, සුළු සුළු පසුබෑම් ද නැතුවා නොවේ. එමෙන්ම අප රජය පත්වීමෙන් පසුව නාගොඩ නගරය නව නගරයක් ලෙස පුළුල් කිරීමේ වැඩ සටහන මේ වන විට සැලසුම් කර මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කර අවසන් අදියරයේ ඇත. ඊට අමතරව උඩුගම ඇප්ත්‍රොප්වත්ත ඉඩමෙන් අක්කර 5 ක පමණ භූමි ප්‍රමාණයක් සභාව සතු කරගැනීම මේ වන විට ක්‍රියාත්මක මට්ටමේ පවතී. අඩු ආදායම් ලාභී ගැමි ජනතාවගේ නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ආවරණය වන පරිදි නිවසක් තනා දීම අපගේ අධීක්ෂණයෙන් හා නියාමනයෙන් යුතුව ක්‍රියාවට නංවා තිබේ. ගැමි ජනතාවගේ ආර්ථික පුනර්ජීවනය සඳහා ගෙවතු වගා වැඩ සටහනට සමගාමීව සෑම ගමකම පැළ තවානක් ආරම්භ කිරීම සභාවේ මැදිහත් වීමෙන් සිදු කරවීම විශේෂයෙන් ශ්‍රී ලංකීය ජන සමාජය අන් කවර දාකටත් වඩා වංචාවෙන් සොරකමින් හා දුරාචාරයෙන් දූෂිත බවට පත් වෙමින් තිබෙන බව තිත්ත ඇත්තක් බව නොරහසකි. මේ සඳහා දඬුවම් හෝ නීතිය ක්‍රියාත්මක කරවීම මගින් පමණක්ම විසඳුම් සෙවිය නොහැකි බව සමාජ විද්‍යාත්මක සත්‍යයකි. මෙහි දී වඩාත් සාර්ථක වන්නේ මිනිසා සතු ආකල්පමය වෙනසක් ඇති කරවීමයි. ඒ සඳහා නායකත්වය මෙන්ම සමාජ තත්වය ද උසස් කළ යුතුය. විශේෂයෙන් අප බල ප්‍රදේශය තුළ නිදහස් වාතාවරණයක් ඇති කරවීම අප සතු වගකීමක් විය යුතුය. මේ සඳහා නවීන තාක්‍ෂණයද උපයෝගී කරගත හැකි වන අතර, සභා බල ප්‍රදේශයේ සෑම නගරයක් ආශ්‍රිතවම CCTV කැමරා පද්ධතියක් සවි කර ක්‍රියාත්මක කරවීමට මෙම වර්ෂය තුළ අදිටන් කරගෙන ඇති බවත්, සතුටින් ප්‍රකාශ කරමි. කෙසේ වෙතත් ඉදිරියේ දී රටේ පවත්නා වාතාවරණය විසින් මේ සියලු සැලසුම් හා වැඩසටහන් තීරණය වනු ඇත යන්න මාගේ විශ්වාසයයි.

2021අයවැය වෙනුවෙන් සුභ පැතුම් පිරිනමන මේ අවස්ථාවේ ඒ සඳහා වෙහෙස මහන්සි වූ හා සහයෝගය ලබා දුන් සියලුම දෙනාට හා අප සභාවටත් අපටත් ශක්තියක් වන සියලුම දෙනා සිහිපත් කිරීම මාගේ යුතුකමක් කොට සලකමි. විශේෂයෙන් දකුණු පළාත් නව ආණ්ඩුකාරවර **ආචාර්ය විලී ගමගේ මැතිතුමා** අප සභාවට අයවිය යුතු මුද්දර ගාස්තු සහ දඩ මුදල් ක්‍රමානුකූලව කළමනාකරණය කොට ලබා දෙමින් කරන ලද අනුපමේය ශක්තිය හා සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් පළාත් සභා අරමුදල් ආදිය ලබා දෙමින් දක්වන ලද අනුග්‍රහය මෙහිලා විශේෂයෙන් සිහිපත් කර ස්තුති කරනු කැමැත්තෙමි. එමෙන්ම මැතිවරණ ආසන දෙකක් නියෝජනය වන අප සභාව සඳහා හිනිදුම ආසනයේ ප්‍රධාන සංවිධායක හා ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු ගරු මන්ත්‍රී

**සම්පත් අතුකෝරල මැතිතුමාට** හා බද්දේගම ආසන ප්‍රධාන සංවිධායක හා ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු ගරු මන්ත්‍රී **ඉසුරු දොඩංගොඩ මැතිතුමාට** මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි. ප්‍රාදේශීය සභාව තුල අප සියලු දෙනා නියෝජනය කරනුයේ ඒ ඒ කොට්ඨාසයන්හි ජනතාවගේ ජන මතය බව හොඳින් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වන අතර එකී ජනතා අපේක්ෂා යම් ප්‍රමාණයකට හෝ ඉටු කර දීමට කටයුතු කිරීම අපගේ වගකීම බවත් මම හොඳින් අවබෝධ කරගෙන සිටිමි. මැතිවරණ කොට්ඨාස දෙකක් නියෝජනය කරන සභාවක් තුල විවිධ අදහස් උදහස් මෙන්ම සාධාරණ විවේචනද ඇති විය හැකිය. ඇතැම් විට සුළු සුළු අඩුපාඩුකම්ද සිදුවීමට ඉඩ තිබේ. එවෙනි මත ගැටුමක් හෝ ප්‍රතිපත්තිමය කාරණාවලදී ආසන දෙකෙහි ප්‍රධාන සංවිධායකතුමන්ල හා කථිකා කරමින් පවතින ගැටළු අවම කර ගැනීමට හා සංවර්ධනාත්මක ඉදිරි ගමනක් පෙන්නුම් කරමින් අනාගතය පිළිබඳ දැඩි අවධානයෙන් කටයුතු කිරීමේ වැදගත්කම අපට පෙන්වාදෙමින් අපේ ඉදිරි ගමනට විශාල ශක්තියක් සපයන අපේ දිස්ත්‍රික් නායක වැවිලි කර්මාන්ත ගරු අමාත්‍ය **වෛද්‍ය රමේෂ් පතිරණ**, රාජ්‍ය අමාත්‍ය **නීතිඥ මොහාන් පී. ද සිල්වා** යන ගරු අමාත්‍යවරුන් මෙහිලා අගය කරමින් මාගේ ප්‍රණාමය පුදකරමි. එමෙන්ම අපගේ දේශපාලන කටයුතුවල දී හා සභාව තුල සිදු කෙරෙන කටයුතුවලදී නිරන්තර සහයක් ලබා දෙන උප සභාපති **ගාමිණී සුසන්ත මැතිතුමා** ප්‍රමුඛ සියළු පක්ෂ ප්‍රතිපක්ෂ මන්ත්‍රී මණ්ඩලයටත් දකුණු පළාත් සභාවේ හිටපු සියළුම මැති ඇමතිවරුන්ටත්, දකුණු පළාත් පාලන කොමසාරිස්තුමාට හා සහකාර කොමසාරිස්තුමියටත් විශේෂයෙන් පළාත් ආණ්ඩුකාර ලේකම්තුමියටත් මාගේ කෘතඥතාව ප්‍රකාෂ කරන්න කැමැත්තෙමි. ඒ හා සමානව වර්තමානය අප ලෝකයට මෙන්ම රටටද බලපා ඇති කොරෝනා වසංගත තත්වය හමුවේ අප සභා බල ප්‍රදේශයේ රෝග ව්‍යාප්තිය මැඩ පවත්වමින් ඒ හා සම්බන්ධ නිරන්තර අවධියෙන් සිටිමින් කටයුතු කරන උඩුගම වෛද්‍ය අධිකාරතුමා ඇතුලු සමස්ථ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ටත් ස්තුතිය පළ කිරීම මාගේ යුතුකමක් හා වගකීමක් යැයි මම සිතමි.

අවසන් වශයෙන් 2021 වර්ෂය සඳහා අයවැය සකස් කර ඉදිරිපත් කිරීමට ඇප කැප වූ සභා ලේකම්තුමිය ඇතුලු සමස්ථ කාර්ය මණ්ඩලයට මාගේ ආශිර්වාදය හා සුභාශිංසනය පිරිණමමින් මාගේ අයවැය ස්තුතියෙන් නිමා කරමි.

**සභාපති**

**නිමල් වික්ටර් නාගොඩවිතාන**
**නාගොඩ ප්‍රාදේශීය සභාව**

අයවැය සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දැක්වීමට සූදානම් වූ අවස්ථාවේදී ගරු සභාපතිතුමා විසින් අයවැය සම්මත කරලා නෙවෙයිද අදහස් දක්වන්නෙ යනුවෙන් විමසන ලදී.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, දැන් තියෙන්නෙ අයවැය විවාදයක්, අයවැය පිළිබඳව කරුණු දැක්වීමක්. ඔබතුමාලා යෝජනා කරලා, ස්ථිර කළාට පස්සෙ කතා කරලා වැඩක් නැහැ. එතකොට අයවැය වාර්තාවෙ අපි අඩුපාඩු තියෙනවනම්, ඉදිරි වර්ෂයේ දේවල් කතා කරන්න තියෙනවා. දැන් අපි අයවැය සම්මත කරලා ගිහිල්ලා, වෙනත් කරුණු යටතේ අයවැය ගැන කතා කරලා වැඩක් නැහැ. එතකොට අයවැය සම්මතයි. අයවැය සම්මත කරලා, අපි මොනවා කතා කළත් වැඩක් නැහැ.

මෙහිදී ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ප්‍රකාශ කළේ පනතෙ තියෙන්නෙ අයවැය සම්මත කරලා කතා කරන ලෙසයි. ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතාද ප්‍රකාශ කර සිටියේ පනතෙ

තියෙන්නෙ අයවැය  සම්මත කරලා විවාද කරන්න කියලා තමයි.නමුත් පනතේ තියෙන ක්‍රමවේදය නිවැරදි නොවන බවයි.

නැවතත් ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් අදහස් දක්වන්නට යෙදුන අතර, පනත වැරදියි. අයවැය සම්මත කරල විවාද කරන්න කියන්නෙ, සමහර විට යම් කිසි මන්ත්‍රීවරයෙක් කරුණු දැක්වීමේදී විරුද්ධ වෙන්න ඉදලා, පක්ෂ වෙන්න පුලුවන්. පක්ෂ වෙන්න ඉදලා විරුද්ධ වෙන්න පුලුවන්. එහෙමනම් මේ විපක්ෂයක් තිබිලා වැඩක් නැහැ. ඒක පාක්ෂිකව තියනවනම් පුලුවන්. ගමක සාමාන්‍යයෙන් මරණාධාර සමිතියක වුනත් මොකක් හරි සම්මත කර ගන්නවනම් ඒ පිළිබඳව කතා කරනවා. ඒකට කොහොමද ගියේ මේකට කොහොමද ගියේ අපි ඒ ඡේදෙට විරුද්දයි.  මේ ඡේදෙට විරුද්දයි කියලා කතා කරනවා.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

පනතෙ තියෙන්නෙ අයවැය සම්මත කරලා විවාද කරන්න කියලා. නමුත් ප්‍රශ්නෙ තියෙන්නෙ අයවැය සම්මත කරල ඉවර වෙලා, අපි අයවැයේ වැරදි පෙන්නන එකත් වැරදියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

පනත නිර්මාණය කරල තියෙන්නෙ. ඒකාධිකාරී බලයකට. ඒකට අපිට අභියෝග කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

පනතෙ තියෙන්නෙ අයවැය පළවෙනි අවුරුද්ද පරාදනම්, සභාපතිවරයාට ඉදිරියටත් ඒ ආකාරයෙන්ම කටයුතු කරගෙන යන්න පුළුවන්.  දෙවෙනි අවුරුද්දත් අයවැය පරාදනම්, ඉදිරියට කටයුතු කරගෙන යන්න පුලුවන්. තුන්වෙනි අවුරුද්ද පරාදනම්, ඉදිරියට කටයුතු කරගෙන යන්න බැහැ. ඉතිං මේ සභාවෙ එහෙම සිද්දියක් වෙලා නැහැ. පළවෙනි අවුරුද්දත් අයවැය සම්මත වෙලා, දෙවනි අවුරුද්දත් අයවැය සම්මත වෙලා.  පනතෙ තියෙනවා අයවැය ඉදිරිපත් කළාට පස්සෙ අයවැය යෝජනාව සම්මත කිරීමෙන් අනතුරුව විවාදයට ගන්න කියලා කියන එකත් හරි. මගේ අදහසත් මේ මන්ත්‍රීවරුන්ගෙ අදහසත් අයවැයක් විවාද කරන්නෙ නැතුව සම්මත කරල වැඩක් නැහැ. අයවැය සම්මත කරනවනම්, ඒකට විවාද කරලා වැඩක් නැහැ. සද්ද නැතුව වාඩි වෙලා ඉන්න ඕන. අපි අයවැය නිවැරදියි කියලා අත උස්සන්නෙ. ඊට පස්සෙ වැරදියි කියලා කියන්නෙ කොහොමද? එහෙම එකක් තියෙනවා. සභා රීතිවලට පටහැනිව යන එකත් වැරදියි. කැමති විදිහකට කටයුතු කරන්න.

**ගරු සභාපතිතුමා**

සත්‍යනම්, කතා කරලා තමයි සම්මත කර ගන්න ඕන.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

කතා කරල ඕන සම්මත කර ගන්න. සභාපතිතුමා, නිවැරදි තැනදි අපට ඔක්කොම වැරදියි කියලා අත උස්සන්න බැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

කොහොමත් දැන් අයවැය පැරදුනයි කියලා ගැටලුවක් වෙන්නෙ නැත්නම්, සම්මත වෙලා විවාද කළයි කියලා ගැටලුවකුත් නැහැ.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

දැන් සහබන්දු මන්ත්‍රීතුමා විවාද කරන්න ඉදිරිපත් වුනේ ගොඩක් වෙලා බලා ඉදලා. මන්ත්‍රීවරු 15 දෙනෙක් ඉන්න අවස්ථාවෙ අයවැය කියනවත් එක්ක සම්මත කර ගන්න තිබුනා. එහෙම සම්මත කරන්නෙ නැතුව ඉන්න විට තමයි සහබන්දු මන්ත්‍රීතුමා නැගිට්ටෙ. විපක්ෂෙ මන්ත්‍රී කෙනෙක් නැගිටලා අයවැය සම්මත කරන්නෙ නැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

අපි දන්නවා කොහොමත් අයවැය තමුන්නාන්සෙලගෙ. කොහොමත් මන්ත්‍රීවරු 15 දෙනෙක් ඉන්නවා. 15 ටත් වැඩියි 18 දෙනෙක් ඉන්න විට මම හිතුවා අයවැය සම්මත වෙයි කියලා. අයවැය නිකම්ම සම්මත වෙනවා. ඊලගට විපක්‍ෂයක් හැටියට, පෙර ආ ගමන් මාර්ගය දිහා බලලා අයවැයටත් අත උස්සල යනවනම්, පිටතින් මින්ස්සු බලා ඉදල කියාවි. යූ.එන්.පී. කාරයො හත් දෙනයි, ජේ.වී.පී. එකෙන් එක්කෙනයි, තවත් පක්ෂෙකින් තව එක්කෙනයි, අජිත් මන්ත්‍රීතුමාලා සන්ධානගත වෙලා ඉන්නෙ. පඹයො හත්දෙනෙක් යැව්වනම් ඊට හොඳයි කියල කියාවි. අපි එතනට වැටෙන්න සූදානමක් නැහැ. තමුන්නාන්සෙගෙ ගමනට බාදා කරන්න නෙවෙයි මේ. තමුන්නාන්සෙ මෙතෙක් ආපු ගමන් මාර්යත් එක්ක, අපට අපේ ප්‍රතිපක්‍ෂ කණ්ඩායමට මම හිතන්නෙ මේ සංධානගත වෙලා හිටියට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂෙ තුන් දෙනාටත් වෙච්ච දෙයක් අපි දකින්නෙ නැහැ. ඒක නිසා මෙතෙක් ආ ගමන් මාර්ගය දිහා බලන කොට අපි මාසෙකට දවසක් ඇවිල්ලා, මෙතන කතා කරලා, අපි යොජනා කරලා යනවා. නමුත් මම එකක් අහන්නම් මම ගිය සභාවාරෙ යෝජනාවක් දැම්මා. වැලිවිටිය ජල යෝජනා ක්‍රමය මම මේ උදාහරණයක් දෙන්නෙ. අයවැයට තමයි මේකත් සම්බන්ධ ඒ ජල යෝජනා ක්‍රමය ගැන මාස ගණනාවක් මේ සභාවෙ කතා වුනා. මම කිව්වා මේකට තීන්දුවක් ගන්න කියලා. ගරු සභාපතිතුමනි ඒ පිළිබඳව හොයන්න බලන්න ගියාද? තීන්දුවක් ගත්තද? අදාළ පුද්ගලයා නතර කරන් ඉන්න වතුර මාර්ගය තවමත් ඒ විදිහම නේද? පෙරේද රෑ වෙනකොටත් එහෙමයි. පෙරේද හැන්දෑවෙත් මම ප්‍රශ්න කරල තමයි මෙතනට ආවෙ. අපි කියන්නෙ අපි යෝජනාවක් දැම්මා. මම කෙටි උදාහරණයක් ගත්තෙ, දීර්ඝ ඉතිහාසෙකට යන්න අවශ්‍ය නැති නිසා. මුලින්ම තමුන්නාසෙ සඳහන් කලා පැල තවාන් පිළිබඳව, පැල තවානක් දාල තියෙනවද? ඇත්තටම මම දන්නෙ නැහැ.

**ගරු සභාපතිතුමා**

පැල තවාන් ග්‍රාම සේවා වසමකට එකක් වෙන්න තියෙනවා. සභාව හරහා කෙරෙන දෙයක් නෙවෙයි. සභාවෙ මන්ත්‍රීවරුන්ගෙ අනු දැනුම මත ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී,සමෘද්ධි සංවර්ධන නිලධාරී කෘෂි පර්යේශන නිලධාරී ඇතුලු පිරිසක් එකතුවෙලා කරන කටයුත්තක්

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා මන්ත්‍රීවරුන්ගේ අනුදැනුම මත කටයුතු කළා නම්, වනමල් මන්ත්‍රීතුමා, තරංග මන්ත්‍රීතුමා, නන්දන මන්ත්‍රීතුමා දන්නවද? දන්නෙ නැහැ. අපේ අනිත් මන්ත්‍රීවරියො දන්නවද නැහැ. මගේ කොට්ඨාසයට ග්‍රාම සේවක වසම් හතරක් අයිතියි. ඒ ග්‍රාම සේවක වසම් හතරේන් මම පදිංචි ස්ථානයේ ග්‍රාම නිලධාරී පෞද්ගලික හිතවත් නිසා මොනව හරි වුනොත් ගොඩ. මගේ මට්ටම මම කියන්නෙ. අනිත් වසම් තුනේම මොනම සංවර්ධන යෝජනා ක්‍රමයකටවත් වාඩි වෙනකොට අවලංගු කාසි වගේ තමයි විපක්ෂෙ මන්ත්‍රීවරු හැටියට අපි ඉන්නෙ. එතනට ගියපු කෙනෙක් ඇවිල කියනවා. මෙහෙම දෙයක් සිදු වුනා කියලා අපිත් එයාගෙන් අහගන්නවා.

**ගරු උපසභාපති ගාමිණී සුසන්ත මහතා**

සභබන්දු මහත්මයා, ඔබතුමා වෙනත් කරුණු යටතේ සාකච්ඡා කරන්න. ඔබතුමාට උත්තරයක් දේවි අදාල කොට්ඨාසවල මන්ත්‍රීවරු.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සභබන්දු මහතා**

ගරු සභාපතිතුමා කතා කරන්න දෙන්නෙ නැත්නම්, අපි වාඩිවෙලා ඉදල වැඩක් නැහැ. අපි නැගිටල යන්නම්. පැල තවාන් නැත කියන එක සනාථ කරන්න තමයි මම මේ කතා කරන්නෙ. ඒකට ඉඩ දෙන්න.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, අපේ පනතට අනුව තියෙන ක්‍රමය අනුව දැන් සාකච්ඡා කළා. ඒ නිසා 2021 වර්ෂය සඳහා ඔබතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඒ අයවැය යෝජනාව මම සම්මත කරනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සභබන්දු මහතා**

එතකොට මන්ත්‍රීවරයෙක් කතා කරන අතරතුරේ තමුන්නාන්සෙට එහෙම කරන්න බැහැ. සභා නීතියක් තියෙනවා. එහෙම වැඩ කරන්න බැහැ. සභා නීතිය අනුව, යෝජනා සම්මත කරන්න නම් මම වාඩිවෙනකම් ඉන්න ඕන.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසර අරගෙන මම සම්මත කළේ. සභාපතිතුමා මට අවසර දුන්නා. සභාවෙ පනතට අනුව අයවැය සම්මත වෙලා ඉවරවෙලා තමයි විවාදය කරන්න තියෙන්නෙ. ඔබතුමාගේ කතාව නීති විරෝදියි. ඔබතුමා කතා කළේ පනතට අනුව නෙවෙයි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සභබන්දු මහතා**

එහෙම කරන්න බැහැ. එහෙමනම් සභාපතිවරයා මට වාඩිවෙන්න කියන්න ඕන. මේක ගෞරවණීය සභාවක් යෝජනා සම්මත කරන්න අවස්ථාවක් දීල තිබුනෙ. පනත අනුව සභාවට යෝජනාවක් ගෙනාවා. මම අයවැය වාර්තාවෙ හොඳ නරක කිව්වා. අපි සභාවෙන් ඉවත් වෙන්නම්. ගරු මන්ත්‍රීවරුනි අපි සභාවෙන් ඉවත් වෙමු. ඔබතුමාලට ඕන දෙයක් කරගන්න. මේක සභාවක් නෙවෙයි.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා වාඩිවෙන්න. සභාවට අයවැය වාර්තාව ඉදිරිපත් කළාම, ඒක සම්මත කර ගැනීම හෝ නොකිරීම වෙනම කාරණයක්. නමුත් ඒ පනත අනුව ක්‍රියාත්මක වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

සභාපතිතුමා පනත අනුව නම්, සුසන්ත මන්ත්‍රීතුමා මීට කලින් බිලක් දැම්මා. පතිනායක මන්ත්‍රීතුමා බිලක් දැම්මා. ඔය පනත් නැතුව, අපි ගෙවීම් සම්මත කරලා දුන්නා. අයවැයට පනත වැදගත් නැහැ. මම වගකීමෙන් කියනවා ඒ බිල් දැම්මෙ ඒ අවස්ථාවෙ. එහෙනම් ඒවත් පනතට අනුව යන්න ඕන.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, මම නීතිය ක්‍රියාත්මක කළොත්, කාගෙ කාගෙත් අඩුපාඩු තියෙනවා. සද්භාවයෙන් කරන සභාවක් හැටියට අපි නීතියත් ක්‍රියාත්මක කරගෙන, පනතත් අනුව, මනුස්සකමත් එක්ක, යන සභාවක් මේක. ගරු මන්ත්‍රීතුමාල නිශ්ශබ්ද වෙන්න. අපි අර අවස්ථාව දුන්නෙ මොනව හරි ප්‍රශ්නයක් තියෙනවනම් කතා කරන්න. සභාව සම්මත කර ගන්න වෙලාව දුන්නට, ඒ වෙලාවෙ පොඩ්ඩක් කාල

වේලාවක් ඉක්ම ගිය නිසා තමයි ඒ සහබන්දු මන්ත්‍රීතුමා කතා කළේ. මන්ත්‍රීතුමා කතා කරද්දි, අපේ වනිගරත්න මන්ත්‍රීතුමා යෝජනාව සම්මත කළේ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, සභාවක් පාලනය කිරීමේදී ගමේ මරණාධාර සමිතියක වුනත්, ඔබතුමා විදුහල්පතිවරයෙක් හැටියට කවරු හරි රැස්වීම් ශාලාවේ කතා කරන විට, පොඩ්ඩක් ඉන්න කියලා ඒකට පරස්පර එකක් කියනවනම් හරිද? මේ සභාව දිහා පිටතින් බලාගෙන ඉන්න ජනතාව හිතාවි, එක් මන්ත්‍රීවරයෙක් මැදින් පැනලා අයවැය ස්ථිර කළා. අපි නැගිටල යන්න ගියා. එහෙම බැහැ එහෙමනම් අයවැය සම්මත කරන්න සභාපතිවරයා නිදහස දීල තිබුනා. අපි මෙතන විනාඩි 15 ක් විතර බලාගෙන හිටියා. මේක ස්ථිර වෙනවනම් ස්ථිර වෙන්න කියලා නමුත් තමුන්නාසෙලා ඒ කටයුත්ත කලේ නැහැ.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

මම කියන්නෙ මෙහෙමයි, ඔය විදිහට කරගෙන යන්න ගියොත්, මේ සභාව කරගෙන යන්න බැරිවෙනවා. සභාපතිතුමාගෙ දුර්වලතාවය ඕක. අයවැය අවස්ථාවෙ, ඔබතුමා ප්‍රකාශ කරලා, සභාවට ඉදිරිපත් කරලා, සභාව සම්මත කරනවද? නැද්ද? යන්න පිළිබඳව අදහස් විමසලා, ඊට පස්සෙ පක්ෂනම්, පක්ෂයි කියලා, විපක්ෂනම්, විපක්ෂයි කියලා, ඡන්දය විමසීමකට යනවා. ඊට එහා දෙයක් මේකෙ කරන්න බැහැ. සහබන්දු මන්ත්‍රීතුමා, ඔබතුමාගෙ කතාවෙත් සීමාවක් තියා ගන්න. ඔබතුමා හිටපු සභාපතිවරයෙක්. එදා හිටපු සභාපති මේ විදිහට හැසිරුනේ නැහැ. මූලාසනයට ගරු කරන්න. එදා ලස්සනට කරගෙන ගියා. අද මේක වෙනස් කරන්න හදනවා. ඒ නිසා ඔබතුමත් මේක සාධාරණව කරන්න. මේ ගරු මන්ත්‍රී මණ්ඩලයට මම කියනවා. මේ කතාව ඉවර කරගන්න මෙතුමට අවස්ථාවක් දෙන්න. එහෙම නැතුව සහබන්දු මන්ත්‍රීතුමාට හවස් වෙනකම් මේකට ඉඩ දෙන්න බැහැ. විරුද්දනම් විරුද්දයි කියලා යෝජනාවක් ස්ථිර කරන්න. එතකොට ඉවරයි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

අපේ පක්ෂෙ කණ්ඩායම බැහැර වෙමු. එහෙනම් අපි බැහැර වෙන්නම්. අපි කතා කළාට පස්සෙ ස්ථිර කලානම් ඒත් කමක් නැහැ. ඊට කලින් මැදින් පැනලා ස්ථිර කළා. ඊලගම මම කතා කරන්න ඉස්සර වෙලා කිව්වා මේකෙ හරි වැරැද්ද. ඉතිං මේ ග්‍රාමීය පාලම් ගැන තියෙනවා. ඊලගට තමුන්නාන්සෙ කිව්වා මුදල් ලැබීම්. මේව කොයි වෙලාවෙද අපි කතා කරන්නෙ. මම කියන්න හැදුවෙ මුදල් ලැබීම් තියෙනවා. එදා පළාත් සභාවක් තිබුනා එදා පළාත් සභාවක් තිබුන නිසා තමයි පළාත් සභාව හරහා අපට මුදල් ආවෙ. මේ මොහොත වෙන කොට පළාත් සභාව අක්‍රියයි. ඒ නිසා ආණ්ඩුකාරවරයට සල්ලි එනවා. ඊලගට සභාපතිතුමා කිව්වා. මේ ආණ්ඩුව ආවට පස්සෙ මේ විදිහට සල්ලි එන්නෙ කියලා.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

සබාපතිතුමා යොජනා කරනවා නමුත් සම්මත කරන්නෙ නැහැ. එහෙනම් සභාපතිතුමා අහන්න ඕන තවත් යෝජනා තියෙනවද කියන කාරණාව. තවත් යෝජනා ගේන්න පුලුවන්. එතකොට සහබන්දු මන්ත්‍රීතුමාට පුලුවන් ඒකට යෝනාවක් ගේන්න. ඊට පස්සෙ පුලුවන් ඡන්ද විමසීමකට යන්න. ඔබතුමා මූලාසනය හොබවන්නෙ, ඔබතුමා සභාව මෙහෙයවන්න.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ඔබතුමාට තියෙන හදිසිය අපට නැහැ. ඒ නිසා මගේ කතාවට අවසර අරගෙන කතා කරන්නෙ. තමුන්නාන්සෙගෙ අයවැය ප්‍රකාශයේ තිබුන දේවල් තව වරු ගානක් ගිහිල්ල කතා කරල හරියන්නෙ නැහැ. ඊලගට තමුන්නාන්සෙට අමතකද? එවකට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වජිර අබේවර්ධන අමාත්‍යවරයා පළාත් පාලන ඇමතිකම් කළා. එතකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලංකාවෙ සියලුම පළාත් පාලන ආයතනවලට මුදල් ලබා දුන්නා. ඊලගට තමුන්නාන්සෙලා ගිහිල්ලා ඊයෙ පෙරේද ඔය පාලම් විවෘත්ත කළාට, අපේ කොට්ඨාසෙ ග්‍රාමීය පාලම් 08 ක් තියෙනවා. ඉතිං ඒව කෙලින්ම පළාත් පාලන අමාත්‍යවරයා අපට ලබා දීපුවා. මුලු ලංකාවටම ලබා දුන්නා. විශේෂයෙන්ම නාගොඩ ප්‍රාදේශීය සභාවට. ඊලගට ආදාහනාගාරය කවුද දුන්නෙ? ඇත්තටම ආදාහනාගාරෙ කවුරු කළත්, දීල තියෙන්නෙ අපේ ගයන්ත කරුණාතිලක අමාත්‍යවරයා.

වනිගරත්න මන්ත්‍රීතුමාගෙ යෝජනා ස්ථිරත්වය මම ප්‍රතික්ෂේප කරනවා. අපි ඇත්තටම සභාපතිතුමාට සහයෝගය දෙන්න හිටියෙ. තමුන්නාන්සෙට ඒ සහයෝගය මෙන්න මේ වගේ මන්ත්‍රීවරු නිසා දෙන්න බැහැ. නැත්නම් මේ අවුරුද්දෙ තමුන්නාන්සෙට සහයෝගය දීලා බලන්න හිටියෙ. ඒක නිසා අපි මේ අවස්ථාවෙදි ඉදිරිපත් කරනලද අයවැය යෝජනාව ප්‍රතික්ෂේප කරනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කතාවත් මම ප්‍රතික්ෂේප කරනවා. අපේ ආදාහනාගාරය පිළිබඳවත්, ඇමතිවරු පිළිබඳවත්, මම පසුගිය අයවැය යෝජනාවෙ, මගේ අයවැය පනිවිඩයෙදි, සඳහන් කළා. මෙවර අයවැයට ඒක අදාල නැහැ. මෙවර අයවැයේදි මොහාන් ඇමතිතුමා පිළිබඳ සඳහන් කළේ අපේ මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන ලබා දීමෙන් කටයුතු කරපු නිසා. අපේ දිස්ත්‍රික් නායකයන් පිළිබඳව මගේ අයවැය පනිවිඩයෙදි ප්‍රකාශ කිරීම මගේ යුතුකමක්. අපේ වනිගරත්න මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කළා. ඊට වෙනස් යෝජනාවක් තියෙනවනම්, කතා කරන්න. නැත්නම් යෝජනාව සම්මත වූ සේ සලකා කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙ අයවැය අනුව ඔබතුමාගෙ ප්‍රකාශයක් තියෙනවා. ග්‍රාම සේවා වසම් 53 ටම නිවාස ලබා දෙනවයි කියලා. මම අහනවා ඊයෙ අපේ පැත්තෙ කුඹුරුහේන නොම්මර 20 ගෙයක් අඩිතාලම් දැම්මා. ඔබතුමාගෙ ප්‍රකාශයේ තියෙනවා සියලුම මන්ත්‍රීවරු සහභාගි කරගන්නවයි කියලා. මම අහන්නෙ ඇයි ඒ ගැන අපට නිකන්වත් මතක් කරන්නෙ නැත්තෙ. අපි අහන්නෙ අපි සියලුම දෙනා මන්ත්‍රීවරු, ඒ නිසා අපි සියලු දෙනා සහභාගි කරගන්න කියලා මම ඉල්ලා සිටිනවා. එම නිසා මම මේ අයවැයට විරුද්දයි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමාලගෙන් අවසරයි. මේ වෙලාවෙ චන්ද්‍ර සහබන්දු අපේ විපක්ෂ නායකතුමා 2021 අවුරුද්දට ඉදිරිපත් කරන ලද අයවැය ප්‍රතික්ෂේප කරලා, විරුද්ධව යෝජනාවක් ගෙනාවා. ඒක මම අනුමත කරනවා. ඒ වගේම සභාපතිතුමනි, ඔබතුමා දැන් මේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ 2018 මාර්තු 28 සිට කටයුතු කරගෙන යනවා. ඔබතුමාගේ පාලන කාලය අවුරුදු තුනක්. අපි දකින විදිහට, ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ නාගොඩ කොට්ඨාසයේ සංවර්ධනය කරන ආකාරය පිළිබඳව ඔබතුමා විවිධ සිහින මැව්වා. නමුත් අපි සෑහීමකට පත්වෙන්නෙ නැහැ. ඔබතුමා මේ අවුරුදු තුනකට ආසන්න කාලයක් තුල අපේ කොට්ඨාසයට මොනවද ප්‍රාදේශීය සභාව හරහා කරලා තියෙන්නෙ. හොඳටම ඕන්නම් ලයිට් කනු ටිකට වීථි ලාම්පු ටිකක් දාල ඇති. ඔබතුමාලගෙ බලය තියෙන ආණ්ඩුවක් තියෙන්නෙ. නමුත් මේ සභාවක් හැටියට අපේ ප්‍රදේශයේ ජනතාවට නාගොඩ ප්‍රාදේශීය සභාවෙන් වෙච්ච සෙතක් නැහැ. සෙතක් වුනානම්, කට්ටිය තම තමන්ගෙ පෞද්ගලික දේශපාලන ව්‍යාපෘති තමයි ක්‍රියාත්මක කළේ.

ඒක තමයි මට කියන්න තියෙන්නෙ. මම චන්ද්‍ර සහබන්දු මැතිතුමන් ගෙනාපු යෝජනාව නැවත වාරයක් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා -**

නාගොඩට මොනවද නොකළේ? පාරවල් කාපට් කරන්න ගමට ලක්ෂ 20 ක සංවර්ධනය ආවා.

ගරු මන්ත්‍රීවරුනි අද දින අයවැය ඉදිරිපත් කිරීමෙදි යෝජනා දෙකක් තියෙනවා. අයවැය සම්මත කිරීමට විරුද්ධව ප්‍රතික්ෂේප කිරීමක් තියෙනවා. අයවැය යෝජනාවට පක්ෂව සහ විපක්ෂව යෝජනා දෙකක් තියෙනවා. පක්ෂව යෝජනාව ගරු මන්ත්‍රී වනිගරත්න මහතා ස්ථිර කළා. ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විපක්ෂව ඉදිරිපත් කළ යෝජනාව. ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ස්ථිර කළා. එබැවින් ඒ අනුව බෙදීමක් අවශ්‍ය වෙනවා. ඡන්ද විමසීමකට යන්න සිදු වෙනවා. ඒ නිසා ඡන්දය විමසීම සඳහා ලේකම්තුමයට භාර දෙනවා.

**සභා ලේකම්තුමිය**

2021 වර්ෂයේ අයවැය සම්මත කිරීම සඳහා පක්ෂව හා විපක්ෂව යෝජනා දෙකක් ඉදිරිපත් වී ඇති බැවින්, ඡන්ද විමසීමකට යන්න අදහස් කරනවා. මුලින්ම පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන මන්ත්‍රීවරුන්ට අත ඔසවා ඡන්දය ප්‍රකාශ කරන හැටියට ඉල්ලා සිටිනවා.

**<u>පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ ගරු මහජන නියෝජිතයන්</u>**

1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා
2. ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා
3. ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහතා
4. ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
5. ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා
6. ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මහත්මිය
7. ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
8. ගරු මන්ත්‍රී නාපෙ වාතානගේ සමන් මහතා
9. ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා
10. ගරු මන්ත්රිනී ප්රියන්තා ගුණසේකර මහත්මිය
11. ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
12. ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා
13. ගරු මන්ත්‍රී එන්. ඩබ්. පතිනායක මහතා
14. ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා
15. ගරු මන්ත්රී බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා
16. ගරු මන්ත්‍රී අජිත් එඩෙර ආරච්චි මහතා
17. ගරු මන්ත්‍රිනී ඩබ්. කේ. නෙලී මහත්මිය

**<u>විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ ගරු මහජන නායෝජිතයන්</u>**

1. ගරු මන්ත්‍රී කුමාරගේ වසන්ත මහතා
2. ගරු මන්ත්‍රී ඩබ්. ජී. නිශාන්ත මහතා

3. ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා
4. ගරු මන්ත්‍රී චන්ද්‍ර වීරගණරත්න මහතා
5. ගරු මන්ත්‍රිනී කේ. කේ. අයි නෙරංජලී මහත්මිය
6. ගරු මන්ත්‍රිනී කේ. ඒ. සී දිල්රුක්ෂි මහත්මිය
7. ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය
8. ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
9. ගරු මන්ත්‍රිනී කේ. එච්. එම්. නදීකා මහත්මිය

**<u>සභාවට පැමිණ නොසිටි ගරු මහජන නියෝජිතයන්</u>**

1. ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා

**සභා ලේකම්තුමිය -**

නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවට පක්ෂව ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව 17 යි. විපක්ෂව ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව 09 යි. ගරු සභාපතිතුමාගේ ඡන්දයත් සමග ඡන්ද සංඛ්‍යාව 26 යි. නොපැමිණි ඡන්ද සංඛ්‍යාව 01 යි. ඒ අනුව පක්ෂව ඡන්ද 17 ක් ලබාගෙන නාගොඩ ප්‍රාදේශීය සභාව 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාව වැඩි ඡන්ද 08 කින් සභා සම්මත වෙනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද නාගොඩ ප්‍රාදේශීය සභාවේ අයවැය වාර්තාව වැඩි ඡන්ද 08 කින් සභා සම්මත වුනා. පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරුන්ටත්, මම ස්තූති කරනවා. මම ඡන්දයක් පැවැත්වීමට බලාපොරොත්තු වුනේ නැහැ. නමුත් ඒක අපේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය. සියලුම මන්ත්‍රීවරුන්ට තමන්ගෙ ප්‍රකාශ අයිතිය හඳවතට විරුද්ද වුනත්, හඳවතට එකග වුනත්, ඒ කටයුත්ත කළා. මම හිතන්නෙ නැහැ අයවැයට විරුද්ධ වුන අයත් හඳවතට එකගව විරුද්ධ වුනා කියලා. ගරු මන්ත්‍රීවරු අපට යම් මුලා ප්‍රතිපාදන ලැබිල තියෙනවා. ඒ නිසා මම ඉදිරි වර්ෂයේ සියලු දෙනාට එක හා සමානව වැඩ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම අපේ සහබන්දු මන්ත්‍රීතුමා අපේ ආදාහනාගාරය පිළිබඳවත්, ඒ මූලා ප්‍රතිපාදන පිළිබඳවත් සඳහන් කළා. අමාත්‍යවරු උදවු උපකාර කළා. ඒක අමතක කරන්නෙ නැහැ. ඒ ආණ්ඩුකාලෙදි අපට ඒ කටයුතු කළා. ඒක වෙනම දෙයක්. නමුත් 2021 වර්ෂයේ අපි බලාපොරෝතුවෙන කර්තව්‍යයන් කරන්න ඔබ සියලු දෙනාගේ සහය ලැබෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා ඉදිරිපත් කරන යෝජනා**

**උඩුගම අළුත්වත්ත කොට්ඨාසය - සංවර්ධන කටයුතු**

1. අළුත්වත්ත කැකිරිහේන්දොල අතුරු මාර්ගය බැකෝ යන්ත්‍රය යොදා ගමනාගමනයට සුදුසු පරිදි සකස් කිරීම
2. උඩුගම නැගෙනහිර ජනසවිය ගම්මානයේ සිට ගුලනකන්ද මාර්ගය බැකෝ යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම
3. උඩුගම නැගෙනහිර ඇටකෙහෙල්කන්ද මාර්ගය බණ්ඩිය දොළ අසළ බංගම පාර දක්වා සම්බන්ධ කිරීම
4. උඩුගම නැගෙනහිර පැගිරිහේන මාර්ගයේ කොන්ක්‍රීට් නොකල කොටස් පස් දමා ගොඩ කර සකස් කිරීම
5. උඩුගම දකුණ දික්මාදුගොඩ මාවතේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම
6. උඩුගම මධ්‍යම ක්‍රීඩාංගණය අසළ සිට දොඩංගොඩ මාවතට වැටෙන මාර්ගය ( අතුරු මාර්ගය) සංවර්ධනය කිරීම
7. උඩුගම නැගෙනහිර ජනසවිය ගම්මානයේ මාර්ගය සඳහා අත්‍යාවශ්‍ය සිළිංඩර් ලබා දීම
8. උඩුගම දකුණ පොදු නාන ළිඳ ( අතහැර දමා ඇති) සංවර්ධනය කර භාවිතයට සුදුසු ලෙස සකස් කිරීම
9. උඩුගම අළුත්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම
10. උඩුගම මධ්‍යම මිනිරන්වලකන්ද මාර්ගයට සිළිංඩර් 04 ක් ලබා දීම
11. උඩුගම නැගෙනහිර ගුණානන්ද මාවත සහා අඩි 2 විශ්කම්භය සහිත අඩි 04 ක සිළිංඩරයක් ලබා දීම
12. උඩුගම නැගෙනහිර බෝල වංගුව අසළින් ඇති අතුරු මාර්ගයට සිළිංඩරයක් ලබා දීම
13. උඩුගම නැගෙනහිර ජනසවිය ගම්මානය මාර්ගයට සිළිංඩර් 02 ක් ලබා දීම

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**අළුත්වත්ත කොට්ඨාසය - සංවර්ධන කටයුතු**

01. දික්මාදුගොඩ මාවත ( උඩුගම දකුණ) දික්මාදුගොඩ මහතාගේ නිවස අසළ මාර්ගයට අඩි 2 X8 සිළිංඩර් 02 ක් යෙදීම
02. එම මාර්ගයේම පළමු අතුරු මාර්ගයේ පද්මිණී මහත්මියගේ නිවස අසළ බෝක්කුව සඳහා අඩි 2 X8 සිළිංඩර් 02 ක් යෙදීම
03. එම මාර්ගයේම දෙවනි අතුරු මාර්ගයේ ආරම්භක ස්ථානයට අඩි 2 X8 සිළිංඩර් 01 ක් යෙදීම
04. උඩුගම මධ්‍යම, උඩුගම දකුණ ක්‍රීඩාංගණය අසළ සිට අමරසිරි දොඩංගොඩ මාවත දක්වා දිවෙන අතුරු මාර්ගය කොරි පස් යොදා සකස් කිරීම
05. උඩුගම මධ්‍යම 28 ගම්මානයේ සිට අලුත්වත්ත දක්වා බැකෝ යන්ත්‍රයක් යොදා සකස් කිරීම
06. උඩුගම අළුත්වත්ත අක්කර 05 මාර්ගය අක්කර 5 බේකරිය දක්වා බැකෝ යන්ත්‍රය යොදා සකස් කිරීම

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. දික්මාදුගොඩමාවත ( උඩුගම දකුණ) දික්මාදුගොඩ මහතාගේ නිවස අසළ මාර්ගයට අඩි 2x8 සිළිංඩර් 02 ක් යෙදීම - රු. 20850.00
02. දික්මාදුගොඩ මාවත පළමු අතුරු මාර්ගයේ පද්මිණී මහත්මියගේ නිවස අසළ බෝක්කුව සඳහා අඩි 2 x8 සිළිංඩර් 02 ක් යෙදීම - රු. 20850.00
03. දික්මාදුගොඩ මාවත දෙවන අතුරු මාර්ගයේ ආරම්භක ස්ථානය අඩි 2x8 සිළිංඩර් 1 ක් යෙදීම - රු. 10425.00
04. උඩුගම නැගෙනහිර අක්කර 80 ජනසවිය ගම්මානයේ අතුරු මාර්ග සඳහා සිළිංඩර් යෙදීම - රු. 92750.00
05. මලාමුර වදගොඩහේන මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම - රු. 42625.00
06. ඌරල කොතේගොඩකන්ද මාර්ගයේ දයානන්ද මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම - රු. 50000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. කොතලාවල, නො.50 බොරළුකන්ද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා ප්‍රතිසංස්කරණය කිරීම - රු. 22500.00
08. කිඹුල්කොටුකන්ද මාර්ගය සඳහා කොරි පස් දමා සංවර්ධනය කිරීම - රු. 3650.00
09. වරගහකන්ද මාර්ගය සඳහා කොරි පස් දමා සංවර්ධනය කිරීම - රු. 15500.00
10. නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය පින්තාරු කිරීම - රු.400000.00
11. උඩුගම සති පොළේ නව කඩ කාමර ඉදිකිරීම පළමු අදියර -රු.1100000.00
12. උඩුගම සති පොළේ නව කඩ කාමර ඉදි කිරීම -රු.2300000.00
13. ඌරල පහළ අක්කර 25 222 සී ග්‍රාම නිලධාරී වසමට අයත් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම (පළාත් නිශ්චිත- 2020) -රු.1000000.00
14. ගම්මැද්දේගොඩ දකුණ බන්දුල විජේසේකර මාවත කොන්ක්‍රීට් කිරීම (දකුණු පළාත් සංවර්ධන සැලැස්ම -2020) - රු. 500000.00
15. මාපලගම රණවිරුගම සුහසාධක සමිති ශාලා භූමියේ පැති බැම්ම ඉදිකිරීම (දකුණු පළාත් සංවර්ධන සැලැස්ම -2020) - රු. 500000.00
16. උඩුගම අලුත්වත්ත අක්කර 5 මාර්ගය අක්කර 5 බේකරිය දක්වා බැකෝ යන්ත්‍රයක් යොදා සකස් කිරීම -රු. 40500.00
17. උඩුගම මධ්‍යම 28 ගම්මානයේ සිට අලුත්වත්ත දක්වා බැකෝ යන්ත්‍රයක් යොදා සකස් කිරීම - රු. 25000.00
18. පියතිලක මාවත සිට දාවුල්හේන දක්වා මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 40637.50

ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

01. <u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය පුස්තකාල,ආයුර්වේද මධ්‍යස්ථානයේ මේස සදහා රෙදි සැපයීමට ලැබී අති මිල ගනන්</u>

| විස්තරය | ලක්මාලි ටේලර්ස් මාපලගම | අරුණ ටේලර්ස් තල්ගස්වල | ලක්මාල් ටේලර්ස් පෝද්දිවල | නිව් ලියනගේ ටේලර්ස් - නාගොඩ |
|---|---|---|---|---|
| රෙදි යොදා වාටි මසා නිමකර දීමට මේස 56 ක් සදහා | 51040.00 - ටුවිල් රෙද්ද | 48080.00 ටුවිල් රෙද්ද | 43480.00 ටුවිල් රෙද්ද | 52900.00 ටුවිල් රෙද්ද |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය පුස්තකාල,ආයුර්වේද මධ්‍යස්ථානයේ මේස සඳහා රෙදි සැපයීමට ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල ලක්මාල් ටේලර්ස්, පෝද්දිවල විසින් ප්‍රධාන කාර්යාලය පුස්තකාල,ආයුර්වේද මධ්‍යස්ථානයේ මේස සඳහා රෙදි ගැනීමට සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ලක්මාල් ටේලර්ස්, පෝද්දිවල වෙතින් ප්‍රධාන කාර්යාලය පුස්තකාල,ආයුර්වේද මධ්‍යස්ථානයේ මේස සඳහා රෙදි ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

02. <u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහනවල ටයර් ඩැග් ගැසීම සදහා ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය ටයර් වර්ගය | නිව් කාන්ති ටයර් සර්විස් - නාගොඩ | නිව් විජය මෝටර්ස් ගාල්ල | විජේතුංග ගෘප් කම්පැණි පුයිවට් ලිමිටඩ්- ගාල්ල | විජේතුංග ගෘප් කම්පැණි පුයිවට් ලිමිටඩ්- ගාල්ල |
|---|---|---|---|---|
| 205R16C 110/1080 | 5100/= | 10300/= | Hybrid – 6535/= | Hybrid – 6535/= |
| 265-70-16 | | | | |
| 650x16 | 4700/= | 5700/= | Arpidag – 5522/= | Windag – 5155/= |
| 124-28 | | 14500/= | Arpidag – 11390/= | Arpidag – 11390/= |
| 600-16 | 4400/= | 5100/= | Arpidag – 4983/= | Windag – 4750/= |
| 750-16 | 5400/= | 6600/= | Arpidag – 6363/= | Windag – 5935/= |
| 825-20 | 7300/= | 8600/= | Arpidag – 8288/= | Windag – 7870/= |
| 900-20 | 9300/= | 9100/= | Arpidag – 8756/= | Windag – 8556/= |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහනවල ටයර් ඩැග් ගැසීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව **205R16C 110/1080,650x16, 600-16,750-16,825-20** යන ටයර් වර්ගයන්හි හොඳම මිළ ගණන් ඉදිරිපත් කල නිව් කාන්ති ටයර් සර්විස් - නාගොඩ වෙතින්ද, **124-28, 900-20** යන ටයර් වර්ගයන්හි හොඳම මිළ ගණන් ඉදිරිපත් කල විජේතුංග ගෲප් කම්පැණි පුයිවට් ලිමිටඩ්- ගාල්ල විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහනවල ටයර් ඩැග් ගැසීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව **205R16C 110/1080,650x16, 600-16,750-16,825-20** යන ටයර් වර්ගයන්හි ඩැග් ගැසීම නිව් කාන්ති ටයර් සර්විස් - නාගොඩ වෙතින්ද, **124-28,900-20** යන ටයර් වර්ගයන්හි ඩැග් ගැසීම විජේතුංග ගෲප් කම්පැණි පුයිවට් ලිමිටඩ්- ගාල්ල වෙතින්ද නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහනවල ටයර් ඩැග් ගැසීම සුදුසු බව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

03. <u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ දැව කඳන් ඉරීම සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| <u>විස්තරය</u> | <u>ධම්මික ලී මෝල - උඩලමත්ත</u> | <u>ජයවික්‍රම ලී මොල - වලකුඹුර</u> | <u>රවි ලී මොල - උඩලමත්ත</u> |
|---|---|---|---|
| දැව කඳන් ඉරීමට කියුබික් අඩියක් සඳහා | 170/= | 200/= | 200/= |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ දැව කඳන් ඉරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල ධම්මික ලී මෝල -උඩලමත්ත විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ දැව කඳන් ඉරීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ධම්මික ලී මෝල -උඩලමත්ත වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ දැව කඳන් ඉරීම සඳහා සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

04. <u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙරපාසල් දරුවන් සඳහා සහතික පත් මුද්‍රණය ට ලැබී ඇති මිල ගනන්</u>

| <u>විස්තරය</u> | <u>පන්සිළු ක්‍රියේෂන්ස් ගාල්ල</u> | <u>ජයන්ත ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් ගාල්ල</u> | <u>මවුන්ට් ප්‍රින්ටර්ස් ගාල්ල</u> |
|---|---|---|---|
| වර්ණ 04 ඒ 4 ප්‍රමාණයේ සහතිකපත් 1000 මුද්‍රණය ආර්ට් බෝඩ් | 13500/= | 13000/= | 14000/= |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙරපාසල් දරුවන් සඳහා සහතික පත් මුද්‍රණය සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල ජයන්ත ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, ගාල්ල විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙරපාසල් දරුවන් සඳහා සහතික පත් මුද්‍රණය සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ජයන්ත ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, ගාල්ල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙරපාසල් දරුවන් සඳහා සහතික පත් මුද්‍රණය සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත්

**මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.**

**05. ප්රාදේශීය සභාව සඳහා අවශය කොන්ක්‍රීට් භාණ්ඩවලට මිළ ගණන් ඉදිරිපත් වී තිබූ අතර, එම භාණ්ඩ රජයේ අනුබද්ධිත ආයතනයක් වූ සී/ස බද්දේගම ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතියෙන් මිළදී ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව සී/ස බද්දේගම ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාව සඳහා අවශය කොන්ක්‍රීට් භාණ්ඩ මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි විජිත් සහබන්දු විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

2020.11.27 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2020 නොවැම්බර් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව දෙසැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 නොවැම්බර් මාසයට අදාළ මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය දෙසැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, වෙනත් කරුණු යටතේ මම මුලින්ම අදහස් දක්වන්න අදහස් කළා. මොකද මීට පෙර මා ගෙන එන යෝජනාව ගෙනාපු අවස්ථාවෙ, අපේ සහබන්දු මන්ත්‍රීතුමා ඒ පිළිබදව ඉදිරිපත් කරපු කාරණාවලදි, විශේෂයෙන් මට අදහස් දක්වන්න අවස්ථාව හමු වුනේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳව අදහස් දක්වන්නත්, ඒ වගේම විශේෂයෙන් 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය වාර්තාව පිළිබඳව, පසුව කතා වුන පරිදි මගේ යෝජනා ටික ආවයින් පස්සෙ යම් මතයකට ආවා. මම හිතන්නෙ අපි කතා බහ කරගෙන මේ යෝජනා සම්මත කරයි කියන මතය. අපේ සහබන්දු මන්ත්‍රීතුමා, අපේ හිටපු සභාපතිතුමා විශේෂයෙන් එතුමා කිව්වා. මෙවර අයවැය එතුමන්ලා සාකච්ඡා කරගෙන ඒකමතිකව සම්මත කරන්නයි හිටියෙ කියලා. පැහැදිලිවම ඒ පිළිබඳව අපට තේරෙන්නෙ නම්, මේ සභාව තුල සාම්ප්‍රදායික විපක්‍ෂයක් හැටියට මෙතෙක් ඒ ආදර්ශය ඔබේ පක්‍ෂය දීල නැහැ. ඒ නිසා අපේ අයවැයට ඔබතුමන්ලගෙ අනුමැතිය ඒකමතිකව ලබා ගැනීම කියන එක අපි දකින්නෙ ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වගේ. ඒ නිසා ඒ පිළිබඳව විශේෂයෙන් සිහිපත් කරමින්, ඒ එක්කම සහබන්දු මන්ත්‍රීතුමා අදහස් දක්වන වෙලාවෙ මගේ තනතුර පිළිබඳව සඳහන් කරලා පුංචි සඳහනක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳව සඳහන් කරන්න ඕන. තනතුර සහ ඒ පිළිබඳව සඳහන් කිරීමේදී මම පුංචි අපහසුතාවයකට පත්වුනා. මොකද එතනදි වැරදි කාරණයක්. අපි මේ සභාවේ ඒ පනතට අනුව තියෙන ඒ ප්‍රතිපාදන තුල කතා කරන්න හැකියාව තියෙනවයි කියන කරුණ මත. එතකොට වෙනත් ආයතනයක් සමඟ ඒ ආදේශනය කර ගැනීම වැරදියි කියන මතය මගේ තියෙනවා. මොකද ඒකට හේතුව වෙනත් සභාවක් වුනත් ඒ පාලනය කිරීමේ බලතල සභාපතිතුමාට තමයි සම්පූර්ණයෙන්ම

තියෙන්නෙ. මේ සභාවෙත් යම් කිසි ගැටලුවක් මතු වුනානම්, ඒකෙදි මම හිතන්නෙ සභාපතිතුමාට තමයි සියලු බලතල තියෙන්නෙ. ඒ නිසා මම විශේෂයෙන් මේ වෙලාවෙ නැවත සිහිපත් කරනවා. වැරදි අවබෝධයක් ගන්න එපා. ඔබතුමා ඒ කටයුත්ත කරගෙන යන අතරතුරේ සභාවේ තිබුන පනතට අනුව මම එතුමන්ගෙන් අවසර අරගෙන ඉවර වෙලා තමයි කතා බහ කළේ. ඒක මම විශේෂයෙන් මේ වෙලාවෙ සඳහන් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ත්‍රීවිල් රථ ගාලක් පිළිබඳව මම ගිය සභාවාරයේත් සඳහන් කළා. අපේ අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමත් සඳහන් කළා ඒ පිළිබඳව. මොකද මම හැමදාම උදේට එතනින් ඉස්කෝලෙ යන කොට මොකක්ද මේ සම්බන්ධව ගත්ත තීන්දුව තීරණය කියලා මගෙන් විමසනවා. මම හිතන්නෙ ගිය සභාවෙත් මම දැනුම් දීමක් කළා. ඒ සඳහා ඒ අදාල සංගමයකින් ඉල්ලීමක් කරලා තියෙනවනම්, අපි ගනිපු තීන්දුව පිළිබඳව එතුමන්ලා දැනුවත් වෙන්න ඕන. ඒ පිළිබඳව දැනුවත් කිරීමක් කරන්න කියලා. මේ වෙනතුරුත් ඒ දැනුවත් කිරීම කෙරිලා නැහැ. ඒ පිළිබඳව දැනුවත් කිරීමේ අපහසුතාවයක් තියේද? බලතල අනුව කරන්න අවශ්‍ය නැද්ද? කරන්නෙ නැද්ද? එහෙම පොඩි දැනගැනීමක් කරගන්න අවශ්‍යයි. ඒ වගේම නැවත වරක් සභාපතිතුමාට සිහිපත් කරනවා. මම යෝජනා කීපයක් ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කරපු යෝජනා තුල ප්‍රමුඛත්වය දිය යුතු මාර්ග කීපයක් තියෙනවා. ඒ නිසා ඒ මාර්ග කීපය සකස් කර ගැනීම සඳහා ඔබතුමාගේ කාරුණික අවදානය යොමු කරලා අවස්ථාව සලසා දෙන්න කියන කාරුණික ඉල්ලීම මේ වෙලාවෙ සිදු කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, අද දවසේ විශේෂයෙන්ම මම ඔබතුමන්ට ලිඛිතවත් දැනුම් දුන්නා. අද දවසෙ මගේ විද්‍යාලයේ විශේෂ නිලධාරි කණ්ඩායමක් ඇවිල්ලා පරීක්ෂණයක් පැවැත්වෙනවා. ඒ නිසා මම ආයතන ප්‍රධානියා හැටියට අවසානයේ අපි සියලු ගුරු මණ්ඩලය සහ විදුහල්පතිතුමා ප්‍රධානව රැස්වීමක් පැවැත්වීමට අවශ්‍යයි. ඒ රැස්වීමට සහභාගි වීමේ අවශ්‍යතාවය තියෙනවා. ඒ නිසා වේලාසනින් සභා ගැබෙන් නික්ම යන්න මම අවසර පතමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා ගිය වාරයේදීත් ප්‍රකාශ කල ත්‍රීවිල් සංගමයට ලියුමක් යවන්න කියලා මම කිව්වා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා.**

ගරු සභාපතිතුමා අවසරයි. මුලින්ම සමාව ඉල්ලනවා. අද අයවැය කියන එක සම්බන්ධව මම දැනුවත් වුනේ නැහැ. යම්කිසි අතපසුවීමක් සිදු වෙලා තිබුනා. ඒ සම්බන්ධව කිසි ගැටලුවක් නැහැ. මට පුංචි ඉල්ලීමක් කරන්න තියෙනවා. මගේ ඡන්දය අයවැයට පක්ෂව ලබාදුන් හැටියටත්, අද අයවැය කියලාවත් මම දැනුවත් වීමක් වුනේ නැහැ. මේ සභාවෙන් දැනුවත් කිරීම කරල තිබුනෙ නැහැ. යම් කිසි අතපසු වීමක් සභාවට අතපසු වීමක් වෙලා තිබුනා. වාර්තාව ලැබුනෙ නැහැ. හරි එහෙම බැරිනම් මම මගේ අදහස සඳහන් කළේ. එහෙම හැකියාවක් නැත්නම් කමක් නැහැ. කිසි ගැටලුවක් නැහැ. නමුත් ඒ සඳහන් කිරීම කරන්න ඕන නිසා මගේ අතපසු වීම සඳහන් කිරීම කරන්න ඕන නිසා දෙපැත්තෙන්ම සිදු වුන වැරැද්ද සඳහන් කරන්න ඕන නිසා සඳහන් කළේ. ඒ සම්බන්ධයෙන් කිසි ගැටලුවක් නැහැ.

**ගරු සභාපතිතුමා**

කලින් අපේ අතපසුවීමක් වුනා. මොකද වාර්තාවෙ න්‍යාය පත්‍රයේ අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම කියලා සඳහන් වෙලා තිබුනෙ නැහැ. ඊට පස්සෙ වෙනස් කරලා යැව්වා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීවරු මූලාසනයට අවදානය යොමු කරන්න. අද වෙනත් කරුණු යටතේ කතා කරන්න තව ඉඩ ප්‍රස්ථාව තියෙනවා. මටත් විශේෂිත ගමනක් යන්න තියෙනවා. කැඳවීමක් කරලා තියෙනවා. ඒක නිසා මම අපේ නව මන්ත්‍රීතුමිය වන කේ.එච්.එම්. නදීකා දර්ශනී මන්ත්‍රීතුමිය අපි සභාව වෙනුවෙන් ඉතාම ගෞරවයෙන් පිළිගන්නවා. මම එතුමියට ගෞරවයෙන් ආරාධනා කරනවා. මන්ත්‍රීතුමියගේ මංගල කතාව සිදු කරන්න කියලා. අපේ ගම්මැද්දෙගොඩ ප්‍රදේශයේ අපේ සුභාෂි මන්ත්‍රීතුමියටත් දැන් පාලුවක් නැහැ. බොහොම තරුණ මන්ත්‍රීවරු දෙපොලක් ඒ නිසා අපි ගෞරවයෙන් පිළිගන්න ගමන් මම ඉතාම ගෞරවයෙන් ආරාධනා කරනවා. මන්ත්‍රීතුමියට තමන්ගෙ අදහස් මේ අවස්ථාවෙ ප්‍රකාශ කළොත් හොඳයි කියලා.

**ගරු මන්ත්‍රිනී කේ.එච්.එම්. නදීකා දර්ශනී මහත්මිය**

ගරු සභාපතිතුමා ලේකම්තුමිය ඇතුලු සියලු මන්ත්‍රී මඩුල්ලෙන් අවසරයි. අද තමයි මම පළමුවෙන්ම සභා රැස්වීමට සහභාගි වන්නෙ. ඇත්තටම මටත් හිතාගන්න බැහැ. මම මේ අවස්ථාවෙදී සභාපතිතුමාටත් ලේකම්තුමියටත් ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම හිටපු මන්ත්‍රීතුමියත් මේ අවස්ථාවෙදි මතක් කරන්නම ඕන. එතුමියටත් විශේෂ ස්තූතිය පුද කරනවා. ඒ වගේම මේ සභාපතිතුමාත් ලේකම්තුමියත් මට විශේෂ සහයෝගය දැක්වුවා. ඇත්තටම මමත් අයවැයට පක්ෂව විපක්ෂව ඡන්දය දෙන්නද කියලා හිතාගන්න බැහැ. මෙතන තියෙන සෝෂාකාරීත්වයත් එක්ක අපක්ෂපාතී වෙන්න තමයි හිතිල තියෙන්නෙ. ඇත්තටම මමත් දෙපැත්තකට අතරමං වෙලා හිටියෙ. මොකද කියල අන්තිම මොහොතෙ තීරණය කර ගන්න බැරිවුනා. ඉතිං පක්ෂ විපක්ෂ බේදයකින් තොරව ඇත්තටම සියලුම හොඳ දේට සහයෝගය දක්වමිනුත්, පක්ෂයේ නායකතුමන්ලාගේ අනුදැනුම යටතේ පක්ෂයේ දියුණුවට වැඩකටයුතු කරමින් ඉදිරියට යන්න තමයි බලාපොරොත්තු වෙන්නෙ. ඇත්තටම හැම දේටම මම සහයෝගය දක්වනවා. මොනවා හරි අතපසුවීමක් වුනානම් සමාවෙන්න ඕන. සභාපතිතුමා මම හඳුන්වල දුන්න නිසා හඳුන්වල දෙන්න දෙයකුත් නැහැ. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන්ම ගරු සභාපතිතුමන්ට මම මේ අවස්ථාවෙ ස්තූතිය පුද කරන්න ඕන. මොකද අපේ අක්කණ්ඩියගෙ පුතණුවන්ගෙ මළ ගෙදරට පැමිණීම සම්බන්ධව. ඒ වගේම අපේ ධර්මසිරි මන්ත්‍රීතුමාටත් ස්තූතිවන්ත වෙනවා. ඇත්තටම මේ මොහොතේ එය ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වෙනවා. මහා ඛේදවාචකයක් තමයි වුනේ. ඒ කියන්නෙ සිරිසුනන්ද මහා විද්‍යාලයේ 12 වසරේ ඉගෙනුම ලබන ඒ සසික පුතනුවන් අප නාගොඩ පොලීසිය විසින් එතුමන්ට කළ ක්‍රියාවක් නිසාත්, නීතියට පටහැනිව නොයැම පිළිබඳවත් තමයි මේ හේතුව වෙන්නෙ.  මේ ගරු සභාවට මා එය මුලසිටම කියන්නම් ඒ දරුවා අවුරුදු 17 යි සිරිසුනන්ද ඉස්කෝලෙ ඉගෙන ගන්නෙ. ඒ දරුවා කුරුඳු හූරලා, බාස්කට් ගහලා තමයි මාපලගම ප්‍රදේශයෙන් රුපියල් 30000 කට ස්කූටි යන්ත්‍රයක් අරගෙන තියෙන්නෙ. මේ බයිසිකලය අරගෙන මේ දරුවා රයිස් එකක් ගැනීමට පොරවගම ප්‍රදේශයේ සිට තල්ගස්වලට ඇවිල්ලා තියෙනවා. සාම විහාර කන්දෙ තමයි ඔවුන්ගෙ ගෙදර තියෙන්නෙ. එහෙම එනකොට බයිසිකලය නවත්තන්න කියලා, නාගොඩ පොලීසියෙ ජීප් රථයෙන් අත දැම්මයි කියල තමයි කියන්නෙ. මේ දරුවට ඇහිලා නැහැ. මේ දරුවා බයිසිකලෙන් එහෙමම ඇවිල්ල තියෙනව. ආවට පස්සෙ ඒ ජීප් රථයේ හිටපු මහත්වරුන් ආර්.එම්.බී. කතා කරලා, මේ බයිසිකලේ නම්බර් හොයාගෙන තියෙනවා. නමුත් මේ බයිසිකලේ මේ දරුවට අයිති නැහැ. බයිසිකලේ අයිතිය තියෙන්නෙ වෙනත් පුද්ගලයෙකුට. එම නිසා පොලීසියෙන් කළේ මොකක්ද මේ දරුවට සහ අම්මට පොලීසියට එන්න කිව්වා. පොලීසියට එන්න කිව්වට පස්සෙ ඒ එන්න කියපු රාලහාමි ඉස්සරහ දොරෙන් බැහැල ගිහිල්ල තියෙනවා. රුපියල් 2000 කට ශේප් එකක් දාන්නම් කියලා තියෙනවා. නමුත් ඒ රාලහාමි ගියාට පස්සෙ ඇතුලෙ බ්‍රාන්ච් එකේ හිටපු

රාලහාමි කැඳවලා, අම්මට එළියෙන් ඉන්න කියලා මේ දරුවට හොඳටම කියල තියෙනවා. ඉතිං අපි දන්නවනෙ පොලීසියෙ කීම කොහොමද කියලා. අපි කියන්නෙ නීතියට ගරු කරන්න ඕන. හිස නමන්න ඕන. නමුත් මේ පොලිස් නිලධාරිය කියල තියෙනවා. ලබන බදාදා උසාවි දානවා. රුපියල් 80000 ක් අරගෙන වරෙන් කියලා. අන්න ඒ බය නිසා මේ දරුව හැඩූ කඳුලින් බයිසිකලේ භාරදීලා පොලීසියට 11.45 ට නැවත පොරවගම ප්‍රදේශයට ගිහින් තියෙනවා. ගිහිල්ලා එයාගෙ හොඳම යාලුවෙක් ඉදල තියෙනවා අනුර කියලා. ඒ දරුවත් එක්ක කතා බහ කර කර ඉදලා ඒ මල්ලි පස්සෙන්ම ඉදලා. එවලෙ ඇත්තටම ඒ අම්මට මුදල් නැහැ. දලු කඩල සල්ලි හොයා ගන්නෙ. එවලෙම ඒ අම්ම කෝල් එකක් දීල ඒ දලු කඩන ගෙදරට කියල තියෙනවා. මට අක්කෙ රුපියල් 50000 ක් දෙන්න මෙන්න මේ වගේ තීරණයක් තියෙන නිසා කියලා. හා දෙන්නම් කිව්වලු ඒකත් ඒ දරුවා අහගෙන ඉදලා. ඒ දරුවා හිතන්න ඇති. මේ අම්මට තවත් ගින්දරක් මම දෙන්නෙ මොකටද කියලා. ඒ පාර ඒ දරුවා ඒ යාලුවට යන්න කිව්වලු. දවල්ට කන්න බත් නැහැ. ඔයා ගෙදර යන්න කිව්වලු. මල්ලිට කිව්වලු ඔයත් යන්න කියලා. කියලා මේ දරුවා පිටිපස්සෙ තියෙනවා අඩි 10 ක් විතර උස බේරු ගහක්. වයර් පොටවල් පස්පොටක් දාගෙන මේ දරුව එල්ලීල මැරුණා. ඇත්තටම අපි සානුකම්පිතව සිතනවනම්, පොලීසියට හිස නමන එක ඇත්ත. ඒ ගරුත්වය දෙන්න ඕන. නීතියට පටහැනි නොවෙන්න ඕන. නමුත් මේ දරුවට පොලීසියෙන් කියපු කතාව නිසා තමයි අපි හිතන හැටියට මේ දරුවා මේ ජීවිතක්ෂයට පත්වුනේ. ඇත්තටම මේ දරුවට දරාගන්න බැරිවුනා. අම්මට තාත්තට මේක ගෙවන්නෙ කොහොමද කියලා. බොහොම අමාරුවෙන් ගත්ත බයිසිකලෙත් නැති වුනා. මෙන්න මේ වගේ තත්ව ඉදිරියට ඇති වෙන්න එපා කියලා මම ප්‍රාර්ථනා කරනවා. මේක මම කියන කතාවක් නෙවෙයි. මේ අම්ම මරණ පරීක්ෂකතුමිය ඉදිරියෙත් මේ විදිහටම තමයි කිව්වෙ. මෙන්න මේ පොලීසියෙ රාලහාමිල නිසා තමයි මගේ දරුවා අද නැති වුනේ කියලා. මම හිතන්නෙ ඒ මළ ගෙදරට ගිය වෙලාවෙ, අපේ ගරු සභාපතිතුමත් දන්නවා. සභාපතිතුමාටත් ඒක ඒ විදිහටම පැවසුවා. ඇත්තටම කණගාටුයි. අපි නීතියට ගරු කරන්න ඕන. නමුත් මේ වගේ ඛේදවාචක වෙන්න නරකයි. ඒ කියන්නෙ අද අපේ දරුවට වෙන්න පුලුවන් හෙට ඔබතුමන්ලගෙ දරුවට වෙන්න පුලුවන්. එතුමන්ලට කිසිසේතම එසේ රුපියල් 80000 ක දඩයක් ගහනවයි කියලා කියන්න හැකියාවක් නැහැ. ඒක උසාවියෙන් තීරණය කරන්නෙ. එතුමාලට එහෙම කියන්න බැහැ. මම ඉල්ලා සිටින්නේ ඒ වගේ දේවල් වෙන්න ඉඩ දෙන්න එපා කියලා තමයි.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මේ කලාපය තුල අපේ පාසල්වල දැන් අපේ දරුවො ඉස්කෝලවල යනවා. අඩුමගානෙ මම අහන්නෙ මේ පාසල් විෂබීජහරණය කළාද? ඒ වගේම තමයි අඩුම ගානෙ සබන් කැල්ලක්වත් මේ ආණ්ඩුවෙන් ලබා දුන්නද? ඒක තමයි අපි අහන්නෙ ඒව ඔබතුමන්ල කියන්න. දැන් අපේ දරුවො ඉස්කෝලෙට එවන්න කියනවා. නමුත් කිසිම ආරක්ෂාවක් නැහැ. දැන් මේ හතර වටේම කොරෝනාම. තල්ගස්වල, ගෝනදෙනිය, උඩුගම මේ වසංගතය තියෙනවා. අපි අහන්නෙ ඇයි මේ තත්වයක් උඩ මේ වගේ දරුවො පාසල් එන්න කියන්නේ. අනිත් එක තමයි ගරු සභාපතිතුමනි, දරුවොන්ට කියන්නෙ විෂබීජහරන ගෙදරින් අරන් එන්න කියලා. මේ පොඩි සැනිටයිසර් එකක් රුපියල් 250 ක් විතර වෙනවා. දැන් මේ දරුවන්ට මේක ගෙනැල්ල පිරිමහන්න පුලුවන්ද? දැන් මම අද උදේ සිරිසුනන්ද ඉස්කෝලෙට ගිහිල්ල ඇහුවා. ගරු විදුහල්පතිතුමනි මොකද මේ ගැන කියන්නෙ. අනේ මන්ත්‍රීතුමා කිසිම දෙයක් කියන්නෙ නැත කිව්වා. අපට කිසිම සහයෝගයක් දෙන්නෙ නැහැ කියලා කිව්වා. ප්‍රවෘත්තිවලට නම් කියනවා නමුත් කිසිම ආධාරයක් අපට ලැබෙන්නෙ නැහැ කියලා. ඇත්තටම අපට කණගාටුයි අන්න ඒ ගැන ගරු සභාපතිතුමනි.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ඔබතුමා කිව්වා. අර පැල වර්ග ලබා දෙනවයි කියලා. ඒ පැල වර්ග ලබා දෙන එක ඇත්ත. නමුත් අපේ ගමේ පවුල් 280 ක් ඉන්නවා. ඔය 280 බෙදල තියෙන්නෙ. පැළ වර්ග දෙන්න එක නිලධාරියෙකුට 50 ගානෙ. දැන් 200 කට තමයි පැල ලැබෙන්නෙ. ඉතිරි 80

අහිංසක ජනතාවට පැල වර්ග දෙන්නෙ කවුද? ගරු සභාපතිතුමනි, ඒ අය කිසිම නාම ලේඛනයක් අරගෙන නැහැ. ඔබතුමාට මම කිව්වෙ ඒකයි. අර කමිටුවලට අපිත් යොමු කරන්න. ඒ යොමු කරනවනම් අපිට පුලුවන් ඒ අදහස් ටික දෙන්න.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි පක්‍ෂ බේදයක් තියෙන්න විදිහක් නැහැ. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ඔය කමිටු තියෙනවා. ඒ කමිටුවලටත් අපට ආරාධනා කරන්නෙ නැහැ. දැන් මේ ඊයෙ පෙරේද තිබුනා කොරෝනා කමිටුව. ඒ කොරෝනා කමිටුවට අපිත් නැහැ. මම හිතන්නෙ අපේ මේ පියල් මන්ත්‍රීතුමත් හිටියෙ නැහැ. ග්‍රාම නිලධාරි කිව්වා. එතුමා ආවෙ නැහැයි කියලා. ගරු සභාපතිතුමනි, අපට මොනවත් දැනුම් දෙන්නෙ නැහැ. ඊයෙ අපේ ගම් ප්‍රදේශයේ ගෙයක් අඩිතලම් දැම්මා. මම ඒකට ඇත්තටම සතුටුයි. ඒ අසරණ තරුණයට ඒක ලබා දුන්නට සතුටුයි. නමුත් ගියාට පස්සෙ තමයි මම දන්නෙ මෙන්න මෙහෙමෙයි කියලා. ඉතිං මම කියන්නෙ ගරු සභාපතිතුමනි අපිත් පොදු නායකයො වශයෙන් අපටත් ඒව දැනුම් දෙන්න. ඇත්තටම දෙයක් වුනාම ගමේ විතරක් නෙවෙයි කොට්ඨාස 15 ම අපි යනවා. නමුත් අපි කියන්නෙ අපටත් ඒ පිලිබඳ පොඩ්ඩක් දැනුම් දෙන්න. ඔබතුමන්ලගෙ වගකීමක්නෙ ඒක.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් මහා ව්‍යසනයක් තියෙනවා. මම හිතන්නෙ අපේ මේ සියලුම දෙනා දැනගන්න ඕන. මේ අයිස් කියන මත්ද්‍රව්‍ය වර්ගය මේ නාගොඩ බල ප්‍රදේශයේ දැනටත් තියෙනවා. මම බය නැතුව කියනවා. එම නිසා ගරු සභාපතිතුමනි, එය වහාම නවත්වන්න කියන්න. ඒ කියන්නෙ අපේ තරුණ තරුණියන් ඕකට බිලි වෙනවා. ඔබතුමන්ලා හිනා වුනාට ඔබතුමාල හිතන්න මේකෙන් මහා විනාශයක් ඇති වෙන්නෙ. මේ බලධාරීන් මේ ගැන දන්නවා. ඇත්තටම මම කියන්නෙ මට ලැබුන වචන හුවමාරුවකදි මම දැනගත්තෙ. ඔබතුමාගේ ක්‍රියාකාරිත්වය මත ඒ ව්‍යසනය නැතිකර ගන්න පුලුවන්. ඒ විතරක් නෙවෙයි දැන් දියවර ගම්මානයේ අනිත් පැත්තේ නාවින්න ප්‍රදේශයේ මහා කසිප්පු ජාවාරමක් කරගෙන යනවා. ගරු සභාපතිතුමනි. ඒ සම්බන්ධවත් ඔබතුමාල පොලීසියට කියල බලන්න. මොකක්ද වෙන්නෙ කියලා. ඇත්තතටම මෙතුමාල සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් කමිටුව යනාදියෙදි සාකච්ඡා කරනවනම්, මේක බොහෝදුරට නවතිනවා. මේක කරන්නෙ අපි වගේ මේ පොඩි පාහෙ කට්ටිය නෙවෙයි. මම අනිවාර්යයෙන්ම දන්නවා. ඒ නිසා තමයි ගරු සභාපතිතුමාගෙන් මේ ඉල්ලීම කරන්නෙ මම.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, දියවර ගම්මානෙ සහ නාවින්න කියන ප්‍රදේශයේ බහුතරයක් මෙන්න මේ කසිප්පු ජාවාරම කරගෙන යනවා. මේක කොහොම හරි නවත්තල දෙන්න. ඔබතුමාට මම ගරු කරනවා කුඹුරුහේනෙ කසිප්පු නැවැත්තුවා. අපි කැගහල කැගහල නැවැත්තුවා. ඒකට ඇත්තටම ගරු කරනවා ඔබතුමාට. ඒ වගේ මෙන්න මේ නාවින්න සහ දියවර ගම්මානෙත් මේක කොහොම හරි නවත්තල දෙන්න කියල තමයි මම ඉල්ලා සිටින්නෙ.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මේ කුඹුරු වගාවෙදි ඊයෙ රෑත් මම 3.00 වෙනකම් නිදිවරල ආවෙ. ඒ කියන්නෙ මෙන්න මේ ගවයන් සම්බන්ධව ගරු සභාපතිතුමනි ඔබතුමාටත් එදා කිව්වා. පොලීසියටත් කිව්වා. සම්බන්ධීකරණ කමිටුවෙත් කතා කළා. ප්‍රචාරය හරි ගිහිල්ලා කියන්න මේ අයිතිකාරයන්ට මේ හරක් ටික ලිහන්න එපයි කියලා. ප්‍රචාරය යන්න ඇති. මේ කතාවෙදි මම කියන්නෙ ඇත්තටම මේ මිනිස්සු බොහොම අමාරුවෙන් තමන්ගෙ රත්තරං බඩු ටික උගස් තියල තමයි කුඹුරු කරන්නෙ. එම නිසා මෙන්න මේ නිදැල්ලෙ යන හරක් අයාලෙ යන හරක් නෙවෙයි. නිදැල්ලෙ අතහැරල තියෙන්නෙ. ඒ අය කිරි ටික දොවා ගන්නවා එච්චරයි. අනිත් දේවල් සොයන්නෙ නැහැ. ඇත්තටම අපේ මේ කුඹුරු අක්කර 40 න් කුඹුරු අක්කර 4 ක් ඊයෙ රෑ කාල තියෙනවා. අපේ මේ කෘෂි කර්ම නිලධාරීතුමිය අද නිරීක්‍ෂණයට ගිහින් තියෙනවා. මම කියන්නෙ අන්න ඒක නිසා ගරු සභාපතිතුමනි, මේ ගැනත් අවදානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අපි අයවැයට විරුද්ධ වුනේ. අපි මේ පක්ෂ පාට බේද නොබලා ඇත්තටම අපිට ඔබතුමාගෙ වැඩසටහනේ පිළිවෙලක් තිබුනා. ඒ පිළිවෙලේදී අර අපිට දැනෙන හදවතට දැනෙන දේ එතනදි තිබුනෙ නැති නිසා තමයි අපි විරුද්ධ වුනේ. ගරු සභාපතිතුමනි, එම නිසා අමනාප වෙන්න එපා. අපි කියන්නෙ සියලු දෙනාට එක හා සමානව වැඩකටයුතු කරලා, අපි වගේ ඇත්ත කියන මිනිසුන් බිහි කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අවුරුදු තුනක් අයවැය ලේඛනයකුත් එක්ක අපි ඉස්සරහට යනකොට අපිට බොහොම සතුටක් තියෙනවා. අපි යෝජනා කරපු යෝජනාවලි, යෝජනා කොච්චර දුරට ක්‍රියාත්මක වුනාද කියන එක සම්බන්ධව. අපේ හෘද සාක්ෂියෙන් අපි විමසුවොත් එහෙම, අපි ඔබතුමා ඇතුලුව අපි 14 දෙනෙක් පක්ෂයේ මොනතරම් ආකාරයට සතුට, අසතුටත් එක්ක මේ මන්ත්‍රී ධූරයේ වැඩකටයුතු කරනවද කියලා තමන්ගෙ හෘද සාක්ෂිය දන්නවා. ඒ ගැන මම අපේ හිටපු අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා විදුහල්පතිතුමාගෙ ඌණ පූර්ණයක් ගේන්නම්. හිතට එකඟ නොවුනත්, පක්ෂයේ තීන්දුව මත අපට අයවැයට ඡන්දය දීමට සිදු වුනා. ඒ ගැන බොහොම කණගාටුවක් තියෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී රටක, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක, ප්‍රජාතන්ත්‍රවාදීව තීන්දුවක්, තීරණයක් හිතට එකඟව ගන්න බැරිවීම පිළිබඳව. ඉතිං ඒක නිසා අපි බලාපොරොත්තු වෙනවා. මේ 2021 අයවැයවත් අඩුම තරමින් මේ තියෙන සංවර්ධන යෝජනා ටිකවත්, සිදු කරාවි කියලා. අඩුම තරමින් අපි ගිය අවුරුද්දෙ බැලුවොත් විස්සෙ සංවරුධන යෝජනාවලින් ඔබතුමාට කියන්න පුලුවන්ද මේකෙන් කීයක් කළාද කියලා. කරගන්න බැරි වුනා. අඩුමගානෙ අපි කියන්නෙ නැහැ. මේ උඩුගමටෙයි කොහෙටවත් කරන්න කියලා. අඩුමගානෙ ඔබතුමාගෙ කොට්ඨාසෙටවත් මොනව හරි දෙයක් කරල තියෙනවද? කියලා අපි අහන්න කැමතියි. නමුත් එහෙම දෙයක් සිදු වෙලා නැහැ. අපට තවම හරියට බෝක්කුවක් දාගන්න බැරිවුනා. ඒ සියලු දේම බැරිවුන දේවල්. අපි පසුගාමී වෙනවා වගේම අපි කණගාටුවට පත් වෙන්න ඕන. මේ දේවල් කර ගන්න නොහැකි වීම පිළිබඳව. ඒක නිසා ඔබතුමාට ඡන්ද විමසීමේදී ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා අපට දැනුම් දෙනවා. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව යනුවෙන් සඳහන් කලත්, මම අහනවා සභාපතිතුමනි ඔබතුමා මේ 1987 ප්‍රාදේශීය සභා ආඥා පනතේ ඔබතුමාට පැවරී ඇති බලතල මේ ප්‍රාදේශීය සභාව තුල ක්‍රියාත්මක කළාද කියලා. නැහැ ක්‍රියාත්මක වුනේ නැහැ සභාපතිතුමනි. අපි එහෙම ක්‍රියාත්මක වුනානම් මීට වඩා ඵලදායීතාවයෙන් යුක්තවූ සභාවක් අදවෙන කොට මේ වර්ථමානයේ තියෙන්න ඕන. ඔබතුමා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කළේ නැහැ. පනතේ බලතල ක්‍රියාත්මක කළේ නැහැ. ඉතිං ඒක නිසා ලොකු කණගාටුවක් තියෙනවා. සභාපතිතුමා, නිමල් වික්ටර් නාගොඩ විතාන නෙවෙයි ඔතන ඉන්නෙ. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ සභාපති ඔතන ඉන්නෙ. ඒ නිසා ඔබතුමාට මේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ලොකු බලයක් ගොඩ නැගිල තියෙනවා. ඒ බලයෙන් ඔබතුමාට මහ මෙහෙවරක් ඔබට ලැබී තියෙනවා. ඒ නිසා මේ හැමදාම අපි මේ අයවැය ලේඛන අරගෙන ගෙදර ගියාට මේවයි පනිවිඩ දුන්නට, මේවයි පනිවිඩ දාල සුභ පැතුම් එක්කළාට, නමුත් මේ වනවිට ඒක යථාර්තයක් වෙලා නැහැ. අපි මේක යථාර්තයක් කර ගන්න, මේ සභාව තුල මේක විධිමත් සභාවක් විදිහට ඉස්සරහට ගෙනියන්න, සාකච්ඡාවට බඳුන් වුනේ නැහැ. මෙපමණ කල් අපි සභාවේ ආධායමක් වැඩිකර ගන්න, ආදායම් උත්පාදනයක් වැඩි කර ගන්න මේ සභාවෙ එක වචනයක් කවුරුවත් කතා කරල නැහැ. එහෙමනම් එහෙම කොහොමද අපේ ජනතාවට අපෙන් බලාපොරොත්තුවෙන ඒ යුතුකම් කොටස අපි කරන්නෙ. ඉතිං ඒක නිසා මේ කණගාටුව තියෙන්නෙ. අපි බලාපොරොත්තු වෙනවා. 2021 දී වත් මේ අයවැය වාර්තාවේ තියෙන ඒ සංවර්ධන ක්‍රියාදාමවල් මේ මහ පොලවේ යථාර්තයක් වෙනවා දැකීම. අපි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විදිහට

කොන්දක් තියාගෙන ලබන ජනවාරිවල ඉදලවත් මේකෙ වාඩි වෙන්නත් අපට කොන්දක් තියෙන විදිහට ඔබතුමා කොන්දක් ඇති ප්‍රාදේශීය සභාවෙ සභාපතිවරයෙක් විදිහට වැඩ කරන්න ශක්තිය ලැබේවා කියලා මම ඉස්සෙල්ලම ඔබතුමාට සුභ පතනවා. ලබන අවුරුද්දෙ ජනවාරිවල ඉදලවත් විදිමත් සභාවක් විදිහට මේ සභාව පවත්වාගෙන යන්න. ඉතිං ඒක ගැන එච්චරයි කියන්න තියෙන්නෙ.

ඒ වගේම ඔබතුමා යෝජනා කරල තිබුනා. (ඊ 1) ගරු සභාපතිතුමාගේ පරිපාලන යෝජනා. ඔබතුමා දන්නවා. මේ සභාවත් දන්නවා. මම මේ සභාවට ආපු දවසෙ ඉදලම මේ සභාවෙ තියෙන අඩුපාඩු නිවැරදි කරන්න, කාර්යක්ෂම සභාවක් විදිහට මේ සභාව ඉස්සරහට ගෙනියන්න, ඵලදායීතාවයෙන් යුක්තවූ සභාවක් නිර්මාණය කරන්න, මම මගේ අදහස් යෝජනා මොනතරම් දුරට ලබාදුන්නද කියලා. මේ සභා වාර්තා අරන් බැලුවට පස්සෙ දකින්නට ලැබෙයි. ඔබ සියලුම දෙනා ඒවා ඇහුම්කන් දුන්නා. මම හිතනවා සභාපතිතුමනි, මම කැමතියි අහන්න. දැන් මාස හතරකට කලින් අපි හැමදාමත් කතා කළා. උඩුගම ශ්‍රවනාගාරය අපට තියෙන ලොකුම සම්පතක්. ඒ ශ්‍රවනාගාරයේ අපට අඩුපාඩු ගොඩක් තියෙනවා. ඒ අඩුපාඩු පිරිමහන්න අපි හැමදාමත් උත්සවයකට ගිහිල්ලා ඉස්සරහින් වාඩිවෙලා ඉදලා. අර දෙන්නෙක් දෙපැත්තෙන් එකතුවෙලා මේ කර්ටන් දෙකක් දෙපැත්තට තල්ලු කරන් ඇවිල්ලා.කටයුතු කරන විට අපි හැමදාමත් මේ සභාවෙ කතා කළා. අඩුම ගානෙ කර්ටන් රෙද්දක් හයි කරන්න කියලා. මම අහනවා සභාපතිතුමා ඒ කරපු මේ යෝජනාවට මේ සභාවෙ ක්‍රියාත්මක වුනාද කියලා. අඩුම ගානෙ මේ කර්ටන් රෙද්දවත් දාන්න. සභාපතිතුමා. මේක මේ ඔබතුමා නිවැරදි ඇති. ඔබතුමා යෝජනා ගෙනැල්ලා ඇති. නමුත් මේ නිලධාරි මොන මට්ටමෙන් ක්‍රියාත්මක වෙනවද කියල අපි දන්නෙ නැහැ. දැන් මාස තුනකට නැත්නම් හතරකට කලින් මේ සභාවෙ යෝජනාවක් ආවා. ශ්‍රවනාගාරයේ කර්ටන් රෙද්ද සඳහා ඇස්තමේන්තු සකස් කරන්න කියලා. අද කෝ ඒක. අද ශ්‍රවනාගාරෙ එක්කෙනෙක් ඉන්නවා. ඒක බලා ගන්න කියලා. හතර වටේම කැලෑ වැවිලා. එය සුද්ද පවිත්‍ර කරන්නෙ නැහැ. මකුළු දැල් වැවිලා, වීදුරුවල දූවිලි බැදිලා ජරා ජීර්ණ වූ ශ්‍රවනා ගාරයක් තියෙන්නේ. නිකන් හිගිල්ල බලන්න. ඇතුල්වෙන තැනම පරවියො ලැගලා, මේ වගේ ලස්සනට දාපු සිවිලිම කඩාගෙන වැටෙන තත්වෙට ඇවිල්ලා. ගේට්ටු කනුවක් ගහනවට වඩා මේ ශ්‍රවනාගාරය නිවැරදි කරන්න සභාපතිතුමා උත්සහ කරන්න. මේව අපේ සම්පත්.

ඒ වගේම තමයි කොඩි කනු තුන පිලිබඳව මම ආපු දවසෙ ඉදලම කිව්වා. මොකක් හරි උත්සවයක් තිබුනොත් අපේ සංස්කෘතියට අදාලව අපේ ජාතියට උරුම වූ දෙයක් තියෙනවා. අඩුම ගානේ සිංහ කොඩිය උස්සන්න. අද සිංහ කොඩිය උස්ස ගන්නවත් ශ්‍රවනාගාරයේ කොඩි කනුවක් අපට ස්ථාපිත කරන්න බැරිවෙලා තියෙනවා. ඒව අපේ දුර්වලකම් සභාපතිතුමා. අපි මේ ප්‍රාදේශීය සභාවෙ ඔක්කොම ඇවිල්ල. මේ පැකට් එකත් අරගෙන ගෙදර ගිහිල්ලා. ආයෙ මෙතනට ඊලග දවසෙ පැකට් එක ගන්න එන්න නෙවෙයි අපි බලාපොරොත්තු වෙන්නෙ. සභාපතිතුමා. ඊට වඩා අපිට ඔබතුමත් මේ ප්‍රදේශයේ බලවතා විදිහට මහජන නියෝජිතයා මුල් පුරවැසියා විදිහට අපිවත් අරගෙන ගමනක් යන්න. මේ සියලු දෙනා එකඟතාවය දෙයි. එහෙම ගමනක් යන කොට. අපි ඔබතුමා දන්නවා. ඔබතුමාගෙ අපිට චෝදනා නැහැ. ඒ නිසා අපි සතුටු වෙනවා ඔබතුමා ගැන. නමුත් අපිට කණගාටුවක් තියෙනවා. ඔබතුමා මේ නිවැරදි පරිපාලනය සහ මේ නිවැරදි විදිහට මේ සභාවේ වැඩකටයුතු නොකරන එක ගැන. ඉතිං ඒක නිසා සභාපතිතුමනි මම සතුටු වෙනවා. උඩුගම පොළ සම්බන්ධව ඔබතුමා ගිය වර යෝජනාවක් දාලා දැන් වැඩකටයුතු ආරම්භ වෙනවද කියල මම දන්නෙ නැහැ. නමුත් ඒ වෙනුවෙන් මම සතුටු වෙනවා. දැන්වත් ඒක යථාර්තයක් කර ගන්න ලැබීම පිළිබඳව. කොච්චර කාලයක් මේ මහජන මුදලින් හදපු ගොඩනැගිලි අභාවයට ගිහිල්ලා, කැලෑවට ගිහිල්ලා මිනිස්සුන්ට ඵල ප්‍රයෝජනයක් ගන්න බැරුව ඉන්න අවස්ථාවක, මම මහන්සි වෙලා නඩුවක් දාගෙන පස් ගෙනැල්ල දාලා, ඒ වැඩකටයුතු කළේ ඒ ගොඩනැගිලිවලට ඒ මහජන මුදලට

සාධාරණයක් කරන්න. මම හිතනවා ලබන අවුරුද්දෙදිවත් අඩුම තරමින් මේ යෝජනාව මේ මහ පොලවෙ යථාර්තයක් වෙයි කියලා.

ඒ වගේම ඔබතුමා දැන් අපේ ජනාධිපතිතුමා කියනවා. ප්‍රාදේශීය සභාවට ආවට පස්සෙ වීථි රේඛාවක් ගන්න, තමන්ගෙ ප්ලෑන් එක අනුමත කර ගන්න දින තුනක් හෝ කෙටි කාලයක් තුල ඒ දේවල් අනුමත කරල දෙන්න සැලැස්මක් හදන්න කියලා. මම අහනවා ඔබතුමාගෙන් ඒ පිළිබඳව ජනතාව මෙතනට ඇවිල්ලා ජනතා ගැටලුවක් වශයෙන් ජනතා ප්‍රශ්න පිළිබඳව කටයුතු කරන්න ඔබතුමා ගත්ත ක්‍රියා මාර්ග මොනවද? මොනතරම් ගැටලු ප්‍රමාණයක් මේ වෙන කොට නිරාකරණය කරල ඉවරද? ඒ නිසා ඒ ජනතාව ඇවිල්ල මෙතනින් යන්නෙ අසතුටෙන් නම් අපේ මේ දැක්ම සහ මෙහෙවර යටතේ ඒ දෙකේම තියෙන අරමුණු සාක්ශාත් වෙන්නෙ නැහැ. ඒක නිසා ගැටලුකාරී තත්ව ගොඩක් තියෙනවා. ඒව සභාපතිතුමා නිවැරදි කරගන්න. අපි ඔබතුමත් එක්ක ඉන්නවා. 2021 අයවැය වාර්තාව සම්බන්ධව කටයුතු කරන්න. අපි ඊලග අයවැය එනතුරු ඔබතුමත් එක්ක ඔබතුමාගෙ දෑත් ශක්තිමත් කරන්න ඉන්නවා වගේම නිවැරදි දේ නිවැරදි විදිහට දකින්නත්, වැරදි දේ විවේචනය කරන්නත්, අපි මේ සභාව තුල මෙපමණ කල් කටයුතු කරල තියෙනවා. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නෙ. නිවැරදි පරිපාලනයක් තුල මේ ප්‍රාදේශීය සභාවේ දැක්ම සහ මෙහෙවර යථාර්තයක් කරන්න. මේ මිනිස්සුන්ට මිනිස්සුන්ගේ සිතුම් පැතුම් ඉටු කරගන්න. මේ ප්‍රාදේශීය සභාවේ ඔබතුමාගේ බලය පාවිච්චි කරලා, අපටත් මේ ප්‍රාදේශීය සභාවේ සියලු දෙනාටම කොන්දක් ඇතිවෙන විදිහට, කොන්දක් තියාගෙන, මේ ප්‍රාදේශීය සභාව තුල අපේ නායකයා ඔබයි කියන තැනට ඔබට පත්වෙන්නට ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මේ අවස්ථාවෙදි මම නැගී සිටියේ වචන ස්වල්පයක් මේ සභාව ගැන අදහස් දක්වන්න. මොකද මම ප්‍රථමයෙන් පුදුමයට පත් වුන දෙයක් තමයි, අද අපේ වනිගරත්න විදුහල්පතිතුමා නැගිටලා අපේ සහබන්දු මහත්තය කතා කරන අවස්ථාවෙදි මැද්දෙන් පැනලා, නැගිටලා, වාර්තාව ස්ථිර කරන්න ගත්තා. මොකද එතුමා විදුහල්පති කෙනෙක්. අපි අතින් ඔයදේ සිදු වුනානම් ඒක එච්චර පුදුමයට කරුණක් නෙවෙයි. නමුත් එතුමා විදුහල්පතිවරයෙක් වශයෙන් ඒ දේ කිරීම පිළිබඳව අපේ සතුටක් නැහැ.

අනිත් කරුණ තමයි, මේ ලබන අවුරුද්දෙවත් අපට දින දර්ශනයක් දින පොතක් ලබා දෙන්න අද දින කටයුතු කළානම් හොඳයි කියලා මම අදහසක් දක්වනවා. ඒ වගේම තමයි අපේ සහබන්දු මන්ත්‍රීතුමා අදහසක් පළ කළා. ගමේ වගා පිළිබඳ, තවන් තියෙන තැන් ගැන, සදහනක්. එතුමාට ඒ පිළිබඳ දැනුවත් නැහැ කියලා. අපේ ගම් පිළිබඳ කතා කළොත්, කොරෝනා කමිටුව කියලා කමිටුවක් තිබුනා. වසම් දෙක දෙක තමයි තිබුනෙ. වසම් හතරෙන් ඒ වසම් දෙකේ ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කු.ප.නි.ස., පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී ඇතුලු රාජ්‍ය නිලධාරීනුත්, ප්‍රාදේශීය ලේකම්තුමියත් සහභාගි වෙලා, ග්‍රාම නිලධාරීතුමිය ඒකට සහභාගි වෙන්න කියලා, මටත් ආරාධනාවක් කළා. ඒ අවස්ථාවෙදි ලක්රුවන් මන්ත්‍රීතුමත් හිටියා. ඒ අවස්ථාවෙදි ප්‍රාදේශීය ලේකම්තුමිය කොරෝනා පිළිබඳවත්, තමන්ගෙ ගමේ වගාව පිළිබඳවත්, ගොඩක් විස්තර කළා. ඒ වගාව විනාශ කරන ගවයින් ආදී සත්තු පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ගොඩක් විස්තර කළා. ඒ වගේම තමයි සෑම ගමකම තියෙන ප්‍රශ්න කතා කරන්න. මේ වගේ කමිටුවක් සති දෙකකට සැරයක් රැස්වෙන්න කියලත් එතුමිය සඳහන් කළා. ඒ අවස්ථාවෙදි අපි මේ අපේ උඩවැලිවිටිය ගැන කතා කරද්දි, අපේ සහබන්දු මන්ත්‍රීතුමා නිතර කියන මේ ජල ටැංකිය පිළිබඳවත් කතා වුනා. එතනදි එතුමිය කිව්වා සෑම ගමකටම ජල ව්‍යාපෘති ලබා දෙනවා කියලා. කොට්ඨාසයට අදාල මන්ත්‍රීතුමාට ඒ ගැන මැදිහත්වෙලා කටයුතු කරන්න කියලා. සංවර්ධන නිලධාරිතුමිය මට

ඇහුනා ලක්රුවන් මන්ත්‍රීතුමාට  කියනවා. එතන ඒ ජල ටැංකියට ඔය කියන පුද්ගලයා තමන්ගෙ අතින් වියදම් කරලා කරපු ගොඩක් කටයුතු තිබුනා කියලා. මට හිතෙන්නෙ ඒ ගැන වැඩිදුර දන්නෙ ලක්රුවන් මන්ත්‍රීතුමා එතුමා ඒ ගැන සඳහන් කරාවි.

ඊට පස්සෙ 194 උඩවැලිවිටිය ගමටත් ගිහිල්ලා ඒ ජල ව්‍යාපෘති පිළිබඳව සොයා බලන්න කිව්වා. මොකද මමත් එතන ජල ව්‍යාපෘතියක් ලබා දෙන ස්ථානයක් පිළිබඳ පෙන්නුවා. එතුමත් ගිහිල්ල බැලුවා. එතන හදයිද කියන එක දන්නෙ නැහැ. ඉතිං ඒ වගේම, ඒ පැල තවාන් දාපු අය පිළිබඳවත් කිව්වා. ඒ ගැන සියලුම දේ සඳහන් කළා. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. මම ගයන්ති මන්ත්‍රීතුමියටත් කතා කරල ඇහුවා. ඔබතුමියගෙ ප්‍රදේශයේත් ග්‍රාම නිලධාරීතුමිය එන්න කියලා. මේ වගේ දෙයක් කළාද කියලා. එතුමියට එන්න කියලා නැහැයි කියලා කිව්වා. ඉතිං අපි ඒ වගේ සහයෝගෙන් ඒ වැඩටික කළා. ප්‍රාදේශීය ලේකම්තුමිය සඳහන් කළේ මේ හැම මාසෙකම සති දෙකකට වරක් රැස්වෙලා ගමේ තියෙන අඩුපාඩු ගැන කතා කරලා, ඒව සකස් කරගන්න උත්සාහ කරගන්න කියන එකගැන. ඉතිං අද දින මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. සියලු දෙනාට ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. රංජිත් ජයවීර අපේ මන්ත්‍රීතුමාගේ සහෝදරියගෙ පුතනුවන්ගෙ අභාවය පිළිබඳව සහභාගි වීමට නොහැකි වීම ගැන ඇත්තටම බලවත්සේ කණගාටු වෙනවා. ඒ සම්බන්ධයෙන් දැනුවත් වීමක් සිදු වුනේ නැහැ. ඒ නිසා ඒ පිළිබදව මේ අවස්ථාවෙදි මගේ බලවත් ශෝකය ප්‍රකාශ කරනවා

ඒ වගේම අද දවසේ මේ සභාවට නව කාන්තා නියෝජනයක් සහභාගි වෙලා තියෙනවා. ඒ පිළිබඳව හදවතින්ම සතුටු වෙනවා. පහුගිය කාලය තුලදි එම පක්ෂය වෙනුවෙන් ෆේස් බුක් එකේනම් අපිට මන්ත්‍රීවරයෙක් තමයි නම් කරලා, සඳහන් කරල තිබුනෙ. අපි බලාපොරොත්තු වුනේ එතුමා ඒවි කියලා. නමුත් අද මන්ත්‍රීවරියක් තමයි මේ අවස්ථාවට සම්බන්ධ වෙලා තියෙන්නෙ. ඉතිං හදවතින්ම සතුටු වෙනවා. මන්ත්‍රීවරියන් හැටියට අපේ ගොඩට තවත් මන්ත්‍රීවරියක් එකතු වීම පිළිබඳව. ඒ වගේම සතුටු වෙනවා. අපේ ඉනෝකා මන්ත්‍රීතුමිය පිළිබඳව. මොකද ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම තුල සංවර්ධනය කිරීම පිළිබඳව උඩවැලිවිටිය ප්‍රදේශය තුල එතුමියගේ ඒ අදහස්වලින් අපට ප්‍රකාශ වුනේ අපේ සංවර්ධනය පිළිබඳව එතුමිය සෑහීමට පත්වෙනවා. මොකද අපේ ලක්රුවන් මන්ත්‍රීතුමත් එක්ක සම්බන්ධ වෙලා. මේ කටයුතු විශාල ප්‍රමාණයක් කරගෙන යන මොහොතෙදි එතුමියටත් ඒ සංවර්ධන කටයුතුවලට ආරාධනා කරලා. ඒ ප්‍රදේශය තුල කරන සංවර්ධන කටයුතු කෙරෙහි දැක්මක් දැකලා. එතුමිය අද දවසේ එතුමියගේ අදහස් දැක්වුවා. ඒ නිසා අපට ගොඩාක් සතුටු හිතෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරියක් හැටියට එතුමියගේ අදහස් පිළිබඳව.

ඒ වගේම අපි පහුගිය කාලය තුලදි එක්සත් ජාතික පක්ෂ රජය තියෙන කාලය තුලදි. ඇත්තටම එතුමන්ලගෙ වැඩකටයුතු කරන අවස්ථාවලදි. අපිත් මන්ත්‍රීවරියන් හැටියට හිටියත් නමුත් අපට සමහර තැන්වලදි ආරාධනා කළේ නැහැ කිසිම දේකට. ගම්පෙරලිය යටතේ කරපු ක්‍රියාදාමයන් සඳහා විශේෂයෙන් කිසිම දෙයක් අපි දැනුවත් වෙලා තිබුනෙ නැහැ. එතකොට අපට ඒවට ආරාධනා කළේ නැහැ. ආරාධනා නොකළයි කියලත් අපි එතුමන්ලත් එක්ක ඒකෙ අපේ කිසිම ප්‍රශ්නයක්. ගම සංවර්ධනය කරන තැන කුමන හෝ විදිහකින් කුමන ආකාරයකින් හරි ගමේ සංවර්ධනය අපි ඉතා වැදගත් කොට සලකනවා. ඒ නිසා පක්ෂ පාට නෙවෙයි අපට ඕන. මහජන නියෝජිතයන් හැටියට අපි ප්‍රාදේශීය සභාවට තේරීපත් වෙලා, මහජන නියෝජිතයෙක් හැටියට අපට මහජනතාවට යම්කිසි සේවාවක් කරන්න පුලුවන්නම්,  ඒක තමයි අපේ දැක්ම. ඒ නිසා එක්සත් ජාති පක්ෂය තුල කරපු ඒ වැඩ පිළිබඳව සහ ගම්පෙරලිය යටතේ කරපු කිසිම දේකට අපට ආරාධනා ලැබුනෙ නැහැ.  අපි ප්‍රාදේශීය සභාවල්වල ඉන්න කොට, මුදල් පාස් කරන කොට, මහජනතාව වෙනුවෙන් මුදල් පාස්

කිරීම් ආදිය කරන්නෙ ජනතාව වෙනුවෙන්. ඒ අපි කිසි දෙයක් දැනුවත් වෙලා හිටියෙ නැහැ. මන්ත්‍රීතුමා, ඔබතුමාල කරපු දැක්ම තුල අපි හදවතින් සතුටු වෙනවා. ඒක ජනතාව වෙනුවෙන් කරපු සේවාවක්නෙ. ඒ නිසා දැන් කිසි දෙයක් උත්සව තියලා නෙවෙයි කරන්නෙ. කරන්න පුලුවන් හැම දෙයක්ම ජනතාව වෙනුවෙන් සෞභාග්‍යයේ දැක්ම තුල ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පය යටතේ ඉතා ඉක්මනින් කඩිනමින් කරන වැඩසටහන් සියල්ලක්ම මේවන විට ක්‍රියාත්මක වෙලා තියෙනවා. ඒ නිසා අපි ඒ දැක්ම තුල කරන වැඩසටහන් විතරයි මේ කරගෙන යන්නෙ. ඒ නිසා මම හිතනවා ඒවා හැම කෙනෙක්ටම සැහීමට පත්විය යුතු වැඩසටහන් රැසක් තමයි නිර්මාණය වෙලා තියෙන්නෙ. ඒ නිසා ජනතාව පක්ෂ විපක්ෂ නැතුව ජනතාව හදවතින්ම සතුටු වෙනවා. මේ කරන ව්‍යාපාරය පිළිබඳව. ඉතිං ඒ නිසා ඒ පිළිබඳවත් සඳහන් කරමින්,

විශේෂයෙන්ම රංජිත් ජයවීර මන්ත්‍රීතුමා කතා කළා. මත් ද්‍රව්‍ය පිළිබඳව. ඇත්තටම මන්ත්‍රීතුමා ඒක ඉතාමත් හොදයි. හැබැයි මත් ද්‍රව්‍ය පිළිබඳව අපි කතා කරද්දි, අපේ ආරක්ෂාවත් අපි තියාගෙන තමයි කතා කරන්න වෙලා තියෙන්නෙ. හැබැයි පසුගිය කාලය තුලදි බොහොම භයානක තත්වයන් තිබුනා. අපි මත් ද්‍රව්‍ය පිළිබඳ සාකච්ඡා කිරීම තුලදි අපේ ආරක්ෂාව ලබන්න සිටින සහ ආරක්ෂාව පතන්න සිටින අය, අපි ඉස්සරහට දාලා අපි තමයි මේව කරන්න කියලා අපිට චෝදනා එල්ල වුනා. ඒ මොකද මං ඒ වගේ මොහොතකදි අපි මත්ද්‍රව්‍ය පිළිබඳව අල්ලන්න කියන කොට, ඒ අපිට ආරක්ෂාව සපයන අය අපි පාව දීල වැඩකරන තත්වයක් සිදු වුනා. ඒ නිසා ඒ පිළිබඳව අපේ ආරක්ෂාවත් තියාගෙන ඕන අපි කටයුතු කරන්න. ඉතිං ඒක නිසා මම හිතන්නෙ අපි හදවතින් කණගාටු වෙනවා. ඉස්සර වගේ ජේ.වී.පී. කාලයක් තිබුනනම්, ඇත්තටම ගෙදරට ඇවිල්ල මරල යන තත්වයක් වගේ තමයි වෙන්නෙ. අර 71 වගේ ප්‍රශ්න තියෙන කාලයක් වුනානම්, ඒ කියන්නෙ අපි මත් ද්‍රව්‍ය පිළිබඳ කතා කළානම්, මම කතා කරපු එක අවස්ථාවකදි ඇත්තටම ඒ නිලධාරි කිව්වා. මේ මන්ත්‍රීතුමියගෙන් බේරෙන්න බැහැ කියලා. මේ ප්‍රදේශයේ තියෙන මත් ද්‍රව්‍ය අල්ලන්න කියලා. මම පාව දීමක් කළා. ඒ කියන්නෙ ඒ වගේ කාලයක් භීෂණ කාලයක් තිබුනනම්, අනිවාර්යයෙන්ම අපිට අපේ ජීවිතය අනාරක්ෂිතයි. ඒ නිසා මම මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නයෙදි මම ගොඩක් දුරට ඒකෙන් මිදිල ඉන්න කටයුතු කළා. නමුත් අද වෙනකනුත් ඒ ප්‍රශ්නයට පිළිතුරු ලැබිල නැහැ. ඒ වගේ කාල පරාසයක් තිබුනා. අපි පාසල් යන කාලය තුල හරි බයේ හිටියෙ. ඒ නිසා මම කියන්නෙ, ඒ වගේ ප්‍රශ්න තියෙනකොට අපි පාව දෙන දෙනවනම්, අපි ඒවට සම්බන්ධ වෙන්න කැමති නැහැ. ඒ නිසා අපි අපේ මේ ප්‍රාදේශීය සභාව තුල අපි යම්කිසි විදිහක කටයුතු කරනව වගේම ආරක්ෂක අංශවලටත් ඒ වගේ නීතිමය කටයුතු ඇති. ඒ අය අපි කියන්න මත්තෙන් ඒව සොයා බලා කටයුතු කරන්න ඕන. ඒ නිසා අපි ඒ පිළිබඳවත් සිහිපත් කරමින්, විශේෂයෙන්ම අද දවසේ මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින්, සියලු දෙනාටම තෙරුවන් සරණයි කියලා ප්‍රාර්ථනා කරමින්, නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු සමස්ත සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන්ම ගරු සභාපතිතුමාට ස්තූතිය ගෞරවය පුද කරන්න ඕන. මේ දවස්වල ගොඩක් කල් බලන් හිටපු දේවල් ටිකක් මගේ කොට්ඨාසෙට ඉටු කරනවා. අපි පාර බැදි ගහල ඉල්ලුවා. ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කරන්නෙ ඒක නිසා. ගුණානන්ද මාවතේ පාර බැදි ගහල දුන්නා. හෝමදොල පාරෙන් භාගයක් දැනට බැදි ගහල තියෙනවා. සේවකයොත් ඉතාම වෙහෙස මහන්සි වෙලා, ඒ වැඩ ටික කළා. ගරු සභාපතිතුමනි. ඔබතුමාට ප්‍රථමයෙන්ම ඒ ගෞරවය ස්තූතිය පුද කරනවා ඒ පිළිබඳව. ඒ වගේම වීථි ලාම්පු ප්‍රශ්නෙ. මගේ මන්ත්‍රී ධූර කාලය තුල කොට්ඨාසෙටම දෙවනි පාර තමයි වීථි ලාම්පු ටික සකස් කරන්න ගියේ. ඊයෙ දවසෙත් අද දවසෙත් මගේ කොට්ඨාසයේ වීථි ලාම්පු ටික සකස් කරනවා. ඒ සම්බන්ධයෙනුත් ස්තූතිය පුද කරනවා. ඒක නිසා අපි දන්නවා ගරු සභාපතිතුමාට ලොකු ප්‍රශ්න ගොඩක තියෙන්නෙ. කොට්ඨාස 15 ක් නිසා අපට වීථි ලාම්පු සකස් කරන්න දෙන්න අමාරුයි. ඒ

වගේම පාර දෙපැත්ත බැදි ගහගන්න දෙන්න අමාරුයි කියලා අපි දන්නවා. නමුත් එවැනි වෙලාවක වුනත් අපිට ඒ දේ ඉටු කරලා දුන්නා. ඒක නිසා නැවත වාරයක් ඉල්ලීමක් කරන්නෙ. තව දවස් තුනක් වැනි පුංචි කාලයක් තියෙනවා බැදි ගහන්න. ඒ දවස් තුනත් ලබා දෙයි කියලා බලාපොරොත්තුවක් තියෙනවා. අයවැය ජයග්‍රහනය කිරීමත් සමග මම හිතන්නෙ ඒක නවතීද දන්නෙ නැහැ. ඒකත් මතක් කරනවා.

ගරු සභාපතිතුමා අයවැයට ඡන්දෙ ගන්න බලාගෙන කළේ නැහැ කියන එක මම ස්ථිර වශයෙන්ම දන්නවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, තව පුංචි දෙයක් මතක් කරන්න තියෙනවා. සභාවට ඇවිල්ලා අවුරුදු තුනක් වගේ කාලයක් වෙනවා. ඒ කාලය තුලම ඉල්ලීම් කරපු දෙයක් තියෙනවා. අර අහිංසක ආත්තම්මගෙ දූරියන් ගහ කපල දෙන්න කියලා කිව්වා. ඒකෙ වැඩේ හරි ඇති. නමුත් ගරු සභාපතිතුමනි, සභාවක් විදිහට අපි ලැජ්ජා වෙන්න ඕන. ඒ දූරියන් ගහ අද එහෙමම තියෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේකෙ නිලධාරීන් හරියට වැඩක් කරලා තියෙන කොට ගරු සභාපතිතුමා හරියට වැඩක් කළා නම්, අර තව දූරියන් ගහක ප්‍රශ්නයක් ආවා. පක්ෂ බේදයක් නැතුව අපි කිව්වා දූරියන් ගහේ ප්‍රශ්න ටික විසදන්න කියලා. නමුත් ගරු සභාපතිතුමනි ඒ ප්‍රශ්නෙ අපට කරදරයක් වෙලා තියෙන්නෙ. සභාපතිතුමනි දූරියන් ගස් දෙකම එහෙමම තියෙනවා. මම සභාපතිතුමාට කතා කරල කිව්වා. මෙතන පක්ෂ බේදයක් වැඩක් නැහැ. සභාපතිතුමත් පක්ෂ බේදයක් අරගෙන වැඩ කළේ නැහැ. ඒක අපි දන්නවා. නමුත් සභාපතිතුමනි, ඉස්සෙල්ලා දූරියන් ගහ කපන්න හරි අතු කපන්න හරි තීරණයක් ඇවිත් තිබුනනම්, දූරියන් ගහේ අතු ටික කපලා හරි, ගහ කපල හරි ඉවත් කරන්න ඕන. සභාවෙන් ඒ මිනිස්සුන්ට දැන් කියනවා. පොල් ගහ කපන්න, පුවක් ගහ කපන්න, කිතුල් ගහ කපන්න ඒ දේවල් මම හිතන්නෙ සභාවට ගැලපෙන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ, නිලධාරින් හරියට වැඩක් කරලා තියෙනවනම්, සභාපතිතුමත් ඒකට හරි තීන්දුවක් අරගෙන තියෙනවනම්, ගහ කපන්න හෝ අයින් කරන්න කියලා ලියුමක් ගහල තියෙනවනම්, ඒක කරන්න ඕන. නැත්නම් අතු කපන්න කියලා තියෙනවනම්, අතු කපන්න ඕන. ඒක අනිත් පැත්තට ගිහිල්ලා පුවක් ගහ කපන්න. කිතුල් ගහ කපන්න කියලා යෝජනා ගේන්න එපා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කියනවා නිලධාරි කියපු වැඩේ කරන්න කියලා. මම මේ වරදක් නෙවෙයි කියන්නෙ. ඔබතුමාම මාත් ඉදිරියෙ ඇවිල්ලා සභාවෙ ප්‍රසිද්ධියෙ ඔබතුමත් කතා කරන නිසා, ඔබතුමා කැටගොඩ ගෙයක වහලක් පාරට තියෙනවයි කියලා නිලධාරි ගිහිල්ලා අයින් කරන්න කිව්වම, ඔබතුමා කිව්වා අපේ යාලුවෙක් ඒකනිසා මෙහෙම කරන්න එපා කියලා, ඔබතුමාම ඇවිල්ල කිව්වනෙ, මන්ත්‍රීතුමා එවැනි කතන්දර තියෙනවා. තරහ වෙන්න එපා මම කිව්වට.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමනි, ඒකට පැහැදිලි උත්තරයක් මම දෙන්න ඕන. මොකද උත්තරේ දෙන්නෙ කොට්ඨාසෙ මන්ත්‍රීතුමාට අසාධාරණයක් කරල නෙවෙයි. ගරු සභාපතිතුමනි, ඒ අවස්ථාව ඉල්ලුවෙ, ගයාන් මන්ත්‍රීතුමා මෙතන ඉන්නවා. බොරු කියන්නෙ නැහැ. ඉස්සෙල්ලම දුරකතන ඇමතුමක් දීල මම ගයාන් මන්ත්‍රීතුමාට කිව්වා. මගේ පංතියෙ යාලුවෙක්, පාරට අවහිරයක් තියෙනවද කියලා. ගයාන් මන්ත්‍රීතුමා කිව්වා සමන් පාර දෙපැත්තෙම තියෙන්නෙ එයාගෙ ඉඩම. බොරු කියනවා නෙවෙයි සභාපතිතුමා අපි සාධාරණ ඉල්ලීම් කරල ඇති. එහා පැත්තත් එයාගෙ ඉඩම, පාරට අවහිරයක් නැහැ. ඒ ඉල්ලීම තමයි සභාපතිතුමා කළේ. සභාපතිතුමා,මේක නොමග යවනවා. ගරු සභාපතිතුමා මම ඉල්ලීමක් කළේ. කණ්ඩායම් රැස්වීම්වල කියන්න ඕන දේවල් මම මෙතන කියන්නෙ නැහැ. නමුත් සභාපතිතුමා ඒ කණ්ඩායම් රැස්වීමෙදිත් සභාපතිතුමා මොකක් හරි ප්‍රශ්නයක් දාන කොට ඒ දේවල්වලින් රිංගන්න වෙන පැත්තකට හරවනවා. මෙතනදිත් මම

ඉල්ලීමක් විතරයි ගරු සභාපතිතුමා කළේ. ගයාන් මන්ත්‍රීතුමාගෙනුත් අහල තමයි මම ඉල්ලීම කළේ. මේ දූරියන් ගහේ ප්‍රශ්නෙ වෙන පැත්තකට හරවන්න එපා. සභාපතිතුමා, මම කියන්නෙ දූරියන් ගහ කපන්න සභාපතිතුමා අත්සන් කරලා ගහ කපන්න කියලා. නිලධාරිය ගිහිල්ල ලිඛිතව කිව්වනම්, ලියුමක් යැව්වනම්, එක්කො කපන්න ඕන. නැත්නම් සභාපතිතුමා දෙගොල්ල ගෙන්නලා සමථයකට පත් කරන්න ඕන. ඒ දූරියන් ගහ ගොඩක් දුරක තියෙන්නෙ. දූරියන් ගහ කපන්න ඕන නැහැ කියන මතය මමත් කියනවා. නමුත් සභාවෙන් කළ වැරැද්ද නිසා සභාපතිතුමා දෙපැත්තම මාත් එක්ක තරහයි දැන්. ඇයි ඒක සභාවෙන් කරපු වැරැද්දක් වෙලා තියෙන්නෙ. දූරියන් ගහ කපන්න ඕන නැහැ කියන එකත් මම දන්නවා. අතු කැපුවම ඇතියි කියන එකත් දන්නවා. ඒක නිසා ඒක දිගින් දිගට මම මේක අදින්න යන්නෙ නැහැ සභාපතිතුමා. වහළ සම්බන්ධ ප්‍රශ්නෙදි ගයාන් මන්ත්‍රීතුමාගෙන් මම ඒ දේ කතා කරල අහල තමයි සභාපතිතුමාගෙන් ඉල්ලීම කළේ.

ඒ වගේම සභාපතිතුමනි, ඔබතුමා දන්නවා අනිවාර්යයෙන්ම මොන ප්‍රශ්නෙ ආවත්, අපි අයවැයට ඡන්දෙ දෙන වග ඔබතුමා දන්නවා. අපි පැහැදිලිවම සභාපතිතුමාගෙ හිත හොඳ කරන්නත්, මේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙ හිත් හොඳ කරන්නත් තමයි මම අයවැයට ඡන්දෙ දුන්නෙ. හිතට එකඟව දීපු ඡන්දයක් නෙවෙයි. ගරු සභාපතිතුමනි, ඒකත් අපේ උඩුගමට නායකත්වය දෙන උප සභාපතිතුමත් එක්ක සාකච්ඡා කරලා, ඒ වගේම අපි මෙතනට ආවෙ සභාපතිතුමා නිකන් නෙවෙයි. අපි ඡන්දෙ ඉල්ලන්න හිටපු මිනිස්සු නෙවෙයි. අපේ උප සභාපතිතුමාලා, අජිත් මන්ත්‍රීතුමාලා තමයි අපි මෙතනට ගේන්න වෙහෙසුනේ. ඒක නිසා ගෞරවයක් විදිහට අපි හැමදාම ඒ දේවල් මතක් කරනවා. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු එක්සත් ජාතික පක්ෂෙ ඉන්න ඒ සියලු දෙනාගෙම සහයෝගය මත තමයි අපි මේ ගමන යන්නෙ. එතුමන්ලා අපේ වැරැද්දක් කිව්වොත්, අපි ඒක නිහතමානීව පිළිගන්නවා. ඒක නිසා අපි මෙතනින් බැහැල යන දවසට සතුටින් බැහැල යන්න තියෙන්න ඕන. ගරු සභාපතිතුමනි, ඒක නිසා අපි ඉල්ලීමක් කරන්නෙ අපට ඡන්දෙ දීපු, නොදීපු මිනිස්සුන්ට සාධාරණයක් කරන්න කියලා විතරයි. අපි සභාවට ඇවිල්ල දැන් ලක්ෂ තුනක් හතරක් පඩි අරගෙන තියෙනවා. අපේ වෙරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ. අපිට සභාවෙන් වැඩ කරන්න දීල තියෙන්නෙ රුපියල් ලක්ෂයයි. ඔබතුමාට සල්ලි නැතුව ඇති. නමුත් ආපු වෙලාවෙත් අපි ඉල්ලීමක් කළා. ගරු සභාපතිතුමාගෙන් කරන්නෙ කාරුණික ඉල්ලීමක්. ඔබතුමා මේකෙ සභාපති. සභාපතිවරු ගොඩක් නැහැ. අපේ උප සභාපතිතුමා ඉන්නවා. ඒකනිසා ඔබතුමා ඔබතුමාගෙ බලය පාවිච්චි කරල වැඩ කරන්න. ඔබතුමා දන්නවා එක්සත් ජාතික පක්ෂය, විපක්ෂය ඡන්දෙ දෙන්නෙත් නැහැ අයවැයට. ඔබතුමා කියනවා කවදත් විපක්ෂයේ සහයෝගයත් මම අරගෙන තමයි වැඩ කරන්නෙ. අපි සහයෝගයක් ඉල්ලුවත්, විපක්ෂයටත් සහයෝගයක් දෙන්න ඕන එක ඇත්ත. නමුත් ස්ථිර වශයෙන්ම ගරු සභාපතිතුමනි විපක්ෂය කවදාවත් අත උස්සන්නෙ නැහැ අයවැයට. අපේ 14 දෙනා තමයි කරන දෙයක් කරන්නෙ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ යේ මන්ත්‍රීතුමියත්, මන්ත්‍රීවරු දෙපොළත්, අනිවාර්යයෙන්ම සහයෝගය දෙනවා. දැන් අපට බය නැහැ. ප්‍රශ්නෙ ඉවරයි. ඒක නිසා ඉල්ලීමක් කරන්නෙ. ඒ මන්ත්‍රීවරු තුන් පොළටත්, අපිටත්, විපක්ෂයටත් දෙන සහයෝගයක් දෙන්න. නමුත් සල්ලි තියෙනවනම් අපට වැඩක් කරන්න පිංසිද්ද වෙයි පුංචි ගානක් හරි දෙන්න. පාරක් ජේ.සී.බී. කරන්න. සිලින්ඩර් ටිකක් දාගන්න. සභාපතිතුමා, නාගොඩ මන්ත්‍රීවරුන්ටත් සලකන්නෙ නැහැ කියන එක අපි දන්නවා. ඒ මන්ත්‍රීවරුත්, මන්ත්‍රීතුමියන්ලත් ඔබතුමාට ඡන්දෙ දුන්නෙ සහෝදර මන්ත්‍රීවරුන්ගෙ හිත් දිනාගන්නත්, ඔබතුමාගෙ හිත දිනාගන්නත් විතරයි. එහෙම නැතිව ඕනනම් දෙන්නෙක් තුන්දෙනෙක් දෙන්න ඇති. ඒ මන්ත්‍රීවරුන්ටත් වැඩකරල නැහැ.

අපි අවංකවම අයවැයට විරුද්දයි. ඒක නිසා ගරු සභාපතිතුමනි, අවංකවම ඔබතුමාට අපි කවදත් ඡන්දෙ දෙන්නෙ නැහැ කියලා අපි කිව්වට, අපේ උප සභාපතිතුමාගෙ නායකත්වයෙන් අපි තීරණය කළා. උප සභාපතිතුමත් එක්කත් සාකච්ඡා කරලා. අපි අනිවාර්යයෙන් ඡන්දෙ දෙනවයි කියලා. පක්ෂයක් විදිහටත් සභාපතිතුමාගේ වැඩපිළිවෙල ඉස්සරහට ගෙනියන්නත්, අපට ඕනකම

තියෙන්නෙ අපට ජයග්‍රහනය කරන්න නම්,  ඔය සභාපතිතුමා තියා ගන්න තමයි. ඒක නිසා අපි අයවැය පරද්දන්නෙ නැහැ. තරංග මන්ත්‍රීතුමා ඡන්දෙ ගැන පොඩි ඉගියක් කළා. නමුත් අපි තීරණයක් ගත්තොත් ඒ තීරණය හරියට ගන්නවා. සභාපතිතුමාගෙ ජයග්‍රහනය වෙනුවෙන් අනිවාර්යයෙන් ස්ථිර වශයෙන්ම අපි අයවැයට මෙතෙක් කල් ඡන්දය දුන්නා. ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නෙ සභාපතිතුමනි ඊලග අයවැය වෙනකොට නම් මේ අසාධාරණය වෙන්න තියන්න එපා. අපි දිගින් දිගටම අත් උස්සන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. වෙරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ අපි දිගින් දිගටම මොන ප්‍රශ්නෙ ආවත් හරි තැන හිටගන්නත්, වැරදිතැන වැරදියි කියලා පෙන්නන්නත්, අපට පුලුවන්. ඒකයි මම කවදත් කියන්නෙ මෙතනට ආවෙ මම පොහොට්ටුවෙ ඡන්ද වලින් විතරක් නෙවෙයි. හැම පක්ෂයකම ඡන්ද වලින් මම මෙතනට ආවා. මම මෙතනට ආවට පස්සෙ මම ගොඩක් දේවල් ඉගෙන ගත්තා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන්. තව ඉගෙන ගන්න දේවල් තියෙනවා. ඒක නිසා අඩුපාඩුවක් දැක්ක තැන මොන මන්ත්‍රීවරයා, සභාපතිතුමා තරහ වුනත් අනිවාර්යයෙන් වැරදි තැන කියල දෙනවා සභාපතිතුමා. හරිතැන හිට ගන්නවා. ඒක තමයි ඇත්ත. ඒක නිසා ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ සභාපතිතුමා. මේ දූරියන් ගහේ ප්‍රශ්න ටික නිදහස් කරල දෙන්න. මම ඡන්දෙ නොඉල්ලුවත් කොතලාවල ඉන්න ඕන. ඒක එකක්. ඒ වගේම අද කිව්ව වගේ අයවැය ඉවරයි. සභාපතිතුමා ඒ වගේම විදුලි කාර්මිකයන් ඉතා වෙහෙස මන්සි වෙලා ඊයෙ හැන්දෑ වෙනකම්ම ගොඩක් දුරට විදුලිය සකස් කරල දුන්නා. ඒකත් මේ වෙලාවෙ මතක් කරනවා. පාර බැදිගහන ඒ සියලු දෙනත් කම්කරුවන් සියලු දෙනාම ඉතාමත් උනන්දුවෙන් අපේ වැඩේ වැඩටික කරලා දෙනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, මට පාර බැදි ගහගන්න විතරක් නැවත වාරයක් මතක් කරන්නෙ දවස් තුනක් හතරක් දෙන්න. සභාපතිතුමා මේ සභාවෙ අපිට වැඩක් කරන්න දෙන්නෙ නැති කොටසකුත් ඉන්නවා. කරනවට අකමැති කොටසකුත් ඉන්නවා. ඒ ගැටලුවලට සභාපතිතුමා අහුවෙන්න එපා. මනාප ක්‍රමයකට ආවොත් සභාපතිතුමා උඩුගම ඕන තැනක අපි අරගෙන යනවා. මේ නාගොඩ අය ජයග්‍රහනය කරන්න දෙන්නෙ නැහැ. ඒකනිසා ඒ ගැනත් මතක් කරමින් සභාපතිතුමාගේ කාරුණික අවදානය යොමු කරන්න ජුලියන් ගස් දෙක පිළිබඳව මගේ කොට්ඨාසයේ පාර බැදි ගහන  ප්‍රශ්නය විසදන්න. සභාපතිතුමා අන්තිම මොහොතෙ හරි අයවැය පෙනි පෙනී හරි අයවැයට බලාපොරොත්තුවෙන් නෙවෙයි. මගේ කොට්ඨාසෙ ලොකු දේවල් ටිකක් කළා. ඒ ගැන නිහතමානීව සභාපතිතුමාට ස්තූතිය, ගෞරවය පුද කරමින් මම නිහඩ වෙනවා. ඒ වගේම අපේ ජයවීර මන්ත්‍රීතුමාගෙ සහෝදරියගෙ පුතාගෙ අවමංගල උත්සවයට අපට යන්න වුනේ නැහැ. සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ. තරංග මන්ත්‍රීතුමාල අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හැමදාම ඉල්ලීමක් කළා. මළ ගමක් සිදු වුනොත් සභාව හරහා දැනුවත් කරන්න කියලා. එක නිසා එහෙම කිසිම දෙයක් අපි දැනුවත් නැහැ. ඒ සම්බන්ධයෙන් සමාව අයදිනවා. ඒක නිසා අපේ සභාවෙ මන්ත්‍රීවරුන්ගෙ මළ ගෙවල් ටිකටවත් යා ගන්න බැරි වුනා.

ඒක නිසා සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නෙ. නිලධාරි මෙච්චර ඉන්නවා. පුංචි දේවල් ටිකවත් සකස් කරන්න. මේ විවේචන කරනවා නෙවෙයි සභාපතිතුමනි. අපිට නවක මන්ත්‍රීතුමියක් ආවා. එතුමියගේ හිටපු මන්ත්‍රීතුමිය ඇත්තටම ඉතාමත් හොදින් පක්ෂය වෙනුවෙන් සභාව වෙනුවෙන් වැඩකටයුතු කළා. මම හිතන්නෙ සුභාෂි මන්ත්‍රීතුමියත් එක්ක සහයොගෙන් වැඩ කරාවි. ඔබතුමිය සහයෝගෙන් වැඩකටයුතු කරන්න. අපේ මන්ත්‍රීතුමියට සහයෝගය ලබා දෙන්න. මොකද අපේ මන්ත්‍රීතුමියගෙ ඒරියා එක තියෙන්නෙ. ඔබතුමියත් බලය පාවිච්චි කරලා සියලු දෙනාම වැඩ කරන්න කියලා ගෞරවණීය ඉල්ලීම කරමින්, මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙ කතාවෙදි සඳහන් කල ඔය එක දෙයක්වත් කළේ අයවැයට මනාපය ප්‍රකාශ කර ගැනීමේ අවශ්‍යතාවයකට නෙවෙයි. කල යුතු දේවල් නිසා.

ඒ වගේම දූරියන් ගහ පිළිබඳ ප්‍රශ්නයේදී වර්තමානය වන විට සියළුම දේ සම්පූර්ණ කර ගෙන, ගිය සෙනසුරාදා ගහ කපනවා කිව්වා. මම හොයලා බලන්නම්. අනිත් ගහේ වෙන ප්‍රශ්නයක් තියෙනවා

කැටගොඩ දකුණ පාරට අවහිර වන සේ වහලක් ගැසීම සම්බන්ධව නිලධාරියගේ වාර්තාවේ වහල පාරට වැඩියි, ඒ නිසා වහල අයින් කරන්න කියලා නිර්දේශ කරලා තියෙනවා. නමුත් ඔබතුමා ඇවිල්ලා මාත් එක්ක ඒක එපා කියලා කිව්වා. එය නිලධාරියාගේ නිර්දේශයට පටහැනි නැද්ද?

ගරු මන්ත්‍රීතුමා ඔයාලගේ විවේචන සාධාරණයි. සභාවට සල්ලි තියෙනවනම් දෙනවා. මට ගෙදර ගෙනියන්න නෙවෙයි. සියලු දෙනා සාධාරණව හිතන්න. ගරු මන්ත්‍රීතුමා මමත් 2002 ඉදල සභාවෙ ඉන්නවා. අපිත් එදා සිට සාධාරණ යෝජනා ඉදිරිපත් කරනවා. මන්ත්‍රීතුමාලා කතා වෙනවා. මේ අයවැය වාර්තාවෙ යෝජනා ගැන. 2002 ඉදලා සභාපතිවර් තිදෙනෙක් සමඟ සිටියා. අපි ඉදිරිපත් කල එක යෝජනාවක් ඉටුවෙලා තියෙනවද?

ඒ වගේම ඔබතුමා සඳහන් කල රංජිත් ජයවීර මන්ත්‍රීතුමාගේ සහෝදරියගේ පුතනුවන්ගෙ මළ ගෙදර කවුරුවත් දැනුවත් නැහැ මමත් ඉස්කෝලෙ ළමයෙක් නිසා ගියා. ගියාට පස්සෙ ජයවීර මන්ත්‍රීතුමා ඉන්නවා. එතකොට තමයි මමත් දන්නෙ.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සභාවෙන් අවසරයි. ඇත්තටම අපේ සමන් මන්ත්‍රීතුමාගෙ දීර්ඝ කතාවෙදි යම් සඳහනක් වුනා මගේ නමත් කියලා. ඒ ගැන යම් වචනයක් කතා කරන්න ඕන. ඡන්දෙ ගැන පොඩි ඉගියක් කළා කියලා. මොකද එක මම හිතන්නෙ අපේ සභාවෙ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු මොන වගේ අවබොධයකින් ඉන්නවද දන්නෙ නැහැ. මම කෙලින්ම කතාව කියන්නම් ගරු සභාපතිතුමනි, අපි දැන් අපේ නන්දන මන්ත්‍රීතුමාලා මේ සභාවෙදි මුලින්ම කතා කළා. පළවෙනි සභාවෙදි, දෙවනි සභාවෙදි හා තුන්වෙනි සභාවෙදි තත්වෙ ගැන. කෙලින්ම කතා කරනවනම්, ගරු සභාපතිතුමනි මගෙන් සමන් මන්ත්‍රීතුමා දවසක් කතා කරලා ඇහුවා. මොකද ඔබතුමාල දැන් අයවැයකුත් එනව නේද කියලා. එතුමා ඉන්නවනම් වැඩිය හොදයි. කියන්න ඕන ටික කියලා එතුමා ගියා මම හිතන්නෙ. මගෙන් ඇහුව මොකක්ද ඔබතුමාලගෙ අදහස කියලා. මගේ පුද්ගලික අදහස ඇහුවම මම කිව්වා. ඔබතුමාල 15 දෙනාගෙන් හොඳම කෙනා තමයි සභාපති වෙලා ඉන්නෙ. මම ඒක අදත් කියනවා. හෙටත් කියනවා. මේ සභා වාරෙදි මම ඒ ගැන කියන්න කණගාටු වෙන්නෙ නැහැ. මොකද ඒ කොට්ඨාස 15 වේ ඉන්න 15 දෙනා අතරින් සුදුසුම කෙනා සභාපතිවරයා විදිහට පත්වෙලා ඉන්නවා. එතුමා යම් අපහසුතාවයකට පත් වෙනවා නම්, තීරනාත්මක අවස්ථාවකදි අපි දෙන්න ඕන යුතුකම අපි කොහොමත් කරනවා. මොකද අපි කාලයක් තිස්සේ 2011 ඉදලා මමත් සභාව නියෝජනය කරන නිසා මම දන්නවා. අනිත් 14 දෙනා ගැන සහ පුද්ගලිකව ඒ සියලුම දෙනාත් සමග අපි එකඟයි. නමුත් එතුමන්ලා සමඟ පුද්ගලික අමනාපයක් නෙවෙයි. මම මේ කියන්නෙ ඇත්ත කතාව. අපි මේ ප්‍රසිද්ධියෙ එතුමට කියපු කතාව තමයි මම මේ ප්‍රසිද්ධියෙ කියන්නෙත්. ඒ 15 දෙනා අතරින් අපි ඔබතුමාට යම් සැලකිල්ලක් ගෞරවයක් විශ්වාසයක් තියෙනවා. ඉතිං ඒක දේශපාලන වශයෙන් නෙවෙයි. ඔබතුමත් දේශපාලන වශයෙන් අපට උදවු කරන්නෙ නැහැ. පුද්ගලික අපේ ඥාති සම්බන්දකම්, හිතවත්කම් ඒ ආකාරයෙන්ම තියෙනවා. නමුත් ඔබතුමා සමහර වෙලාවට කියලා තියෙනවා. මේ කොට්ඨාසෙ වැඩක් කිව්වට පස්සෙ කොට්ඨාසෙ මන්ත්‍රීවරය හරහා එන්න ඕන කියලා. නමුත් එතනදි අපි එකග වෙන්නෙ නැහැ. අපි ඔබතුමා ගැන තියපු විශ්වාසය මම හිතන්නෙ ඔබතුමාගෙ දේශපාලනය නිසා නැති වෙලා. ඒ කියන්නෙ පක්ෂ දේශපාලනය නිසා. ඔබතුමා මෙතනට පත්කරපු ඒ දේශපාලන නායකත්වය. ඔබතුමා 2002 වර්ෂයේ සිට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා සභාපති කළේ කොන්ද කඩලා. මම එහෙම කියන්නත් මැලි වෙන්නෙ නැහැ. මොකද

කෙලින් තීරණ ගන්න හොඳ, විපක්ෂයේ ඉන්න කාලෙ, ආණ්ඩු පක්ෂයේ ඉන්න කාලෙ, මන්ත්‍රීවරයෙක් විදිහට ඉන්න කාලෙ ඔබතුමා කෙලින් කතා කරපු කෙලින් වැඩ කරපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ඉතිං එතුමා මේ සභාපති පුටුවෙ වාඩි වුනහම එතුමගෙ ඒ තිබුන කොන්ද අපි දැක්කෙ නැහැ. වර්ථමානය වෙන කොට යම් යම් කොට්ඨාසවල යම් යම් යෝජනා, ඉල්ලීම් එන කොට එතුමාගෙ අදහස තමයි ඒ කොට්ඨාසෙ ඉන්න මන්ත්‍රීවරයා හරහා ආවොත් මට කරන්න පුලුවන් කියන එක. නමුත් මම මේ වෙලාවෙ ඉතාමත් සතුටු වෙනවා. 2011 වර්ෂයේ මම පළවෙනි ඡන්දෙට ඉදිරිපත් වුන වෙලාවෙ, මම විපක්ෂ නායකවරයා විදිහට පත් වුනේ විලේගේ සභාපතිතුමත් එක්ක. එතුමා ගැනත් ඔබතුමන්ල කවුරුත් දන්නවා. එතුමගෙ එක හොඳ දෙයක් මම මේ අවස්ථාවෙ කියන්න ඕන. කොච්චර අඩුපාඩු, වැරදි තිබුනත් එතුමා යම් තීරණයක් ගත්තොත් ගත්තා. ඒක වාසි හෝ අවාසි මත පස්සෙ තීරණය වෙනස් කළේ නැහැ. ඒක දේශපාලන වශයෙන් හරි. එතුමා සමහර වෙලාවට විපක්ෂෙ කෙනාටත් උදව් කරන්න ඕනනම්, තීරණය කළොත් ඒක කළා. ඒක සමහර විට ඒ කාලෙ හිටපු ඇමතිවරු ආසන සංවිධායකවරු විරුද්ධ වුනයි කියලා එතුමා කොන්දක් ඇතුව වැඩ කළා. නමුත් වර්ථමානය වනවිට ඒක යම් යම් අවස්ථාවලදි වෙනස් වෙලා. දැන් ඔබතුමාගෙ කණ්ඩායමේ සමන් මන්ත්‍රීතුමාගෙ කතාවෙන්ම දැන ගත්තා. ගත්තු තීරණ වෙනස් කිරීම තුලින්, ඒ මන්ත්‍රීවරයට පවා ගමේ ඉන්න බැරි තත්වයක් පත්වුන කතාවක් තමයි එතුමා සඳහන් කළේ. ඇත්තටම ඒක ඇත්ත. ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවෙදි ඉල්ලා සිටින්නෙ. ඔබතුමා යම් යම් නිලධාරි හරහා හරි එන නිර්දේශයන් මත ගන්න තීන්දු වෙනස් කරන්න එපා. මේවට සමන් මන්ත්‍රීතුමා කිව්ව වගේ දේශපාලනය අදාල වෙන්නෙ නැහැ. දැන් මේ දූරියන් ගහේ කතාවට දේශපාලනයක් ඈඳ ගත්තා. නමුත් අපි ඒක ගැන මම මේ සභාවෙ එක වචනයක් කතා කළේ නැහැ. නමුත් ගමට යන්නෙ ඒ පනිවිඩය නෙවෙයි. ඕන්න ඔය ගොල්ලගෙ මන්ත්‍රීවරු ඉන්නවා කතා කළේ නැහැ කියලා. ඇත්තටම ඒ ඉල්ලීම් ලේඛනයේ සමුපූර්ණ පිටපතක් මගේ අතෙත් තියෙනවා. නමුත් අපේ සමහර මන්ත්‍රීවරුම ගිහිල්ලා, මම කියන්නෙ නැහැ පුද්ගලයො කවුද කියලා. ඒ කියන්නෙ අපි විශ්වාස කරන අවිශ්වාස කරන ඒ කවුරු හෝ අය ගිහිල්ලා කියනවා. මෙතන ඔබතුමන්ලගෙ මන්ත්‍රීවරු කතා කළේ නැහැ. නමුත් මෙතන අපි දේශපාලනයක් නෙවෙයි. එතන සාධාරණ ඉල්ලීමක් තියෙනවනම්, නිර්දේශයක් තියෙනවනම් ඒක ක්‍රියාත්මක කරන්න. ඔබතුමා ඒකට පස්සෙ කොන්දේසි දාන්න යන්නත් එපා. වෙනස් කරන්න යන්නත් එපා කියල ගෞරවණීය ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමා විදිහට එතකොට ඔබතුමාට මම හිතන්නෙ ඉතාමත් පහසුවෙන් මේ කාර්යයන් කරගෙන යන්න පුලුවන් වේවි.

ඒ වගේම සභාපතිතුමනි, මේ අයවැයට මේ පාර අපේ පොඩි අදහසක් තිබුනා. ඔබතුමාට එහෙම විරෝධතාවයක් ප්‍රකාශ නොකර ඉන්න. මම හිතන්නෙ ඔබතුමාගෙ කණ්ඩායමේ ඉන්න ඔබතුමාගෙම මන්ත්‍රීවරු පිරිසක් තමයි ඒ තත්වෙ නැති කරන්නෙ. අපි ඕක දැකලා තියෙනවා. හැම අවස්ථාවකදිම වැදගත් තීරණාත්මක අවස්ථාවලදි ගරු සභාපතිතුමාගෙ අදහස ඔබතුමාලගෙ පක්ෂෙ කණ්ඩායමේ අදහස වෙනස් කරවන්නෙ ඒ අය. අපි මෙතන ඒක අදත් දැක්කා. අපි විනාඩි 10 ක් 15 ක් සද්ද නැතුව ඉන්න වෙලාවෙ ඒ ප්‍රශ්නෙ සහ උත්තරේ එතන තිබුනා. ඊට පස්සෙ තමයි අපේ සහබන්දු මන්ත්‍රීවරයා ඒ කතාව පැහැදිලි කිරීමක් කළා. මෙහෙම මේක නිකන්ම සම්මත වුනොත් ඒක විපක්ෂයක් විදිහට අපට සතුටු වෙන්න බැහැ. නමුත් එතුමා විරුද්ධ වෙන්න නෙවෙයි හැදුවෙ. ඒ ගැන යම් පැහැදිලි කිරීමක් කරන්න. නමුත් මේ යම් යම් මන්ත්‍රීවරු මැදට පැනලා ඔබතුමා අපහසුතාවයට පත්කරන්න හරි වෙනත් දෙයක් ක්‍රියාත්මක කරන්න උත්සහ කළාදෝ කියලත් අපට හිතෙනවා. ඒ කොහොම වුනත් කමක් නැහැ. ඔබතුමාල සමහර වෙලාවට කණ්ඩාම් රැස්වීමෙ කතා කරන්න ඕන දේවල් මෙතන කතා කරන අවස්ථාත් අපි දැකලා තියෙනවා. ඒක මම හිතන්නෙ සභාවක් විදිහට ගරු සභාපතිතුමනි, මෙතන අපි පක්ෂවලින් තමයි අපි ඡන්දෙ ඉල්ලුවෙ. අපි එක එක්කෙනා තම තමන්ගෙ දේශපාලන පක්ෂවලින් ඡන්දෙ ඉල්ලලා අපි මෙතනට ඇවිල්ල ඉන්නෙ සභිකයො විදිහට. ඒ අය අතරින් ඔබතුමා සභාපතිවරයා. සුසන්ත මහත්මා උප සභාපතිවරයා. අනිත්

සියලුම දෙනා සභිකයො. එතන යම් යම් ජොෂ්ඨත්වය මත හරි එහෙම අසුන් පැනවීමක් කරලා තියෙනවා. ඉතිං ඒක සඳහා සහභාගි වෙනවා. නමුත් මෙතනදි කියන්න එපා මේ පක්ෂෙ මන්ත්‍රීතුමා විපක්ෂෙ මන්ත්‍රීතුමා කියලා. ඔබතුමාගෙ මම අර කලින් කියපු කතාව තමයි. ඔබතුමාට ඒ හයියක් තිබුනනම් ඔබතුමාට මේ සභිකයො සියලුම දෙනාට එකහා සමානව ඒ කටයුතු කරන්න පුලුවන්. දැන් මෙතන අපටනම් ලක්ෂයක් දුන්නා. මගේ කොට්ඨාසෙනම් මෙහෙම කළා. නමුත් ගරු සභාපතිතුමනි අපට කොට්ඨාසයක් නැහැ. අපි හත් දෙනයි එක්සත් ජාතික පක්ෂෙන් සභාවට ඉදිරිපත් වෙලා ඇවිල්ල ඉන්නෙ. අපි හත්දෙනා ඒ කටයුතු කරනවා කොටස් බෙදාගෙන. අපි සභිකයො විදිහට මෙතනට ආවම ඔබතුමාට පුලුවන් ඉතුරු 26 දෙනාම වෙනුවෙන් ඒ තීරණය ගන්න. ඒක ඔබතුමාගෙ පක්ෂෙ අයට සලකන්න නම් ඔබතුමාලගෙ පක්ෂෙන් අරමුදල් ගෙන්න ගන්න. මේක සභාවෙ පොදු අරමුදල් රටේ සල්ලි. මේ සල්ලිවලින් අපි වැඩ කළත් අපේ පුද්ගලික මගේ ගෙදර වැඩක් කරගන්න. බිත්තියක් කපරාරු කරන්න. වහලක් ගහන්න. මම සල්ලි ඉල්ලන්නෙ නැහැ. මම ඉල්ලන්නෙත් මගේ ගමේ පොදු වැඩක් සඳහා. ඉතිං ඒ සඳහා මම හිතන්නෙ ඔබතුමන්ලට හයියක් තියෙනවා එහෙම කරන්න. නමුත් ඔබතුමාලට තියෙන ඉහල නායකත්වය සහ මේ ඔබතුමාගෙ ඉන්න කණ්ඩායමේ අයගෙ විරෝදතාවයන් නිසා මම හිතන්නෙ ඒ ආසන සංවිධායකවරු හරි, ඔබතුමාගෙ පක්ෂෙ ඉහළ නිලධාරීන් හරි, ඔබතුමාගෙ පත්කිරීම කරල තියෙන්නෙ ඔබතුමාට සීමා පනවලා. ඒ නිසා ඔබතුමා අනිත් 14 දෙනා දිහා බලලා. ඒ දේවල් ක්‍රියාත්මක කරන්න පසුබට වෙනවා. ඒක හින්දා මම මේ අවුරුද්දෙවත් ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අපි අර එදා දැකපු 2002 වර්ෂයේ සිට දැකපු මන්ත්‍රීවරයනම් ඔතන වාඩි වුනේ. ඔබතුමාට හැකියාව තියෙන්න ඕන. මේ සභාවෙ සභාපතිවරයා මම. මට ඕනදේ මට ක්‍රියාත්මක කරන්න පුලුවන්. හැබැයි මම කියන්නෙ නැහැ අසාධාරණ දෙයක්. අපේ පක්ෂෙ අරමුදල් තනන්න නෙවෙයි. එක්සත් ජාතික පක්ෂෙ නඩත්තු කරන්න නෙවෙයි මම කියන්නෙ. මෙතන ඔබතුමා වගේම ජොෂ්ඨ කාලයක් මේකෙ හිටපු මන්ත්‍රීවරු විදිහට ඇවිල්ල ඉන්න අයගෙ ඉල්ලීම් වෙනුවෙන් කටයුතු කරන්න. මෙතන සමහර මන්ත්‍රීවරුන්ගෙ කතාවෙදි කිව්වා. ඔබතුමා මේ විපක්ෂ යේ අයටත් ඕන තරම් ඒ විදිහට උදවු කරනවා වගේ හැඟීමක්. නමුත් අපිනම් ඔබතුමාගෙන් සත පහක වත් ඒ වගේ ප්‍රතිපාදනයක් අරගෙන නැහැ. අපි යම් මුදලක් වැඩක් කළානම්, අපි පළාත් සභාවෙ මන්ත්‍රීවරයෙක් ගෙන් හරි මුදල් ගෙනැල්ල තමයි කළේ. නමුත් අපි ගෙනාපු මුදලටවත් අපිට ලැබිල නැහැයි කියන එක තමයි මම මේ අවස්ථාවෙ කියන්න ඕන. මට මතකයි එකම අවස්ථාවක අපි රුපියල් 50000 ක මුදලක් ලයිට්වලට ගෙනාපු අවස්ථාවෙ, රුපියල් 10000 ක වත් 15000 ක වත් ලයිට් හදන්න ප්‍රතිපාදන අපි හත් දෙනාටම දීලා නැහැ. ඒ කියන්නෙ අපේ ඉල්ලීමකට, අපි කණ්ඩායමක් විදිහට අපි මුදල් ගෙනැල්ලවත් අපට ප්‍රතිපාදන ලැබුනෙ නැහැ. අද වුනත් අපේ මන්ත්‍රීවරයෙක්ගෙ රුපියල් 22500 ක ඇස්තමේන්තුවක් කියවුනා. ඔබතුමන්ලා මේ සෙල්ලම් කරන්නෙ පළාත් සභාවෙ සහ මේ රජයේ සල්ලි තමයි. නමුත් මේ සභාවෙ පොදු අරමුදල ගැන කොහොම නමුත් අපි කොහෙන් හරි සල්ලි හොයල දීලවත් ඒ කටයුත්ත ඒ ආකාරයෙන් කරන්න ඔබතුමාලගෙන් සහයෝගය ලැබිල නැහැ. අන්න ඒකයි මම කියන්නෙ ඔබතුමාගෙ කොන්ද කඩල තමයි මෙතනට පත්කරල තියෙන්නෙ. මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි, අනාගතේදිවත් ඔබතුමා බලතල තියෙන සභාපතිවරයෙක් විදිහට ඉදිරි අවුරුද්ද සහ ඒ ඉතිරි කාලසීමාව සාධාරණව, හිතට එකඟව ඔබතුමා අපි දන්නවා පුද්ගලිකව හොඳම මහත්මයෙක්. මම ඒකයි අර ඉස්සෙල්ල කිව්වෙ 15 දෙනා අතරින් සුදුසුම කෙනා සුදුසු තත්වෙට පත්වෙලා ඉන්නවා. ඔබතුමාගෙන් මම අනාගතේදි යමක් බලාපොරොත්තුවෙන් නෙවෙයි කතා කරන්නෙ. එදා අතීතයෙදි දැකපු කෙනා සභාපතිවරයා විදිහට ඉන්න වෙලාවෙ, ඒ සඳහා සාධාරණ මැදැහත් වීමක් කරලා, ඔබගේ තනතුරේ සාධාරණය කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒක මට විතරක් නෙවෙයි ජනතා විමුක්ති පෙරමුණේ හෝ වෙනත් පක්ෂෙක වෙන්න පුලුවන්. සියලුම මන්ත්‍රීවරු වෙනුවෙන් තමයි මම මේ ඉල්ලීම කරන්නෙ. අද ඔබතුමා ඔතන හිටියා. දැන් මට මතකයි අපේ සහබන්දු මහත්මය අජිත් මහත්මය ඔය

තනතුරේ ඉඳල ආයිමත් ඉස්සරහ වාඩි වෙලා ඉන්නවා. නමුත් ඔබතුමාට ලබන වාරෙදි ඕතන ඉන්නත් වෙන්න පුලුවන්, ඉස්සරහ ඉන්නත් පුලුවන්. නොඑන්නත් පුලුවන්. කවුරු ඕතනට පත්වේද දන්නෙ නැහැ. නවක මන්ත්‍රීවරු පත්වෙන්න පුලුවන්. කොහොම හරි අපි සාධාරණ දෙයක් එක දවසකට හරි හරි දෙයක් කළොත් ඒක මම හිතන්නෙ සදාකල් සතුටු වෙන්න පුලුවන්. ඒ ගැන මම ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ නිසා තමයි අපට අද වුනත් විපක්ෂෙ විදිහට යම් විරෝධතාවයකට ඡන්දය ප්‍රකාශ කරන්න වුනේ. ඔබතුමාගේ කණ්ඩායමේ පිරිසගේ ක්‍රියාදාමයන් නිසා බව නැවතත් මේ අවස්ථාවෙ නැවතත් සිහිපත් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, කොරෝනා සහන කමිටුව ගැන කතා කළා. මම හිතන්නෙ ඔබතුමා ප්‍රාදේශීය ලේකම්වරයාත් එක්ක කතා කරන්න. ඒ වගේ අවස්ථාවක ඒ කොට්ඨාසෙ සියලුම මන්ත්‍රීවරුන්ට ඒ ආරාධනය කිරීම කරනවනම් සුදුසුයි කියලා. මොකද සමහර කොට්ඨාසවල ඒක එහෙම වුන බව දැනුනා. වැදගත් මන්ත්‍රීවරු ඉන්න කොට්ඨාසවල ඒක ඒ ආකාරයෙන් වුනාට සමහර කොට්ඨාසවල ඒ සඳහා බලපෑම් ඇතිවෙන්න ඇති. අපි දන්නෙ නැහැ. අපි ප්‍රාදේශීය ලේකම්තුමියට ඒක චෝදනාවක් විදිහට මම මේ අවස්ථාවෙ ඉදිරිපත් කරනවා. ඒ ගැන මේ සභාවෙ කතා වුනා කියලා චෝදනාව ඉදිරිපත් කරන්න. ඒ වගේ මහජන නියෝජිතයන් ගෙන් සැදුම්ලත් කමිටුවලට ඒ සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ගෙන්වන්න. එහෙම නොගෙන්නුවනම් ඒ ගැන සොයා බැලීමක් කරන්න කියලා මම මේ අවස්ථාවෙදි ඒක ප්‍රාදේශීය ලේකම්වරයාට චෝදනාවක් විදිහට ඉදිරිපත් කරනවා. ඉදිරියෙදි ඒ කටයුතු එසේ සිද්ද නොවෙන්න කියලා ඉල්ලා සිටිනවා. අවසාන වශයෙන් අද දින මම හිතන්නෙ මේ සභාවාරයට අලුත් මන්ත්‍රීවරියක් පැමිනිලා සිටිනවා. එතුමියත් ඉතාමත් සාදරයෙන් අපි අපේ කණ්ඩායම වෙනුවෙන් පිළිගන්නවා. ඒ වගේම ගරු අපේ හිතවත් ජයවීර මන්ත්‍රීතුමාගේ සහොදරියගෙ ඒ මළගම අපි ඇත්තටම දැනගත්තෙ නැහැ. ඒ ගැනත් අපේ සාතිශය සංවේගය ප්‍රකාශ කරමින්, මම මේ අවස්ථාවෙ නිහඩ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු නොවුනත් මතු වෙච්ච ප්‍රශ්න කීපයක් තිබුනා. එකක් තමයි අපේ රජය මගින් ක්‍රියාත්මක කරන, සෞභාග්‍යමත් ගෙවත්ත පිළිබඳව. මේ වෙලාවෙ දීර්ඝ වශයෙන් කතා වුනා. එහිදි ගෙවතු කීපයක් පමණයි තෝරගත්තෙ කියන එක අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා සඳහන් කළා. මේ වැඩපිළිවෙල ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රජයේ දැවැන්ත වැඩපිළිවෙලක් හැටියට, සෑම ග්‍රාම නිලධාරී වසමකම මේ කටයුත්ත ක්‍රියාත්මක වෙනවා. පැහැදිලිවම දැනට ගෙවතු වගා කරන අය ශක්තිමත් කරීම සඳහා තමයි, මේ වැඩපිළිවෙල සූදානම් කරල තියෙන්නෙ. ඒ හරහා මේ වැඩපිළිවෙල ග්‍රාම නිලධාරී ප්‍රතිලාභීන් 50 ක්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ප්‍රතිලාභීන් 50 ක්, කෘෂි පර්යේශන නිලධාරී ප්‍රතිලාභීන් 50 ක්, ආර්ථික සංවර්ධන නිලධාරීන් ප්‍රතිලාභීන් 50 ක් වශයෙන්, පවුල් සෞඛ්‍ය සේවිකා කොට්ඨාසෙකටම දහයක් වශයෙන් තෝරා ගැනීමේ අවස්ථාව දීලා තියෙනවා. මෙහිදි කොයි වෙලාවකවත් පක්ෂ පාට බේදයක් අපි බැලුවෙ නැහැ. විශේෂයෙන්ම මේ සඳහා ග්‍රාමීය කමිටුවට අපි දේශපාලඥයින්, ඒ වගේම ගමේ ඉන්න නිලධාරින් ගෙන් සමන්විත කණ්ඩායමක් තමයි ඉන්නෙ. මේකෙ කොයි වෙලාවකවත් කොතනකවත් සඳහන් වෙලා නැහැ. පක්ෂෙ මන්ත්‍රීවරු ටික විපක්ෂෙ මන්ත්‍රීවරු සහභාගි කර ගන්න එපාය කියන එක. නමුත් අපි මේකෙදි ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී, අදාල කොට්ඨාසවල තිබෙන ක්‍රියාකාරීත්වය අනුව තමයි ඒ දේ සිදු වෙන්නෙ. ඒ නිසා මම දන්නෙ නැහැ මගේ කොට්ඨාසය තුලනම් මම කොයි වෙලාවෙත් අපේ මන්ත්‍රීතුමිය සංවර්ධන කටයුතුවලදී සහ කමිටු පිහිටුවද්දි ඒ සඳහා සම්බන්ධ කර ගන්නවා. මන්ත්‍රීතුමියත් ඒක සඳහන් කළා. අපි පක්ෂ පාට බේදයක් බලන්නෙ නැහැ. මම දන්නෙ නැහැ මගේ

වැලිවිටිය කොට්ඨාසෙ පිළිබඳව මම සඳහන් කරන්නෙ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ශ්‍රී ලංකාව තුල දීප ව්‍යාප්තව මේක කරන්න බලාපොරොත්තු වෙන්නෙ. මේ වගේ කමිටුවක් පත් කරලා. අපේ තරංග මන්ත්‍රීතුමා සඳහන් කර සිටියා. ප්‍රාදේශීය ලේකම් තුමිය දෝෂ දර්ශනයට ලක් කරලා. මම හිතන්නෙ එතුමිය පහුගිය රජය කාලය තුලත් වැඩ කොටසක් කළා. ඒ වගේම මේ රජය තුලත් එතුමිය තමයි මේකෙ නායකත්වය අරගෙන, අපේ සභාපතිතුමත් නායකත්වය අරගෙන මේ කටයුත්ත කරන්නෙ. මම මේ වෙලාවෙදි ප්‍රාදේශීය ලේකම්තුමිය පිළිබඳ වචනයක් කතා කරන්න ඕන. නැත්නම් ඒක ලොකු අසාධාරණයක් වෙනවා. මම දකිනවා මේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආපු ප්‍රාදේශීය ලේකම් වරුන්ගෙන් යම් කටයුත්තක් කතා බහ කරලා. ඒ වගේම සාධාරණව ඕන කෙනෙකුට ගිහිල්ලා කතා කරලා කර ගන්න පුලුවන් නිලධාරිනියක් හැටියට මම එතුමියව දකිනවා. ඒක පක්ෂ පාට බේදයෙන් මම සලක්නෙ නැහැ. මොනව වුනත් පුටුවක්වත් දෙන්නෙ නැත කිව්වෙ. ඒකත් කියන්න ඕන. ඒක එතුමිය නෙවෙයි ඒ වැරැද්ද කළේ. එහෙම නෙවෙයි සම්බන්ධී කරණ කමිටුවෙ පුටුවක්වත් දුන්නෙ නැහැ කියලා මම කිව්වෙ. මම ඒකත් මේ වෙලාවෙදි නිවැරදි කරනවා. මොකද මට ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් පෞද්ගලික වරප්‍රසාධ මොකුත් නැහැ. අනිත් අය වගේම තමයි. ඒ වුනාට එතුමිය රාජ්‍ය නිලධාරිනියක් හැටියට පැහැදිලි නායකත්වයක් සිදු කරනවා. ඉතිං ඒ නිසා ඒ පැල බෙදා දීමේ වැඩපිළිවලවල් වලදි මම හිතන්නෙ ඒක තමයි ක්‍රමවේදය. ඒ වගේම තමයි රංජිත් ජයවීර මන්ත්‍රීතුමා සඳහන් කළා. මේ ගමේ ටික දෙනයි තෝරගෙන තියෙන්නෙ කියලා. මේ වැඩපිළිවෙල සඳහා ඇත්තටම උනන්දුවක් දක්වන පිරිස සඳහා තමයි තෝරගෙන තියෙන්නෙ. ඒ වගේම තමයි මේකෙ කොයි වෙලාවකවත් ප්‍රාදේශීය දේශපාලඥයින්ට මේකෙ තෝර ගැනීමේ අවශ්‍යතාවයක් නැහැ. ඒ නිලධාරීන් තමයි ඒ පවුල් ප්‍රමාණය තෝරගන්නෙ. ඒවගේම ඒක පැල පමණක් නෙවෙයි. මේක දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක්. ඉස්සරහට පොල් පැල ලබා දෙනවා. ඒ වගේම ස්වීරම කුකුලු පැටව් ටිකක් ලබා දෙනවා. ඒ වගේම මත්සයන් ඒ වගේ තෝරා ගත්තු ව්‍යාපාරයන් සඳහා ඉස්සරහට ලොකු වැඩපිළිවෙලක් හැටියට මේක ග්‍රාමීයව කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මම හිතන්නෙ මේක ඉතාම හොඳ වැඩපිළිවෙලක්. මේකෙ දේශපාලනයක් නැහැ. ඒ නිසා ගමේ ගෙවතු වගාව සඳහා උනන්දු වෙන. උනන්දුවක් දක්වන. ඒ සියලු දෙනාට පැල පමණක් නෙවෙයි. යම් බීජ ප්‍රමාණයකුත් අපි ලබා දුන්නා. මම හිතන්නෙ විශාල කාර්යය භාරයක් ප්‍රාදේශීය ලේකම්තුමිය, ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ලොකු වැඩ කොටසක් ඒ සඳහා කරනවා. ඒකත් මේ වෙලාවෙ මම අගය කරනවා. ඒ වගේම පැල තවාන් පිළිබඳව මෙතන ප්‍රශ්නයක් මතු කළා. ඒ පැල තවාන් තෝරා ගැනීමත් කළේ. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් තමයි. මේ පැල සඳහා ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්, ආර්ථික සංවර්ධන සහ කෘෂි පර්යේශන නිලධාරීන් සඳහා කෘෂි කර්ම දෙපාර්තමේන්තුවෙන් තමයි ඒ විය පැහැදම් දරන්නෙ. මේ ආදී වශයෙන් කාණ්ඩ දෙකකට මේ කටයුත්ත සංවිධානය කරලා. හැබැයි මේ නිලධාරීන්ට වගකීමක් පවරලා තියෙනවා. මේ ලබා දීපු පැල පිළිබඳව. ඒ වගේම පවුල් ඒකක වශයෙන් සියලු තොරතුරු, මේ පැලේ මැරුණද, මේකෙන් ආධායම් ගත්තද, ඒ සියලු දේවල් පසු විපරමක් කරලා, ඒ නිලධාරීන් හරහා ඒ කටයුත්ත සිදු වෙනවා. ඒක කොතරම් දුරට සාර්ථක වේද අසාර්ථක වේද කියලා මම දන්නෙ නැහැ. නමුත් අපේ රජය බලාපොරොත්තු වෙන්නෙ සෞභාග්‍යාමත්, සාර්ථක ගෙවත්තක්. තමන්ගෙ ආහාරයට ගන්නා එලවළු ටික තම නිවසෙන්ම සම්පාදනය කර ගැනීමත්, ඒ වගේම ඒ නිෂ්පාදනය ගමේම තව කෙනෙකුට දීලා තමන්ගෙ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමක් තමයි අපේ මේ බලාපොරොත්තුව. ඒ නිසා මේ වැඩපිළිවෙල ඉතාමත් සාර්ථක විදිහට දැනට ක්‍රියාත්මක වෙනවා. යම් යම් අඩුපාඩු කම් තියෙනවා. මගේ කතාවෙන් පස්සෙ මේ පැල පිළිබඳව අනන්ත අප්‍රමාණ කතා කරාවි. ඒකෙදි සමහර තවාන් වලින් අසාර්ථක පැල ලැබුනා. ඒ වගේම සමහර ඒවයින් සාර්ථක පැල ලැබුනා. ඒ සම්බන්ධයෙන් ගමේ ග්‍රාම නිලධාරී ඇතුලු ආර්ථික සංවර්ධන නිලධාරී ඒ සියලු දෙනා තමයි ඒක අධීක්ෂණය කරලා ඒ කටයුත්ත කරන්නෙ. ඒ නිසා ඒ කටයුත්ත

මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. ඒ වගේම නොදුරේදීම හෙට අනිද්දා අඩු කාලයෙන් පූදින පොල් පැල දෙකක් එක නිවසකට ලබා දෙනවා. ඒ වගේ වැඩපිළිවෙලක් ඉස්සරහදි ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් මම මේ වෙලාවෙ දීර්ඝ වශයෙන් සඳහන් කරනවා.

ඊළගට සපිරි ගෙයක් පිළිබඳව සඳහන් කළා. ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමකම පොල් අතු හෝ ඒ වගේම කටුමැටි සහිත හෝ ලෑලිවලින් සකස් කර ගත්ත එක ගෙයක් තෝරගෙන, ඒ සඳහා රුපියල් ලක්ෂ හයක ආධාර මුදලක් ලබා දෙනවා. ග්‍රාමීය කමිටුව, රජයේ නිලධාරී ඒ වගේම ප්‍රාදේශීය දේශපාලඥයින් ඇතුලු ඒ සියලු දෙනාගෙන් සමන්විත කණ්ඩායමකින් තමයි ඒ ගේ තෝරගන්නෙ. ඒ ගේ තෝරා ගනීමේදී අපි කොයි වෙලාවකවත් පක්ෂ පාට බේද බැලුවෙ නැහැ. අපේ ජනාධිපතිතුමාගේ ඉදිරි අභිප්‍රාය තමයි. මේ අපේ ලංකාවේ කටුමැටි ගැසූ සහ ලෑලි ගැසූ නිවෙස්වලින් තොර සෞභාග්‍යමත් නිවසක් ලබා දීම තමයි අපේ රජයේ අරමුණ. ඒ නිසා මෙන්න මේ කටයුතු සඳහා මේ දවස්වල ලහි ලහියෙ සූදානම් වෙනවා. ඒ වගේම අපි ඒ සඳහා ඇප කැප වෙලා කටයුතු කරනවා. මගේ කොට්ඨාසෙ ගෙවල් හතරක් හැදෙනවා. ඒ වගේ සෑම ග්‍රාම නිලධාරී වසමකම එක ගෙයක් හැදෙනවා. ඒ වගේම කටුමැටි ගැසූ ගෙයක් සොයා ගැනීමට අපහසු ග්‍රාම නිලධාරී වසම් දෙකක් හෝ තුනක් තියෙනවා. ඒ නිසා මේ වෙලාවෙදි පැහැදිලිව සඳහන් කරනවා. මේ වර්ෂය අවසාන වෙන කොට ඉතාමත් සාර්ථක වැඩපිළිවෙලක් අපට ඒ කටයුතු සඳහා කරන්නට අවකාශ ශක්තිය ලැබුනයි කියලා.

ඒ වගේම අද සභාවට ඉදිරිපත් කෙරුන අයවැය සම්බන්ධයෙන් මම මේ වෙලාවෙ ඇත්ත වශයෙන්ම මට කියන්න තියෙන්නෙත් එකම දෙයයි. සභාවේ විපක්ෂව ඡන්දය දුන්නත්, පක්ෂව ඡන්දය දුන්නත් දෙකම එකයි. ඒක නිසා මේකෙ කිසි වෙනසක් වෙන්නෙ නැහැ. ඒ නිසා මේ වෙලාවෙදි අපි රජයක් වශයෙන් යෝජනා කරනවා. අපි ගරු සභාපතිතුමාට ආරාධනා කරනවා. මේ වැඩකටයුතු කරන්න. මම එදත් අදත් සඳහන් කළා. මේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල අපේ තියෙන මේ සම්පත් උපයෝගී කර ගෙන අවශ්‍ය කටයුතු කරන්න. මේ කටයුත්ත කරන්න අපට විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය නැහැ. නමුත් නිවැරදි කළමණාකාරීත්වයක් සහ නිවැරදි නායකත්යවක් මේ සඳහා ලැබුනොත් මේ කටයුතු ටික කරගෙන යන්න පුලුවන් කම තියෙනවා. ඒ සඳහා ඔබතුමාට ශක්තිය තියෙනවා. ඔබතුමාට හැකියාව තියෙනවා. ඒ නිසා අපි ඔබතුමාට මතක් කර සිටිනවා. මේ කටයුතුවලදි ඒ සඳහා නායකත්වය අර ගන්න. ඒ සඳහා අපට ශක්තියක් වෙන්න කියන ඉල්ලීම තමයි මම සඳහන් කරන්නෙ. ඒ නිසා අපේ ප්‍රාදේශීය සභාවෙ තියෙන ආදායම් තත්වය බැලුවම අපිට අයවැය සම්බන්ධයෙන් ලොකු හරඹයක් කරන්න අවකාශයක් ලැබෙන්නෙ නැහැ. මොකද අපි දුප්පත් ප්‍රාදේශීය සභාවක්. ඒ නිසා මම හිතන්නෙ අපට ආදායම් මාර්ග ගොඩක් තියෙනවා. ඒ ආදායම් මාර්ග අපට ඇහිරිලා තියෙන්නෙ. ඒ ආදායම් මාර්ග ටික නිවැරදිව සකස් කර ගැනීමේ වැඩපිළිවෙලක් අපි සකස් කර ගත්තොත් අපිට අපේ ගමන සාර්ථක කර ගන්න පුලුවන් වෙනවා. ඒ නිසා මේ වෙලාවෙදි මම නැවතත් සඳහන් කරනවා. අපි අවුරුදු දෙකහමාරක් වගේ කාලයක් ගෙවා දමලා. දැන් අපි අවසානයේ ඉන්නෙ. දැන් මේ ප්‍රාදේශීය මැතිවරණයටත් ඉතාම ආසන්න කාලයක් තමයි ඉදිරියෙදි ලංවෙන්නෙ.

ඒ වගේම තව දෙයක් සඳහන් කරන්න ඕන. අපේ සමන් මන්ත්‍රීතුමා වැරදි ප්‍රකාශයක් කළා. මම හැම සභාවකදිම ඒක කියනවා. මන්ත්‍රීවරයෙකුට ලැබෙන දීමනාව පිළිබඳව කොයි වෙලාවකවත් අවතක්සේරුවට ලක් කරලා කතා කරන්න එපා. මොකද ඒ දීමනාව ගෙවල තියෙන්නෙ සභාවට එන එකට විතරක් නෙවෙයි. මතක තියා ගන්න. මන්ත්‍රීකම කියන්නෙ, ප්‍රාදේශීය සභාවට ඇවිල්ල වාඩි වෙලා ඉදල යන එක විතරක් නෙවෙයි. ඊට එහා පරිභාහිරව සමාජය තුල විශාල කාර්ය භාරයක් කරනවා. මොකද මේක වැටුපක් හැටියට නෙවෙයි, දීමනාවක් හැටියට ගෙවන්නෙ. මොකද මේ කටයුත්ත සඳහා කැප වෙලා, ජීවිතය කැප කරල තමයි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් මේ සභා පුටුවක වාඩිවෙන්නෙ. ඒක පක්ෂද විපක්ෂද කියල නැහැ. ඒ නිසා මළ ගෙදර දානෙ ගෙදර විතරක්

නෙවෙයි. ගමේ හැම කෙනාගෙම කටයුතුවලට දායකත්වය දක්වන්න ඕන. ඒ වගේම ඒ සඳහා කැප වෙන්න වෙනවා. ඒ සඳහා තමයි මන්ත්‍රීවරයෙකුට ඔය මුදලින් ජීවත් වෙන්න තියා හිතන්නවත් අමාරු වුනත්, ශක්තිමත් වෙන්න තමයි දීමනාව ලබා දීල තියෙන්නෙ. එහෙම මතයක් නිවැරදි කිරීමක් නෙවෙයි මම කිව්වෙ. පැහැදිලිවම මම සඳහන් කරන්නෙ. මන්ත්‍රීවරයගෙ තියෙන කාර්යය භාරය ඉස්සෙල්ලම අපි දැන ගන්න ඕන. ඒ නිසා මෙහෙමයි ඔබතුමාලට අර ගොරකත් දඩ මස් කරනවයි කියන්නෙ. වැඩක් කෙරෙන කොට හොඳයි. නොකෙරෙන කොට නරකයි. අපි එහෙම නැහැ අපි කොයි වෙලාවෙත් විවේචනය කරනවා. මම හැම වෙලාවෙම කියන්නෙ. අපිට අපේ කාර්යය භාරය කරන්න ඉතාම කෙටි කාලයයි තියෙන්නෙ. ඒ කාලය තුලදි ඒක කරන්න අපි අධිෂ්ඨාන කර ගන්න ඕන.

ඒ වගේම ගිය සභා වාරෙදි ප්‍රශ්නයක් මතු වුනා. මම හිතන්නෙ අපේ කම්කරුවො ගොඩක් ඉන්නවා ඒ අය ස්ථිර කිරීම සම්බන්ධයෙන්. ඒ පිළිබඳ පෞද්ගලිකව මම මුදල් අමාත්‍යාංශෙ අපේ හිතවත් නිලධාරි කෙනෙක්ගෙන් ඇහුවා. ඒ සඳහා මේ කාර්ය සාධන බලකායේ 10000 ක් වෙන් කරල තියෙනවා. ලංකාවෙම ප්‍රාදේශීය සභාවල්වල කම්කරුවන්, ඒ වගේම රියදුරු ආදේශකයින් ස්ථිර කිරීම සඳහා මේ රැකියා දස ලක්‍ෂය වැඩපිළිවෙල යටතේ සූදානම් කරල තියෙනවයි කියන එකත් මුදල් අමාත්‍යාංශයෙන් අපට දැන ගන්න ලැබුනා. ඉන්න අය ස්ථිර කරන්න තමයි ඊට පස්සෙ කිසිම හේතුවක් නිසා ප්‍රාදේශීය සභාවට බඳවා ගන්නෙ නැහැ. කම්කරුවන් සහ රියදුරන් වෙනුවෙන් ලංකාවෙම ඒ වැඩපිළිවෙල තමයි ක්‍රියාත්මක වෙන්නෙ. ඒ නිසා මම හිතන්නෙ මේ සභාවේ හොඳ දේ හොඳයි කියන්න ඕන. නරක දේ නරකයි කියන්න ඕන. ඒ වගේම සභාව ගත්තම නාගොඩ ප්‍රාදේශීය සභාව තුල මේ වෙන කොට සමස්ථයක් හැටියට ගත්තම, වීථි ලාම්පු දැල් වෙන්න අවශ්‍ය කටයුතු සලසල තියෙනවා. ඇතැම් තැන්වල නැති වෙන්න ඇති. ඒ නිසා ඒ වෙලාවෙදි මම හිතන්නෙ ඒ කටයුත්ත මේ ප්‍රාදේශීය සභාවෙ අකුරටම මේ වෙන කොට සිදු වෙනවා. ඒ පිළිබඳව අපි ස්තූති වන්ත වෙනවා. ගරු සභාපතිතුමාටත් ඒ වීථි ලාම්පු සකස් කරන කාර්යය මණ්ඩලයට. ගොඩක් දුරට 80% වකට වැඩි ප්‍රමාණයක් මේ සභාව තුල ඒ කටයුත්ත මම හිතන්නෙ සිදුවෙමින් පවතිනවා. ඒවගේම මම කතා කිරීමෙදි කාගෙ හරි හිත් රිදුනනම්, ඒ පිළිබඳවත් මම සමාව අයද සිටිමින් විශේෂයෙන්ම අපේ පාරවල් විශාල ප්‍රමාණයක් මේ වන විට අපේ රජය මගින් කාපට් කිරීමේ වැඩකටයුතු කරගෙන යනවා. ඒවා සභාපතිතුමාගේ මූලාසන කතාවෙන් ඒ ටික සඳහන් වේවි. ඒ නිසා මේ වෙලාවෙදි අපි සභාව යම් විදිහකට මන්දගාමී විදිහකට මොන කටයුතු සිදු වුනත්, රජයක් හැටියට යම් වැඩපිළිවෙලක් මේ කොරෝනා වෛරසයත් සමඟ පොරබදන ගමන් ග්‍රාමීය මට්ටමින් ඒ කටයුත්ත සිදුවෙනවා. ඒ වගේම තවත් එකක් සඳහන් කරන්න ඕන. අපේ එක කොට්ඨාසෙක හැම කොට්ඨාසෙකටම වැසිකිලි දෙකක් නිර්මාණය කරන්න, මේ වෙන කොට සියලු කටයුතු සූදානම් කරලා තියෙනවා. එයත් අර ග්‍රාමීය කමිටුව හරහා එක වැසිකිලියක් හදන්න රුපියල් 50000 ක මුදලක් වෙන් කරලා කොට්ඨාසෙකට දෙක ගානෙ ලබා දෙන්න අවශ්‍ය කටයුතු සංවිධානය කරලා තියෙනවා. ඒ නිසා ඉදිරියෙදි බලාපොරොත්තු වෙනවා රජය. වැසිකිලි නැති සියලු දෙනාට ජල මුද්‍රිත වැසිකිලියක් ලබා දීමේ වැඩපිළිවෙලක් සූදානම් කරල තියෙනවා. ඒ නිසා අපි හැම දේම අසුභ විදිහට හිතන්නෙ නැතුව මේ වර්ෂයට වැඩිය 2021 වර්ෂය අපි සියලු දෙනාටම ශක්තිමත් විදිහට මුහුන දෙන්න හැකියාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පසුගිය දිනක මාපලගම බස් නැවතුම් පොළ අසල සිට කොළඹ කඩේ දක්වා ප්‍රදේශයේ කිලෝමීටර් තුනක වගේ කාපට් ඇතිරීමේ යෝජනාවක් ක්‍රියාත්මක කිරීම ආරම්භ වුනා. අපි සභාවක් වශයෙන් විශේෂයෙන් ඉල්ලීමක්

කරනවා. ඉතා කුඩා වැස්සකට පවා යටවෙන ස්ථාන කිහිපයක් 215 අලුත් පහළ වසමේ සහ අපේ අලුත් ඉහළ වසමේ තියෙනවා. අපේ ගයාන් මන්ත්‍රීතුමා ඒ යෝජනාව ඉදිරිපත් කරාවි. එතනදි අපි දැනුවත් වෙලා තියෙන විදිහට නම් කොළඹ කඩේ මංසන්දිය දක්වා කාපට් ඇතිරීම පමණයි සිදු වෙන්නෙ. අපිට විශේෂ ඉල්ලීමක් සභාවක් වශයෙන් යොමු කරන්න සිදු වෙනවා මේ අවස්ථාවෙදි. මාපලගම බස් නැවතුමේ සිට අඩුම ගානෙ මීටර් 200 ක් දෙපස කානු පද්ධතිය කොන්ක්‍රීට් කරන්න ක්‍රමවේදයක් ලබා දෙන්න පුලුවන්නම් ඒකට මහා මාර්ග අමාත්‍ය ජොන්ස්ටන් මැතිතුමාගේ ඉල්ලීම පිට හෝ අපේ ගරු සම්පත් අතුකෝරල මැතිතුමාගේ ඉල්ලීම මත අඩුම ගානෙ අර ආසිරි සර්විස් එක ඉදිරිපිට කානු පද්ධතිය කොන්ක්‍රීට් කරන්න. එතන පාර කොතෙක් ඉස්සුවත් වැඩක් වෙන්නෙ නැහැ. මාපලගම නගරයේ  සිට මීටර් 200 ක් පමණ ඊට පස්සෙ ගයාන් මන්ත්‍රීතුමාගෙත් යෝජනාවක් තියෙනවා. පාරෙ එක්තරා කොටසක් පිළිබඳව.

ඒ වගේම තමයි මට ලක්රුවන් මන්ත්‍රීතුමා දැනුම් දීමක් කෙරුවා. තල්ගස්වල රාජ්‍ය වැවිලි සංස්ථාවට යන තැන තියෙන අපගේ ඉඩම් කැබැල්ල තාවකාලිකව, තාවකාලිකව කියන්නෙ බ්ලොක් ගල්වලින් හෝ කඩ කාමර කීපයක් හදලා දෙන්න පුලුවන්නම් අපට ආදායම් උත්පාදනය කර ගන්න පුලුවන්. පසුකාලීනව ඒක ඉවත් කරලා දාන්න. ඒ වගේම තමයි ඔබතුමා මගේ ඉල්ලීම පිට පසුගිය දිනවල වීථි ලාම්පු කීපයක් සවි කිරීම සඳහා කාර්ය මණ්ඩලය එවල තිබුනා. විශේෂයෙන් රියදුරු මහත්මා ඒ වගේම අලුත බඳවා ගනු ලැබූ මල්ලි ඒ අනිත් තුන්දෙනා විශේෂයෙන්ම වීථි ලාම්පු දහනවයක් එක දිනට අලුත් වැඩියා කළා. ඒ රියදුරු කැලුම් මහත්මාත්, ඒ මල්ලිත්, නිශාන්ත විශාල කාර්ය භාරයක් කෙරුවා. ඇත්තටම දවස් දෙකේදි විශාල ප්‍රමාණයක කාර්යය භාරයක් කෙරුවා. ඒකටත් ඔබතුමාටත් කාර්යය මණ්ඩලයටත් විශේෂ ස්තූතිය පුද කරනවා.

**ගරු සභාපතිතුමා**

රාජ්‍ය වැවිලි සංස්ථාවට යන තැන තියෙන අපගේ ඉඩම් කැබැල්ලේ කාමර කීපයක් හදන්න යෝජනාවක් තියෙනවා

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ඒ වගේම අර මාපලගම බස්නැවතුම් පොළේ තියෙන අපේ සභාවෙ කඩ වීදි ටිකේ පොඩ්ඩක් තීන්ත ටිකක් ගෑවනම් මම හිතන්නෙ හොඳයි කියල හිතෙනවා. අර දිය සෙවෙල් කාලා. ඒවගේම ජල යෝජනාවක් මාපලගම එහා පැත්තට ජලය යන්නෙ නැහැ. ආදි කාලෙ කොන්ක්‍රීට් එක යටින් ගිහිපු බට ලයින් එකක් තියෙන්නෙ. ඒ වතුර ප්‍රශ්නෙ දැඩිසේ බලපානවා මාපලගම නගරයට ගියාම මට ඉතිං උත්තර දෙන්න බැහැ. මේහේට යෝජනා ඇවිල්ල තියෙන්නෙ. මම හිමීට මග ඇරල යනවා. වෙන කරන්න දෙයක් නැහැ. මම හිතන්නෙ දැන් සභාවෙ මුදල් ටිකක් තියෙන නිසා ඒ කඩවලට ජලය සැපයීම සම්බන්ධව සළකා බලන්න.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන්ම අවසරයි. ගරු සභාපතිතුමනි, අපේ පියල් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ. මම එතනින්ම පටන් ගන්නම් කතාව. ඒ ඉංජිනේරු මහත්තයත් එක්ක මම කතා කළා. ඒ ඉංජිනේරු මහත්තය කිව්වා. මාපලගම ඉදල කොළඹ කඩේ දක්වා ඒ සංවර්ධනය කරන පාරේ යම් ගැටලුවක් මතු වුනොත් මන්ත්‍රීතුමාලත් සභාපතිතුමත් මැදිහත් වෙලා. ඒ කටයුතු නිරාකරණය කරල දෙන්න කියලා. ඒ වගේම අවශ්‍ය ස්ථාන කීපය මම ගොඩ කරන්න ඕන කොතනද කියන තැන් ඒ අවශ්‍ය ටික එතුමාට දැනුම් දුන්නා.

ඒවගේම තමයි, ඒ මාපලගම ඉදලා කොළඹ කඩේ දක්වා ප්‍රධාන මාර්ගයට වැඩිය ගරු සභාපතිතුමනි ප්‍රශ්නෙ මතු වෙන්නෙ. කොළඹ කඩේ සිට දොලේ කඩේ දක්වා සෝභිත මාවත කාපට් ඇතිරීමේදී

තමයි. දැනටමත් මට ඇහිල තියෙනවා. අපේ ඉඩමෙන් දෙන්න බැහැ. අපේ තාප්පෙ කැඩෙයි. ඒ කියන්නෙ වැරැද්ද ඒ අයගෙ තාප්පෙ බැදල තියෙන්නෙ පාරෙ. නමුත් ඒවට අර කලින් කතා කළා වගේ තීරණ දෙකක් නැතුව එක තීරණයක් අරගෙන අවශ්‍ය කටයුතු කරන්න. අපිත් එක්ක තරහ වෙන්න පුලුවන්, ඔබතුමත් එක්ක තරහ වෙන්න පුලුවන්. නමුත් ඒ සංවර්ධන කටයුත්තෙදි කෙලින් ගත යුතු ක්‍රියාමාර්ගය ගන්න කියලා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**

සමාවෙන්න ඒ බල ප්‍රදේශයෙ මන්ත්‍රීවරු දෙතුන් දෙනෙක් ඉන්නවනෙ. ඒ පාර කටයුත්තෙදි මන්ත්‍රීවරු මොනවත් බලපෑම් කරන්න යන්න එපා. මම අර එදා කතාවෙදිත් කිව්වෙ. කරුණා කරලා මේ පාර හදනවා ඉඩම්වලින් දෙන්න. ඒ මිනිස්සුත් එක්ක පෞද්ගලිකව ගිහිල්ල අපි කතා කරමු. සුහදව මෙන්න මේ දේ විය යුතුයි. මෙන්න මෙහෙමයි කියලා. එතකොට බොහෝ දුරට 80% ක් 90% ක් මිනිස්සු කැමති වෙන්න පුලුවන්. අපි යමු ඒ අය හමු වෙන්න.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහතා**

ඒ විදිහට බලලා බැරි වුනොත්, ඔබතුමාගෙ බලතල පාවිච්චි කරලා හරි. ඒ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කටයුතු අපේ පැත්තෙන් අපි කරලා දෙමු.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අර පැල තවාන් ගැන කතා කළා. මම සඳහන් කරන්න ඕන. මම නම් සමහර ඒවට සහභාගි වුනා. මාරකන්ද මලාමුර වගේ පැල තවාන් කාට දුන්නද? කොහොම කළාද කියන එක මම දන්නෙ නැහැ. ඒව නිලධාරීතුමියන්ලා තුමන්ලා එකතු වෙලා ඒ කර්තව්‍ය කළේ. මාර කන්දෙ එක අදටත් මම දන්නෙ නැහැ කොහේද කළේ කියලා. මලාමුර එකෙත් පැල බෙදාදෙන දවසෙ මට කතා කළා. නමුත් ඒකෙ අපේ කිසි ප්‍රශ්නයක් නැහැ. මම හිතන්නෙ අපේ දිල්රුක්ෂි මන්ත්‍රීතුමියත් මගේ කොට්ඨාසෙ. මම හිතන්නෙ මන්ත්‍රීතුමියටත් ප්‍රශ්නයක් නැතුව ඇති. අපිට ඕන අවශ්‍ය වැඩේ වෙන්න විතරයි. ඒ දේ වෙනවනම් ඒ ඇති.

ඊලගට ගරු සභාපතිතුමනි, අර සෞඛ්‍ය මධ්‍යස්ථානයෙන් ලියුමක් එවල තිබුනා. ඒක සභාගත කරලත් තිබුනා. ඒකට අවශ්‍ය කටයුතු කරන්න කියලා. නමුත් ඉතිං අර තව මන්ත්‍රී කෙනෙක්ගෙ වැඩක් තියෙන නිසා. මම ඒක මගේ වියදමින් පෙට්‍රල් ටික අරන් දීලා. මගේ වියදමින් උඩුගමට ගිහිල්ල මැෂින් ගෙනැල්ලා. ඒ කර්තව්‍ය මම කළා. නමුත් එක මන්ත්‍රීවරයට දවස් හතර පහක් දෙනකොට අර පොදු කටයුත්තක් වෙනුවෙන්, අත්‍යවශ්‍ය තැනක් ඒ ගැබිනි මාතාවන් පැමිණෙන තැනක්. ඒ වගේ තැනක් සුද්ද පවිත්‍ර කරන්න තමයි එතුමිය කාරුණික ඉල්ලීමක් කරලා තිබුනේ. ඒ වගේ අවස්ථාවක මට පුලුවන් දේ තමයි මම කළේ. නමුත් ඉදිරියට සභාපතිතුමනි, ඒ වගේ දෙයක් මග හරින්නෙ නැතුව කටයුතු කරන්න ඔබතුමා ක්‍රියාමාර්ග ගන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඊලගට අපේ සමන් මන්ත්‍රීතුමා, සභාපතිතුමා කිව්ව වගේ පාරට ආසන්නව අර මගේ නමත් කියවුන නිසා මම සඳහන් කරන්නෙ. නැත්නම් මට මේක වැඩක් නැහැ. ඒ ඉදිකිරීමක් සම්බන්ධව. මට ඒ කොට්ඨාසයේ ඒ ග්‍රාම නිලධාරී වසමේ 214 බී කැටගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමේ ආර්ථික සංවර්ධන නිලධාරීතුමිය එතුමිය තමයි මට මුලින්ම ප්‍රකාශ කළේ. ඒ පාරට අවහිර වෙන විදිහට මෙහෙම ඉදිකිරීමක් සිදු වෙනවා කියලා. ඉතිං ඊට පසුව සභාවේ දැනුම් දීම මත ඒ අදාල නිවෙස් හිමියා මට කතා කළා. මම කිව්වා මට ඕකට තීරණ දෙන්න බැහැ. නිලධාරියෙක් ආවනම් ඒ අය තීරණය කරයි කියලා. ඒ පාර කිව්වා ඉතිං දැන් මේ විදිහට කනු හිටවල තියෙනවා. ඒ විස්තරේ මට කිව්වා. මම කිව්වා ඉතිං මට කියන්න බැහැ. ඔබතුමා ලිඛිතව දීල හරි සභාව එක්ක කතා කරලා ඒ නිලධාරීන් එක්ක කතා කරලා. අනිත් පැත්ත ඔබතුමාගෙ ඉඩමනම් ඒක ගැටලුවක් ඔබතුමාට නැත්නම්. සංවර්ධනයකදි එක්කො කඩා ඉවත් කරන්න හෝ අනිත් පැත්තෙන් ඉඩමෙන් පාර ලබා

දෙන්න කියලා. ලියුමක් දෙන්න කියලා තමයි මම කිව්වෙ. නැතුව මම එහෙම ඊට එහා දෙයක් කියන්න ගියේ නැහැ. නිලධාරීන්ට අදාල රාජකාරි අපි කරන්න යන්නෙ නැහැ.

ඊලගට ගරු සභාපතිතුමනි නිශාන්ත නන්දන මන්ත්‍රීතුමත් දන්නවා. මේ අලුත් ඉහළ ජොෂ්ඨ පුරවැසි වැඩිහිටි සමිතියෙ අපේ ආරියදාස ගොඩගම හිටපු විදුහල්පතිතුමාගෙ නායකත්වයෙන් ක්‍රියාත්මක වෙන ඒ සමිතියෙ දැන් දින කීපයක් මට කිව්වා. මුලින් කියන්නෙ එක කතාවක් දැන් කියන්නෙ එක කතාවක්. ඉස්සෙල්ල ගහ කපන්න ඉවත් කරන්න කිව්වා. දැන් කියනවා අඩි 15 ක් යටින් කපන්න කියලා. ඔතන ලොකු ගැටලුවක් තියෙනවා. සභාපතිතුමනි දෙගොල්ලන්ටම සාධාරණ වෙන විදිහට. ඒක මොන විදිහකින් හරි එක තීරණයකට ඇවිල්ලා. කපා ඉවත් කරන්න හරි අඩි 15 ක් යටින් කපන්න හරි ඒ දෙකෙන් එකක් තීන්දුවක් දෙන්න. ඒ දෙගොල්ලත් එක්කම අපේ කිසි ප්‍රශ්නයක් නැහැ. මම හිතන්නෙ නිශාන්ත නන්දන මන්ත්‍රීතුමත් ඒ ගැන හොඳටම දන්නවා. අපි කියන්නෙ දෙපැත්තටම සාධාරණයක් වෙන විදිහට හොඳ දෙයක් කරන්න. ගන්න දේ කෙලින් තීන්දු තීරණයක් ගන්න. ඔය ගැන ඒ විදුහල්පතිතුමා මමත් එක්ක පහුගිය දවසක පැයක් විතර කතා කළා. ප්‍රාදේශීය ලේකම්තුමිය කියන දේ නෙවෙයිලු ඔබතුමා කියන්නෙ. ඔබතුමා කියන දේ නෙවෙයිලු එතුමිය කියන්නෙ. එතන සාධාරණයක් ඉටු වුනේ නැහැ. කලින් කියපු දේ නෙවෙයිලු දැන් සභාපතිතුමා කියන්නෙ. ඉතිං එහෙම කියලා එතන මොකක් හරි යම් කොතන හෝ ගැටලුවක් තියෙනවා. ඒක නිරාකරණය කරලා. එතනට අවශ්‍ය කටයුතු කරන්න කියලා කියනවා. එතන මම දන්න තරමින් තියෙන්නෙ සින්නක්කර ඉඩමක්. නමුත් ඒ ඉඩම් හිමියගෙ ඒ පැත්ත බැලුවම ඒ මනුස්සයත් හරි. නමුත් ඒ සමිතියටත් අවදානමක් තියෙනවා ඒ ගහෙන්. ඉතිං ඔය දෙකම සලකල බලලා. ඒ නිලධාරීන් සම්බන්ධ කරලා කරන්න පුලුවන් දෙයක් හැකි ඉක්මනින් කරන්න. දෙකෙන් එකක්. එතකොට ඒ ප්‍රශ්නෙ ඉවරයි. ඔය දූරියන් ගහේ ප්‍රශ්නය වගේ කාලයක් ඇදගෙන යන්න එපා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මත් ද්‍රව්‍ය ගැන කතා කළා. මම අකමැතිම දෙයක් තමයි ඔය මත් ද්‍රව්‍ය ගැන කතා කරන්න. මොකද මත්ද්‍රව්‍ය ඇතිවෙන්න තියෙන තැනක් තමයි අපේ ප්‍රදේශය. නමුත් මෙච්චර කල් කිව්වට, පොලිස් ස්ථානයේ කිව්වට මම සම්බන්ධීකරණ කමිටුවෙදි පවා කතා කළා. ඒ පොලිස් නිලධාරි ඉන්න යම් තැන්වලදි මම යම් යම් ප්‍රකාශ කරලා. අන්තිමට ඒ ගොල්ලො මේ අපේ මන්ත්‍රීවරු සමගත් කියලා තියෙනවා. ඒ පොලිස් නිලධාරීන් යන්න කලින් මාව දවස් 14 කට හරි හිරේ දානවයි කියලා. ඉතිං ඒ වගේ තත්වයක් තමයි තියෙන්නෙ. ඒකටනම් කමක් නැහැ. ඉතිං ගරු සභාපතිතුමනි, දැන් මේ පහුගිය දවසකත් අපේ බල ප්‍රදේශයෙදි මාලියගොඩට හැරෙන තැනදි මාලයක් කඩාගෙන ඇද වැටීමක් සිදු වෙලා ලොකු ගැටලුවක් වෙලා තිබුනා. ඊට වැඩිය ලොකු අනතුරක් වෙන්න පුලුවන්. මම හිතන්නෙ ඔබතුමා දැන් කතා කළා. කැමර් පද්ධතියක් සවි කරනවා කියලා. මම හිතනවා ඒක කාලෝචිත ක්‍රියාවක් කියලා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. නාගොඩ පොලිස් ස්ථානාධිපතිතුමත්, ප්‍රාදේශීය ලේකම් නිලධාරීත් සම්බන්ධ කරගෙන. මේ වගේ මත් ද්‍රව්‍ය නවත්වන්න මොනවද ගන්න පුලුවන් ක්‍රියාමාර්ග, දැනට අරගෙන තියෙන ක්‍රියාමාර්ග මොනවද? මම හිතන්නෙ මගේ කිසිම පැහැදීමක් නැති කාරණාවක් තමයි මත් ද්‍රව්‍ය සම්බන්ධව. මේ ප්‍රාදේශීය සභාවත්, පොලීසියත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් මැදිහත් වෙලා මෙතෙක් කාලයක් කරපු දෙයක් නැහැ. එන්න එන්න වැඩිවෙලා තියෙනවා. අවුරුදු 14, 15, 16 යේ පොඩි එකාගෙ ඉදලා කසිප්පු පෙරන්න පටන් ගෙන තියෙනවා. ඒ වගේම ඒක බොන්න ඇබ්බැහි වෙලා තියෙනවා. ඉතිං මේ තරුණ ජීවිත ගරු සභාපතිතුමනි. ඒ තරුණ ජීවිත තව අවුරුදු 10 ක් යන කොට කොතනද තියෙන්නෙ. අපේ සමාජය කොතනද තියෙන්නෙ. ඒක ලොකු ගැටලුවක් වෙනවා. මේ විදිහට ගියෝතින් ශ්‍රම බලකායක් කියන අපේ තරුණ පරම්පරාව ඉදිරියෙදි අපිට අහිමි වෙනවා. ඒකට දැඩි ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්න ඕන. මම හිතන්නෙ ඔබතුමාට ඒ ක්‍රියාමාර්ග ගන්න පුලුවන්. ඔබතුමාට ඒ තියෙන සම්බන්ධතා එක්ක. ඉහල නිලධාරීන් එක්ක. ඉතින් ඒ දේවල් පස්සට දාන්නෙ

නැතුව ඉක්මනින් ඉෂ්ඨ සිද්ද කරන්න ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා. තෙරුවන් සරණයි.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි, වැඩිහිටි සමිතියේ ගොඩනැගිල්ලට අනතුරුදායකව තියෙන ගසේ ප්‍රශ්නයට මම ඉහල නිලධාරීන් එකතු කරලා පරීක්ෂණයක් පවත්වන්න කටයුතු සකස් කරලා තියෙන්නෙ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි දීර්ඝ වශයෙන් සාකච්ඡා වුන වෙලාවක මම කෙටියෙන් අදහස් දක්වනවා. පළමුවෙන්ම මම මෙතනට නවක මන්ත්‍රීවරිය හැටියට පැමිණි එතුමිය ඉතාමත්ම ආදරයෙන් සහ ගෞරවයෙන් පිළිගන්නවා. මොකද පළවෙනි අපේ යෝජනාවටම අපිත් එක්ක පක්ෂව ඡන්දය දුන්නා. එතුමියත් අපේම තමයි. අපේ කණ්ඩායමක් වෙන්වෙලා ගිහිල්ල ඡන්දෙ ඉල්ලලා, දැන් මේ මොහොත වෙන කොට අපිත් එක්ක ක්‍රියාවලියේ ඉන්නවා. ඒ නිසා පළමු කොටම අපේ ගෞරවයත් පිළිගැනීමත් විපක්ෂය හැටියට මම කරනවා. ඒ වගේම තමුන්නාන්සෙල මේ කතා කරගෙන යන කොට හරියට මම දැක්කා. මේ පාරවල් කාපට් කරනවා. අපිත් කරනවා. අපිත් කරනවා. වැඩේ අපි කරගෙන යනකොට තමයි අපිට ආණ්ඩුව නැති වුනේ. අපි තමයි ගමකට කෝටි ගණන් ගෙනැල්ලා, අතහරින කොට තමුන්නාන්සෙල ඒකෙ ඉතුරු කොටස තමයි කරගෙන යන්නෙ. ඒ විතරක් නෙවෙයි තමුන්නාන්සෙලගෙ ප්‍රදේශයේ මන්ත්‍රීතුමත් අපගේ හිතවත් ආදරණීය ගරු සභාපතිතුමත් තවත් කණ්ඩායමක් ඉතාමත්ම ලැජ්ජා සහගත වැඩක් ඊයෙ පෙරේද කරලා තිබුනා. අපි නාගොඩ කොට්ඨාසෙට එක්කෝටි හත් ලක්ෂයක විතර පාලම් ගෙනාවා. කෝටි 20 ක 24 ක විතර ප්‍රතිපාදන ගෙනැල්ලා. එවකට පළාත් සභා පළාත් පාලන අමාත්‍යවරය හැටියට වජිර අබේවර්ධන අමාත්‍යවරයගෙ ප්‍රධානත්වයෙන් ඒව කරගෙන යන කොට වැඩ අවසන් වුනේ ආණ්ඩුව නැතිවෙන කොට මේ වකවානුවෙ. ඒක මම දකින්නෙ දරුවෙක් හදා ගන්න බැරි කමට, අනුන්ගෙ දරුවෙකුට යම් කිසි කෙනෙක් ගිහිල්ලා උප්පැන්න සහතිකයක් ලියලා දෙනවා. මේ දරුවා මගේය කියලා. කමක් නැහැ දරුවො නැත්නම් ඉතිං ඒකවත් කරගන්න. හැබැයි පාලම විවෘත කලේ හරියට දවස් 14 වත් ගෙවෙන්න කළින්. ඒ කොන්ක්‍රීට් එක දාලා සති දෙකක් තියෙන්න ඕන. බය හිතුනා මේක කවුරු හරි වැඩේ කරාවිය කියලා බය වුනා. මේක මම උදුර ගන්න ඕන කියලා දවස් 14 කට කලින් විවෘත කළා. ඉතිං එහෙම හරි මේ උදවිය වින්දනයක් ලබනවනම් අපි අසතුටු වෙන්නෙ නැහැ. නැත්නම් තමුන්නාන්සෙල මේව පුවත්වල මාධ්‍ය තුල යන කොට හිතාවි අවුරුද්දක් යන කොට කෝටි 21 ක් ගම්වලට ඇවිල්ලා. මෙන්න දැන් විවෘත්ත කරගෙන යනවයි කියලා. ඒක නෙවෙයි සිදු වුනේ. අපේ වැඩ තමුන්නාන්සෙල උදුර ගත්තා. පුංචි සතුටක් ලබන්න ඒකෙ කිසිම ප්‍රශ්නයක් නැහැ.

ඊලග මාතෘකාව ආවා දැන් ගමකට නිවාස හතරක් හදනවයි කියලා. ඒ දවස්වල අපි ලක්ෂ 7 ක් 8 ක් 10 ක් වියදම් කරලා. ලක්ෂ 10 කට එහා වියදම් කරල හදන කොට ඒවා නිකන් පරවි කූඩු වගේය කිව්වා. අද මේ මොහොත වෙන කොට ලක්ෂ 4 ක් 5ක් වියදම් කරලා, එහෙම නැත්නම් ලක්ෂ 6 ක් වියදම් කරලා. ඒ වැඩපිළිවෙලම ගමකට හතරක්, අපි ගමකට හතරක් නෙවෙයි. ගමකට ප්‍රදේශයකට අපි ගෙවල් සිය ගානක් ගෙනාවා. තමුන්නාන්සෙලා මේ වැඩ කරන්නෙ අපේ දැක්ම තුල. මොකද මම මේ ටික මතක් කළේ නැත්නම් තමුන්නාන්සෙලා මේක කියාගෙන කියාගෙන යන කොට හිතනවා. මේක ඔක්කොම කරන්නෙ අපි තමයි කියලා.

ඒ වගේම පැල තවාන් ගැන, කොහොමද කෙරෙන්නෙ කියන එක ඇත්තටම මම දන්නෙ නැහැ. කණගාටු වෙනවා. මේ තවාන කොහේද? ගරු සභාපතිතුමනි, කිසිම රාජ්‍ය නිලධාරියෙක් අපිව කැඳවල නැහැ. තමුන්නාන්සෙල ගිහිල්ලා ඒක කළත් අපි සතුටු වෙනවා. නමුත් මේ මොහොත වෙන

කොට දෙවියනේ උපන් ගමේ පැල තවානක් තියෙනවයි කියලා පතිනායක මන්ත්‍රීතුමා කිව්වම දන්නෙ. නමුත් රාජ්‍ය නිලධාරි පස් දෙනෙක් ගමේ ඉන්නවා. මේ පස් දෙනාගෙන් එක්කෙනෙකුට කිසිම කෙනෙකුට මහජන නියෝජිතයො සම්බන්ධ වෙන්න කිව්වම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මේකට සම්බන්ධ කර ගන්න ඒ උදවිය බය ඇති. මේක මට විතරක් නෙවෙයි. මේ ඉන්න අපේ අජිත් මන්ත්‍රීතුමා හිටපු සභාපතිතුමාටත් මේකමයි. මේ ඉන්න විපක්ෂයේ වාඩිවෙන සියලු දෙනාටම මේකමයි. එහෙමනම් මේ සංවර්ධනය තුල අපිත් මේ දීමනාව ගන්නනම් මේ දීමනාව ගන්න කොට අපිත් මොකක් හරි දායකත්වයක් ලැබිය යුතුයි. ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම්ගෙන් ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු අරගෙන සභාවට ඉදිරිපත් කරන්න මොකක්ද මේ වෙන්නෙ කියලවත් දැනගන්න. ඒ නිසා අන්න ඒ වගේ දෙශපාලන දර්ශනයක් තුල මේ ගමන යනවයි කියන එක මට මතක් කරන්න ඕන.

ඊලග කාරණය තමුන්නාන්සෙල කිව්වා. ගම්පෙරලිය එන කොට අපට කිව්වෙ නැහැ. නමුත් අපි නම් දැන් බොහොම සාධාරණව කටයුතු කරනවයි කියලා ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කිව්වා. මම සභාපතිතුමාට ස්තූති වන්ත වෙනවා. හරිදේ හරියට දකින්න පැකිලෙන්නෙ නැහැ. මම අවසාන මොහොත වෙනකොට මිදැල්ල තලාව පාරට ලක්ෂ 16 ක් ගෙනාවා. හත්තිටියගොඩ වත්ත පාරට ලක්ෂ 6 ක් ගෙනාවා. ගිවිසුම් අත්සන් කරලා තිබුනෙ.වැඩ ආරම්භ කරන්න බැරි වුනා. ඒ ගිවිසුම් අත්සන් කරපු එකයි අපට කරන්න ඉඩ දුන්නෙ. මිදැල්ල තලාව පාර කරන්න ඉඩ දුන්නෙ නැහැ. අත්සන් කරල තියෙද්දි, දවසක් වැඩ කරල තියෙද්දි, ඒ කර්මාන්තය නැවැත්තුවා. ඊට පස්සෙ කෙරුනා. ගමට පාරක් හැදෙන්න ඕන. ගමට තාර ටික දාන්න ඕන. ඒ කොන්ත්‍රාත්තුව අපි කරන්න ගියේ නැහැ. කාගෙ අතින් හරි සිදු වුනා. එවැනි කෙනෙහිලිකම් ආණ්ඩුව ආපු හැටිය සිදු වුනේ. නමුත් සභාපතිතුමා ඒ තැන්වලදි හරියට හිටියා. නමුත් මේ දේශපාලනය කරන කොට මේ පුටුවෙ ඉන්න කොට මම දන්නවා මේ පුටුවෙ ඉන්න කොට තියෙන බැරෑරුම්කම. මේ පුටුවෙ ඉන්න කොට ඉහලින් එන ඕඩරය ක්‍රියාත්මක කරන්න සිදු වෙනවා. ඒ නිසා මම ඔබතුමාට චෝදනා කරන්නෙ නැහැ. අන්න ඒක නිසා එවැනි දැක්මක් තුල අපි මේ ගමන යන්නෙ.

ඒ වගේම ආදාහනාගාරය කවුද ගමට ගෙනාවෙ. තමුන්නාන්සෙලගෙ සභාවක් තිබුනෙ. සභාපතිවරයත්, මමත් එකට ගියෙ. එතනට එදා අමාත්‍යවරය මේක අපි කණ්ඩායමම ගෙන්නලා ඇහුවා. අපේ අපට කොටි දෙකක් දෙනවා මේකට එකගද කියලා. අපි සියලු දෙනාම කිව්වා ඒක හදවතින් කිව්වා කෝටි දෙක නෙවෙයි හතරක් දෙන්න. අපට අඩුපාඩුවක් කියලා. තවම ඒක ක්‍රියාත්මක කරන්න බැරි වුනා. නමුත් මම කියනවා අපේ ආණ්ඩුව තිබුනනම් අපි ඉඩම දුන්නා. අපි සල්ලි දුන්නා. නමුත් වසර ගණනාවක් ගියා. 92 කේ 94 ත් එදා මේ ආදාහනාගාරෙ ගන්න අපි මහන්සි වුනා. නමුත් අවසාන මොහොතෙ හරි නාගොඩ විතාන සභාපතිතුමාගේ කාලෙදි ඒ දේ ලැබුනා. ඒක තමයි ක්‍රියාත්මක වෙන්නෙ. තමුන්නාන්සෙ මේ අත ගහල තියෙන්නෙ පොදු කටයුත්තකට. ඒ කටයුත්තෙ දායකයො වෙනවා. එදා හිටපු අමාත්‍යවරයත්, සභාපති හැටියට තමුන්නාන්සෙත් මේ සභාවෙ ඉන්න සියලුම මන්ත්‍රීවරුත් කිසි කෙනෙක් විරුද්ද වුනේ නැහැ. එහෙමනම් ඒකෙ පංගු කාරයො ඒකෙ කොටස් කාරයො වෙනවා අපි සියලු දෙනාම.

ඒ වගේම ඊලගට අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කිව්වා. මේ පාසල්වල විෂබීජහරණය පිළිබඳව. මම ගරු සභාපතිතුමාට මතක් කරන්න කැමතියි. ප්‍රාදේශීය සභාව කියන්නෙ උපතේ සිට විපත දක්වා වගකිව යුතු ආයතනයක්. අපේ බල ප්‍රදේශයේ පාසල් පද්ධතිය තුල සිදුවෙන්නෙ නැත්නම් අපට හැකියාව තියෙන්න ඕන ඒක කරන්න. ඒකට අපේ දරුවො එන්නෙ. ඒකට දායකත්වය දෙන්න කාගෙන්වත් අවසර අවශ්‍ය වෙන්නෙ නැහැ. සභාපති කියන්නෙ ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා. ඕනෑම ආයතනයකට ගිහිල්ලා මේ දේ මම හෙට ක්‍රියාත්මක කරනවා. කියලා කියන්න පුලුවන්. මම දන්නවා ඒ විශබීජානුහරණ ක්‍රියාවලියට ශක්තිය නැහැ. නමුත් ඒ කටයුත්ත අපි කරන්න ඕන. එක දරුවෙක්ට හරි හදිස්සියෙවත් මේ රෝගය වැලඳුනොත්. මේකේ වගකීමේ

පංගු කාරයෙක් හැටියට නාගොඩ සභාවට ඇඟිල්ල දික් කරනවා. නමුත් එසේ රෝගය නොවැලදේවා කියලා හදවතින් ප්‍රාර්ථනා කරනවා. ඒක අපට නෙවෙයි විශේෂයෙන්ම සභාපතිවරයට ඇඟිල්ල දික් කරනවා. පී.එච්.අයි. මහත්වරු, සියලුම නිලධාරී එනවා. මේ විද්‍යාලයට මෙන්න මේ දේ සිදු වුනේ නැහැ. විෂබීජහරණය සිදු වුනේ නැහැ කියලා. කියනවා. ඒ නිසා මම කියනවා තමුන්නාන්සෙට නිශේධ බලතල තියෙනවා. අපෙන් අහන්න ඕන නැහැ සභාව කැඳවන්න ඕන නැහැ. ගෙනා මුදල් වියදම් කළා මෙන්න මේ වැඩෙටෙයි කියලා. ඒක යොදවන්න පුලුවන්. අපි දැන් මෙතන කිව්වම මීටර් 50 හ 60 වැඩිවුනාම අපි කවදාවත් විරුද්ද වුනාද? අපි ඒවට එකග වෙනවා.

ඒ වගේම මේ සියල්ලම කැටි කරල ගත්තයින් පස්සෙ මේ සියල්ලම එකතු වුනාට පස්සෙ සභාවකට කළ නොහැකි දෙයක් නැත. අන්න ඒක නිසා මම මේ වෙලාවෙ අවසාන වශයෙන් මතක් කරනවා. මේ සියල්ලම අද කරගෙන යන අතරෙ මේ කොරෝනත් වර්ධනය වෙලා තියෙනවා. මේ අවස්ථාව ඉතාමත්ම භයාණකයි. මගේ අත් දැකීමක් මම කියන්නම්. මම ගියා මගේ ඥාතියෙකුගෙ ගෙදර. ඒ ඥාතියා යමක් කරන්න පුලුවන් ඥාතියෙක්. දරුවො තුන්දෙනා ජේලියට වාඩිවෙලා ඉදගෙන ටැබ් එක ක්‍රියාත්මක කරගෙන වැඩසටහනක් යනවා. ගුරුවරයා උගන්වනවා. මම ගියා ඒ වගේම තවත් ඥාතියෙකුගෙ ගෙදර, දුප්පත් එතනත් දරුවො තුන්දෙනෙක් ඉන්නවා. මම ඇහුවා ඇයි පුතේ නිකන් ඉන්නෙ කියලා. අල්ලපු ගෙදරනම් මෙහෙම නේද කියලා. එතකොට කිව්වා අපට සල්ලි නැහැ මාමේ ඒව ගන්න. ඒ මාමලට සල්ලි තියෙන නිසා ඒව කරනවා කියලා. මේ දරුවො තුන් දෙනා හූල්ලනවා. මේ දරුවො තුන් දෙනා මිදුලට ගිහිල්ලා. තුන් දෙනා එක්ක පොරකාල සෙල්ලම් කරනවා. මම ඇහුව ඒ දරුවන්ගෙන් දරුවො ආස නැද්ද මේවට. අනේ ආසයි තාත්තට වද කරන්න බැහැ. අපේ ගෙදර පුංචි පෝන් එකක් තියෙනවා. ඒක ඔය ටච් පෝන් එකක් තියෙන්නෙ. ඒ පෝන් එකෙන් අපි තුන්දෙනාටම වැඩ කරන්න බැහැ. ඒක නිසා මොනව කරන්නද මාමේ. පාසල් පටන් ගන්න දවස බලාගෙන ඉන්නවා. එදාට අපිට යන්න වෙනවා. බලන්න මේ සමාජය කොතනද ගිහිල්ල තියෙන්නෙ. මම මේකෙ අවසාන උත්තරය එදා එවකට කුරුදුවත්තෙ ඉපදිච්ච අග්‍රාමාත්‍යවරයා හිතුවා. රාජකීය පාසලට ගියාම ටයි කෝට් ඇන්දාම මිනිහයි කියලා. දුප්පත් මිනිහගෙ හදවතේ ගැස්ම දන්නෙ නැහැ කියලා. ඒ ටැබ් යන්ත්‍ර එදා ක්‍රියාත්මක කරපු මේ ආණ්ඩුව ක්‍රියාත්මක කළානම්, අර අහිංසක දරුවො තුන්දෙනත් අනේ අධ්‍යාපනය ලබනවා. එහෙමනම් හෙට දවස මොකක්ද වෙන්නෙ. පුලුවන් එකාගෙ දරුවො ආයි මේ රටේ ඉංජිනේරුවො වෙයි. වෛද්‍යවරු වේවි. අහිංසක අම්මලගෙ තාත්තලගෙ දරුවො අපේ කුලී වැඩ කරන්න ආපහු ඒවි. එදා ඕක වෙනස් කරන්න හැදුවෙ කවුද? අද ප්‍රතික්ෂේප කරපු රාජ්‍ය නායකයා. අපේ රනිල් වික්‍රමසිංහ මහත්මයා. මෙන්න මේක තමයි වෙනස. අපේ රටේ මිනිස්සු මේක දැක්කෙ නැහැ. ටයි එකක් කෝට් එකක් දැක්කහම බය වුනා. අපේ දාඩිය මහන්සිය සුවද දැනෙන එකක් නැහැ කියලා. නමුත් හොඳාකාරවම දැනුනේ. අන්න ඒ ටයි කෝට් දාගත්ත පුද්ගලයට. ඒක නිසා මේ මොහොත වන විට අපේ අහිංසක දරුවො ලක්ෂ ගානක් ගෙවල්වල කර ගන්න දෙයක් නැතුව අද ඉන්නවා. අහිංසක දරුවො ලක්ෂ ගානක් වෙනුවෙන් මේ අධ්‍යාපන ක්ෂේත්‍රය තවම හරියට ක්‍රියාත්මක වුනේ නැහැ. අන්න ඒක නිසා ඒ පිළිබඳව මම මතක් කළේ. සති දෙකකට කලින් මේක මගේ දෑසින් දැකපු දෙයක්. මම වේදනාවෙන් එළියට බැහැලා ආවෙ. ඒක නිසා අපි කියන්නෙ නැහැ පාසල් වහගෙන ඉන්න කියලා. රජයක් හැටියට යම් කිසි ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. මේ මොහොත වෙන කොට ගාලු නගරෙත් තමුන්නාන්සෙල හිතන තත්වෙ නෙවෙයි තියෙන්නෙ. අපි කට කතාවක් කිව්වයි කියයි. අද තත්වය ඒක. උඩුගමත් තියෙනවා. දැන් මේල් බස් එකේ ගිහිපු අය ඔක්කොම නිරෝධායනය කරලා කියලා දැනගන්න ලැබුනා. මම කට කතා හැදුවයි කියලා. ඒකටත් අත් අඩංගුවට ගන්නවා.

විපක්ෂෙන් කිසිම සහයෝගයක් තමුන්නාන්සෙට නැත කියලා සභාවෙ ප්‍රකාශයක් වුනා. මේ කියපු හැම වචනෙකම සභාපතිවරය හැටියට යමක් කරන්නත්, යමක් ඉදිරියට ගෙනියන්නත්

තමුන්නාන්සෙලටත් එක්ක මේ කිව්වෙ. හතුරුකමකට නෙවෙයි අපි මේ කිව්වෙ. පෙනෙන දේ. ගමනක් යායුතු ක්‍රමේ මේකයි කියලා. තමුන්නාන්සෙල අපි සියලු දෙනාම අලුත් වර්ෂයකදි මුන ගැහෙන්නෙ. එහෙමනම් මේ රටේ තියෙන වසංගතය සහමුලින්ම විනාශ වෙලා, සම්පූර්ණ නැති බංග වෙලා දෙවියන්ගෙ ආශිර්වාදය ලැබිලා රටට සෙතක් ශාන්තියක් ඒ වගේම අපේ දරුවන්ට අපේ වැඩිහිටියන්ට සියලු දෙනාටම සෙතක් ශාන්තියක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින්, සභාපතිතුමාගේ ඉදිරි වර්ෂයේ දැක්මත් තමුන්නාන්සෙට ඒ වගේම යන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**

ගරු සහබන්දු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රකාශ කල පරිදි පාසල්වල විෂබීජහරණ කටයුතු අපට කරගන්න හැකියාවක් තිබුනෙ නැහැ. නැත්නම් මම කැමතියි පාසල්වල විෂබීජහරණ කටයුතු සිදු කරන්න. නමුත් කර ගන්න බැහැ. ඉස්කෝල කීයක් තියෙනවද? අනිත් විෂබීජහරණ ඉල්ලුම් කරපු ආයතන, උසාවිය, තව එක එක ආයතන අපි විෂබීජහරණය කරනවා. පාසල් ටික අපට කර ගන්න බැහැ. ඒක නිසා මම කිව්වා අපට කරගන්න ශක්තියක් නැහැ කියලා. අපි විභාග දවස්වල විභාග තිබුන පාසල්වල විෂබීජහරණ කටයුතු කළා. මේ ඊයෙ පෙරේද ආපහු ඉස්කෝල සඳුදා පටන් ගන්නවා කියලා ඊට කළින් සිකුරාද කිව්වා. එතකොට සෙනසුරාදා, ඉරිදා නිවාඩු දවස් දෙකේ සේවකයොත් නැහැ. පහසුකනුත් නැහැ. පාසල් දෙකකින් ඉල්ලීම් කලත්, මම කිව්වා සමාවෙන්න මට කර ගන්න බැහැ. මොකද එකක් දෙකක් කරලා නිකන් ඉන්න බැහැ. ඒක නිසා මම කිව්වා බැහැ කියලා. මන්ත්‍රීතුමා මම කියන්නෙ මේක කරන්න පුලුවන්නම් මම කරනවා. අපිට බලතලත් තියෙනවා. නමුත් කරගන්න නොහැකියාව නිසා තමයි ඒක නොකෙරුනේ. නැත්නම් විභාගයට ඉල්ලපු සේරම කළා. අනිත් හැම ඉල්ලපු ඒව කළා.

**ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා**

ගරු සභාපතිතුමනි, අවසරයි. අපේ ඌරල පූට්ටු පාලමේ ඇන්ද මේ වෙනකොට මම සභාව දැනුවත් කරලා, සභාවට ගෙනත් දාල තියෙනවා. ඒ නිසා එතන විශාල අනාරක්ෂිත භාවයක් තියෙනවා. ඒ පූට්ටු පාලමේ ඇන්ද සවි කරල දෙන්න කියලා. මම ඔබතුමාගෙන් මුලින්ම ඉල්ලා සිටිනවා. වංගුවත් එක්ක තියෙන නිසා විශාල අනතුරු රාශියක් වෙනවා.පහුගිය දවසකත් අනතුරක් වුනා. යතුරු පැදියක් ඒ ඇළට වැටුනා. ඒ නිසා එය සවිකරල දෙන්න කියලා, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ ඌරල පොදු නාන ලිද පිළිබඳව වසර දෙකක් තිස්සෙ මමත් කතා කරනවා. ඇත්තටම ඒ ස්ථානයේ ඉදිකිරීම කරන පුද්ගලයා ලිදට උඩ පැත්තෙන් විශාල පස් කන්දක් ගහලා. ඒ පස් කන්ද සෝදගෙන එන කොට සම්පූර්ණයෙන්ම ඒ ලිද වැහෙනවා. මම හිතන්නෙ ඒ ඉදිකිරීම කරන පුද්ගලයගෙත් අරමුණ වෙලා තියෙන්නෙ මේ ලිද වැසීම. මම දන්නෙ නැහැ. සභාපතිතුමාගෙ අරමුණ වෙලා තියෙන්නෙ මොකක්ද කියලා. ඇත්තටම මම මේ සභාවට දැනුම් දීලා හතරවෙනි සභා වාරෙ කතා කරන්නෙ. දැන් වර්ෂ දෙකක් පමණ වෙනවා. සභා වාර්තාවල තියෙනවා. ඒ පුද්ගලයා වාචික පිළිතුරක් ලබා දුන්නා. සභාපතිතුමනි, නමුත් ඒ වාචික පිළිතුර විතරයි තවම. තව වෙනකම් කිසිම දෙයක් ඒ ලිද සම්බන්ධව කරල නැහැ. ඇත්තටම මොන භයියක් තියෙන නිසාද ඒ දේවල් කරන්නෙ. ඇත්තටම ගරු සභාපතිතුමනි, ඔබතුමා ඇත්තටම මේ කාට බයෙන්ද මේ දේවල් කරන්නෙ. මොකද නැත්නම් දැන් අවුරුදු දෙකක් තිස්සේ මම මේ සභාව තුල මේ පොදු ලිද ගැන කතා කරනවා. මේ වෙනතුරු පිළියමක් නැහැ. මෙය ගමේ තියෙන විශාල ප්‍රශ්නයක්. අපට ගමේ ඉන්න නැහැ. අපි පාලක පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට. ඇයි ඔබතුමා ඒ පිළිබඳ

කිසිම ක්‍රියාමාර්ගයක් නොගන්නෙ. එතුමට කියලා හදා දෙන්න බැරිනම් සභාවෙ පොදු අරමුදලින් හෝ හදල දීල නිම කරල දෙන්න. නැත්නම් තව සුමානයක් යන කොට ඒ ලිද වහනවා. ඉතිං සභාපතිතුමනි, මේක මේ තරම් කතා කරන්න බැහැ. අපි කණ්ඩායම් රැස්වීමෙ කතා කළත්, මේ දේවල් වෙන්නෙ නැහැ. අපි මොකටද මන්ත්‍රීවරු වශයෙන් මේ සභාවෙ ඉදලා. සභාපතිතුමා මේකට ක්‍රියාමාර්ගයක් ගන්න. සභාවෙන් වීපී රේඛා අනුමත කරල දුන්නා. මම එත් කිව්වා වීපී රේඛා ගන්න එනකොට අනුමත කරන්න එපා කියලා. නමුත් මේ ගොඩනැගිල්ල හදන ප්ලෑන් එක සියල්ල අනුමත කරල අරගෙන ගිහිල්ල ඉවරයි දැන්.

**ගරු සභාපතිතුමා**

මම ඊයෙත් ඒ සම්බන්ධව කතා කළා. එන්.බී.ආර්.ඕ. එකෙනුත් ඇවිත් තහනම් කරල තියෙන්නෙ. ඊයෙ පෙරේදා. අපේ තාක්ෂණ නිලධාරීතුමියත් ගිහිල්ලා නතර කරන්න කියල තියෙනවා. ඊලගට මම අදාළ පුද්ගලයා සමඟ සාකච්ඡා කළා. මම කිව්වා ගමෙන්, මන්ත්‍රීතුමාලට විරෝධතා එනවා. මන්ත්‍රීතුමාලගෙන් විරෝධතා අපට එනවා කියලා. එවෙලෙ ඔහු කිව්වා පතිනායක මන්ත්‍රීතුමා, අපේ වැඩපලට අදත් ගල් ඇද්දයි කියලා. මම දැන් ඊයෙත් එයාට කිව්වා. කරුණාකරල මෙන්න මේ ලිද යථා තත්වයට පත් කරන්න කියලා. ඔහු කියනවා අවුරුදු ගානකින් ඒ ළිද පාවිච්චි කරල නැත කියලා. මම කිව්ව ඒක අදාල නැහැ. ඒ වගේම අර ඉස්සරහ ගෙදර උදවියගෙන් තාක්ෂණ නිලධාරී මේ ළිද සම්බන්ධව විමසලා තියෙනවා. එයාලත් ඒ ඉදිකිරීම කරන පුද්ගලයගේ පැත්තට කතා කරලා තියෙනවා මිසක් මේ ලිදේ අවශ්‍යතාවය පෙන්නල නැහැ. මම කිව්වා ඒක අදාල නැහැ. ඊයෙත් මම අදාල පුද්ගලයගෙ දුරකථන අංකය නැති නිසා සරත් අබේසේකර මහත්තයට කතා කරලා, අදාළ පුද්ගලයගෙ නොම්මරය අරගෙන කතා කරලා කිව්වා. සරත් අබේසේකර මහත්තයත් ඊයෙ ඒක බලන්න යනවයි කිව්වා. මට ඊයෙ යන්න බැරි වුනා. ඒ අදාළ අයයි, ඔබතුමන්ලයි කවුරුත් එකතුවෙලා එතන ලිද ලගට ගිහිල්ල පරීක්ෂණයක් කරන්න. මොකක්ද වෙල තියෙන්නෙ කියලා බලන්න. කරුණාකරල ඒක යථා තත්වයට පත් කරන්න කියන්න.

**ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා**

ගරු සභාපතිතුමනි, මම ගල් ටිපර් තුනක් ගෙනිච්ච එක ඇත්ත. ලිදට උඩින් පස් කියුබ් 20 ක 25 ක විශාල පස් කන්දක් ගොඩගහලා තියෙනවා. ඒ ඉදිකිරීම එන්.බී.ආර්.ඕ. එකෙන් තහනම් කරලද ? ඒ ගොඩනැගිල්ල හදන එක නතර කරලද?

සභාපතිතුමා එතන තව ලිං දෙකක් තියෙනවා. නිවාස දෙකකට පානීය ජලය ලබා ගන්නවා. සමහර විට ඉදිකිරීම කරන ස්ථානයේ උඩ ඒ ඉඩම් හිමියා වැසිකිලියක් ඉදි කරන්න පුලුවන්. මම හිතන්නෙ නතර කරලයි කියල නැහැ. අද උදේ මම එන කොටත්, ගල් විදලා, කම්බි දාලා, කොන්ක්‍රීට් යොදනවා. ඇයි සභාපතිතුමා වසර දෙකක් තිස්සෙ අපි කතා කරනවා. ඔබතුමාට කෙලින් තීරණයක් ගන්න බැරිද? ඇත්තටම අපි සභාව තුල ඉදල වැඩක් නැහැ. අපිට ගමේ මිනිස්සු දොස් කියනවා. සියලු දෙනා දොස් කියන්නෙ මන්ත්‍රීවරු හැටියට අපට. මෙවැනි ඉදිකිරීම්වලට සභා අනුමැතිය දෙන්නෙ මොකටද? එහෙම අනුමැතිය දීලා නැත්නම්, කොහොමද සභාපතිතුමා ගොඩනැගිල්ලක් ඉදිකරන්නෙ. අපට බලය තියෙනවා නතර කරන්න. මම ආර්.ඩී.ඒ. එකට කියල තියෙන්නෙ.මේ සම්බන්ධව ආර්.ඩී.ඒ. එක දැනුවත් කරල තියෙන්නෙ. දැන් ඒ ගල විදලා, සිමෙන්ති කොට්ට තුන් හාර සියයක, කොන්ක්‍රීට් දාලා තියෙනවා. ඒ මොනවත් අපට ඕන නැහැ. අපට අනවසර කතා අදාල නැහැ. ගරු සභාපතිතුමනි, මට ඕන. ප්‍රාදේශීය සභාව සතු පොදු නාන ලිද .ඒ අය තමයි කඩල විනාශ කළේ. ඒ ළිඳ යථා තත්වෙට පත් කරල දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමා මැදිහත් වෙලා මේක අපට නිරාකරණය කරල දෙන්න. දැන් අවුරුදු දෙකක් තිස්සෙ මම කතා කරනවා. නමුත් මේ වෙනතුරු මේකට නිසි පිළිතුරක් ඔබතුමාගෙන් ලැබිල නැහැ. ඒ නිසා ඔය දූරියන් ගහටත් වැඩිය ලොකු ප්‍රශ්නයක් මේක.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අප ප්‍රදේශයේ පොල් ගස් කැපීම පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තියෙනවා. දිනපතාම ලොරි රථ දෙකකින් පොල් කඳන් ප්‍රවාහනය කරනවා. මම හිතන්නෙ මේ මාපලගම ඇතුමලේ ප්‍රදේශයේ තමයි මේ විශාල වශයෙන්ම පොල් ගස් කැපෙන්නෙ. අපේ සභාවේ යෝජනාවක් හැටියට, අපිට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමු කරලා, අප ප්‍රදේශයේ තියෙන මේ පොල් වගාව කැපීම යම්තාක් දුරකට හෝ නතර කර ගැනීමට මම මගේ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා. ඒක සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මෙය විශාල අර්බුදයක්. මොකද පොල් හිග වෙන්නෙ. ඒ සියලු දේ වෙන්නෙ මේ පොල් ගස් කැපීම තුල. මම හිතන්නෙ දිනපතා පොල් ලොරි දෙකක් ප්‍රවාහනය කරනවා. ඒ පොල් ව්‍යාපාරිකයින්ට පොලීසිවලින් කිසිම බාධාවක් නැහැ. ඕවර් ලෝඩ් කියලා ලියන්නෙ නැහැ. අපි වෙන ලොරි රථයක මොනව හරි අරගෙන ගියොත්, ඕවර් ලෝඩ් උසාවි දාන්න ඕන කියාවි. එක එක ප්‍රශ්න. නමුත් එතුමාට ඒ කිසිම ප්‍රශ්නයක් නැහැ. වාහනේ පිටිපස්සෙත් 6 දෙනෙක් විතර යනවා. ඒ නිසා ඒ ගැනත් ඔබතුමා අවදානය යොමු කරලා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට නාගොඩ ප්‍රාදේශීය සභාවෙ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ මේ ප්‍රශ්න දෙකට ඔබතුමා මට ඉක්මනින් විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි, ඌරල ඉදිකිරීම සම්බන්ධව එන්.බී.ආර්.ඕ. එකෙන් රිපෝට් එක ඇවිල්ල වතුර පාරක් එනවයි කියලා. තාක්ෂණ නිලධාරීතුමිය පෙරේදා ගිහිල්ලා බලලා නතර කරන්න කියලා. මම එදා මලගෙදර යද්දි අදාළ ඉදිකිරීම කරන පුද්ගලයා මුණගැහුනා. ඒ පුද්ගලයා කිව්වා තාක්ෂණ නිලධාරීතුමිය ගිහින් ඉදිකිරීම නතර කරන්න කියල තියෙනවයි කිව්වා. මම කිව්වා ඒක නිලධාරින්ගෙ වැඩක්. මම මේ කියන්නෙ ඉදිකිරීම පිළිබඳ නෙවෙයි. ළිඳ පිළිබඳව. මේ ළිඳ පිළිබඳව ප්‍රශ්ණයක් තියෙනවා. අදාළ පුද්ගලයා කියන්නෙ ළිඳ පිහිටි තැන අපි අල්ලගෙන නැත කියලා. මම කිව්වා එහෙම නෙවෙයි ළිඳ විනාශයට පත්වුනේ ඔයාලගෙ අතින්, මට පැමිණිළි එනවා. එදා එතනදි ඔයාලා පොරොන්දු වුනා ළිඳ සකස් කරලා දෙනවයි කියලා. එතකොට ඔහු අහනවා කවුද පැමිණිලි කරන්නේ? අපි මේ ඉදිකිරීම කරලා, ළිඳත් සකස් කරලා දෙනවා කිව්වා. මම කිව්වා මට ගමෙන් පැමිණිලි එනවා. මන්ත්‍රීතුමාටත් ගෙදර ඉන්න විදියක් නැහැ. ඔබ ඔය ඉදිකිරීම පටන්ගත්ත දවසෙ ඉදලා, සභා වාර 25 ක් තිබුනනම්, 25 න් 24 කම ඔය පිළිබඳව කතා කරල තියෙනවයි කියලා මම කිව්වා. ඒ නිසා අපිව අපහසුතාවයට පත් නොකර ඉක්මණින් මේ කටයුත්ත කරන්න කියලා මම කිව්වා.ඒවගේම හැම තැනම අනවසර ඉදිකිරීම් ඉදිකරන්නෙ. ඇත්තටම මේ ඉදිකිරීමට සභාවෙ අනුමැතිය දීලා නැහැ.

ගරු මන්ත්‍රීතුමා, මේ දින කිහිපය ඇතුලත ඔබතුමාත්, සහබන්දු මන්ත්‍රීතුමාත්, අදාල ග්‍රාම නිලධාරිත් කැඳවලා අපි ඌරල පොදු ළිඳ පිහිටි ස්ථානයට ගිහිල්ලා පරීක්ෂණයක් කරමු. මම කැඳවන්නම් ඒක. මේ සුමානෙ ඇතුලත ඒ වැඩේ කරනවා.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයෙන්ද, ලේකම්තුමියගෙන්ද අවසරයි. 2020 අවුරුද්දෙ අවසාන මාසෙ රැස්වීම වෙලාව. ඇත්තටම අපි මෙතනට පැමිණෙන විට. මේ ස්ථානය බොහොම ලස්සනට තිබුනා. බොහොම ලස්සනට පුටු පේළි තියලා. ලස්සනට තිබුනා දැන් බලන්න කොහොමද කියලා. මම කවදාවත් වාඩි වෙච්ච තැන එහෙම කරන්නෙ නැහැ. මම මේ කාටවත් දොස් කියනවා නෙවෙයි. තැනක ඉන්න ක්‍රමවේදෙ අපි ඉගෙන ගන්න ඕන. මොකද හදිසියෙවත් කවුරු හරි

නිලධාරියෙක් හරි ආවොත්, අපේ සභාව කොහොමද කියලා හිතාවි. මෙහෙම ඉන්න කොට. ඒක නිසා මම කියන්නෙ අපේ ගරුත්වයත් තියාගෙන. අපි සභාවක් හැටියට 2021 වර්ෂයේදීවත් මේ අයවැය වාර්තාව අනුව වැඩකටයුතු කරාවිය කියලා මම බලාපොරොත්තු වෙමින් ලබන්නා වූ 2021 වර්ෂය කිසිම කෙනෙකුට, සභාපතිතුමාට දොස් පැවරීමට ඉඩ නොතබමින්, වැඩකටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙමින්, ඔබ සැමට ලබන්නා වූ අවුරුද්ද සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම ඇත්තටම පෙරේද හදිසියෙ තමයි අපිත් දැනගත්තෙ. දේශපාලන වශයෙන් නෙවෙයි කුමන පක්ෂයකින් වුනත්, ගමේ වැඩක් කරන තැන මම එතන ඉන්නවා. මොන පක්‍ෂ බේදෙ වුනත් මම එතන ඉන්නවා. මොකද ඒ ගම්වාසීන් හැටියට මගෙන් කෙරෙන යුතුකම් කොටසක් මම කොහොම හරි කරනවා. ඒ වගේම එදා පාලම විවෘත්ත කරන්න ඇවිල්ලා. කනත්තගොඩ ඉන්න ජනතාව පොඩි අමනාපෙකුත් සිදු වුනා එතනදි. මොකද මේ කාර්යයෙදි ප්‍රමුඛත්වය දුන්න අපේ වජිර ඇමතිතුමත්, නිශාන්ත නන්දන මන්ත්‍රීතුමත් මේකට මූලිකත්වය දරපු නිසා. ඒ ගොල්ලන්ට සහභාගි වීමට බැරි වීම පිළිබඳව. ලොකු කණගාටුවකට පත් වුනා. ඒ වෙලාවෙදි සම්පත් අතුකෝරල මහත්මයා ඇත්තටම වජිර මහත්මය ගැනත් නන්දන මහත්මය ගැනත් ඒ විස්තර ටික ඔක්කෝම දැන ගෙන ඇවිල්ල තිබුනා. මම දන්නෙ නැහැ කොහොමද තොරතරු දැනගත්තෙ කියලා. කොහොම හරි විස්තරේ දැන ගෙන ඇවිල්ලා. එතනදි ස්තූති කළා. ඒක නිසා මම හිතන්නෙ අපි ආණ්ඩු වෙනස්වෙන කොට ප්‍රශ්න ඇති වෙනවා. අපි ඒවා ගණන් නොගෙන ඉදිරි කාර්යයන් කර ගැනීමට අපේ ධෛර්යය ශක්තිය ලබා දෙන බවත් පවසනවා.

ඒ වගේම අර පැල ගැන කිව්වා. ඇත්තටම පැල තවාන සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමා විසින් තමයි. පැල දීල තිබුනෙ. එක්කෙනාට පැල හතරක් වගේ තමයි දීල තිබුනෙ. ඒ පැල ක්‍රමය අසාර්ථකයි. මොකද කෘෂි පර්යේශන නිලධාරිටයි, ආර්ථික සංවර්ධන නිලධාරිටයි තව වෙනතුරු පැල නැහැ. සමෘද්ධි සංවර්ධන නිලධාරිටයි, ග්‍රාම නිලධාරීතුමාටයි විතරයි පැල දීල තියෙන්නෙ. එතකොට කෘෂි කර්ම නිලධාරීතුමිය ගමේ ගෙවතු වගාව දැනට කොහොමත් කරගෙන යන එක්කෙනා. ඒක නිසා ඒ අයට ඒ පැල ටික ලැබුනෙ නැහැ. යටලමත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරීතුමියටයි, ග්‍රාම නිලධාරීතුමියටයි විතරයි පැල දුන්නෙ. සංවර්ධන නිලධාරිතුමියගෙ එකයි කෘෂි කර්ම නිලධාරීතුමියටයි දුන්නෙ නැහැ. මොකද එයාලට තවම අනුමත වුනේ නැහැ කිව්වා. තවම ඒ ගොල්ලන්ට කෘෂි කර්ම එකෙන්වත් දැනුම් දීල නැහැ කිව්වා. තවම සංවර්ධන තුමියටත් දැනුම් දීල නැහැ කිව්වා. මමත් නිතරම හොයනවා. ක්‍රියාවලිය අසාර්ථකයි. ඒ නිලධාරී හතර දෙනාටම පැල ටික ඒ නිලධාරීන් හතරදෙනාගෙ ඉන්න සමාජිකයින්ට ලබා දිය යුතුයි කියලා මම ඉල්ලීමක් කරනවා. එදා ඒ කමිටුවට කැදෙව්ව වෙලාවෙ මමත් අපේ විජිත් මන්ත්‍රීතුමත් අපේ නන්දන මන්ත්‍රීතුමත් ගියා. එතනදි කොරෝනා පිළිබඳ උපදෙස් ලබා දුන්නා. මොකද අර සමෘද්ධි නිලධාරී මහත්මයගෙ කොටසෙ එක්කෙනා පැලේ ඉන්දනවා. සමහර අනිත් එක්කෙනාට නැති වුනාම පොඩි අමනාපයක් ඇති වෙනවා. ඒ නිසා ඒ අමනාපකම් නැති වෙන්න. හතර දෙනාටම එකහා සමානව. දෙන ආධාර ටික බෙදා දෙන්න කියලා. මොකද එතනදි තව එකක් වෙනවා. ගෙවල් 480 ක් තියෙනවනම් ගෙවල් 200 යි තෝරගෙන තියෙන්නෙ. ඒ පාර එදා උපදෙස් දුන්නා අපට. ඒ ගෙවල් 200 ට කැමති අයට පමණක් වැඩ කරන්නෙයි කිව්වා. පැල තවාන් දාන්න. ඒ පැල ඉන්දන්න. ඒ කැමති අයට විතරක්. ඒ නැති අයට අනිත් අර ඉතුරු 80 ක් වගේ තියෙන එකෙන් කැමැත්තෙන් ඉදිරිපත් වෙන්න පුලුවන් කිව්වා. අන්න එහෙම වැඩපිළිවෙලක් තමයි යන්නෙ. එතනදි මම හිතන්නෙ ගොඩක් දුරට පැල අඩුවෙන් ලබාදීම නිසා පැල තවාන් දාපු තැන්වල පොඩි පොඩි අසාර්ථක වීම් වෙලා තියෙනවා.

ඒ වගේම කුකුළු පැටවු 10 ක් දෙනවා කිව්වා. ඒ වගේ ඔය පොල් පැල දෙන එක ඒ සියලුම දේවල් දෙනවා කිව්වා. දෙනවනම් ඒ වසමෙ නිලධාරි හතර දෙනාටම එක දවසට දෙනවනම් හොඳයි කියල

මම කියනවා මොකද දෙගොල්ලෙකුට දීල අනිත් ගොල්ලන්ට නොදුන්නහම වාද බේද ඇතිවෙනවා. ඒ නිසා වාද බේද නැති කර ගන්න නම් මේ හතර දෙනාගෙම වැයික්කියට අයිති කොටසෙ ඒ ටික එක තැනක දෙන්න කියලා ඉල්ලීමක් කරමින්, මම නිහඩ වෙනවා. ඔබ සැමට සුභ සන්ධ්‍යාවක් වේවා කියල ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රිනී සුභාෂී ඒකනායක මෙනවිය**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන්ම හදවතින්ම සතුටු වෙනවා. සහෝදර මන්ත්‍රීතුමියක් තේරිලා පත්වෙලා ආපු එක පිළිබඳව. ඔබතුමියට සුබපතනවා ඉදිරි වැඩකටයුතු සාර්ථකව කරගෙන යන්න.

ඒ වගේම අපේ සහබන්දු මන්ත්‍රීතුමා කතා කළා. එතුමන්ලා ගෙනැල්ලා අත්හැරපු පාරවල් තමයි දැන් මේ වැඩකටයුතු කරගෙන යන්නෙ කියලා. ඔබතුමාට මතක් කරන්න ඕන. ඔබතුමාල ගෙනැල්ලා ලක්‍ෂ නවසිය විසි හතක් මාපලගම ගෝනලගොඩ හොරංගල්ල මාර්ගය අතහැරපු තැන ඒ ආකාරයෙන්ම තියෙනවා. ආයතනවලට මුදල් ගෙවපු නැති ප්‍රශ්න යම් යම් ප්‍රශ්න හේතුවෙන් ඒකෙ ඉදිරි වැඩකටයුතු මේ වනවිට කරගෙන යන්න බැරි තත්වෙ තියෙන්නෙ. ඒ පිළිබඳව මතක් කරනවා.

ඊලගට ඔබතුමා මතක් කළා. අනුන්ගෙ ළමයින්ට උප්පැන්න දෙන්න. ඒකෙ මම හිතන්නෙ ප්‍රමුඛතාවය ලැබෙන්න ඕන ඔබතුමන්ලට. ලංකාව වටේ මහින්දෝදය විද්‍යාගාර ඉදිකරලා තියෙන වෙලාවක පවතින රජය හැටියට මම හිතන්නෙ ඔබතුමන්ලගෙ රජය විසින් මහින්දෝදය කැල්ල අයින් කරලා. ඉස්කෝලවල ඒ සියලු ව්‍යාපෘති විවෘත්ත කළේ ඔබතුමන්ලගෙ පවතින රජය. ඒ විදිහටම තමයි නව පාලම් ටිකත් ඒ පවතින රජයක් හැටියට ආසන සංවිධායක සම්පත් අතුකෝරල මැතිතුමා අතින් පසුගිය දවසක විවෘත්ත කළා. කලින් විවෘත්ත කරන ප්‍රශ්නයක් තිබුනෙ නැහැ. මම කියන්නෙ මගේ ගමේ පාලම ගැන මම කතා කරන්නෙ. අනිත් එක මතක් කරන්න ඕන. ඒ පාලම් ව්‍යාපෘතිය ආරම්භ කරලා අවුරුදු ගානකට පස්සෙ ඒකෙත් මුදල් ගෙවීමේ ප්‍රශ්න හේතුවෙන් වැඩ නතර වෙලා තියෙන වෙලාවක, මුදල් ගෙවීම නතර කරපුවයි මුදල් ගෙවීම නිසා තමයි වැඩ අවසන් වුනේ. ගමුමැද්දෙගොඩ නාගොඩ ප්‍රධාන පාලම දාන්නත් ගියේ මාස ගානයි. ඒ මාස ගානක් ගියේ ප්‍රධාන පාලම ලොකු පාලම දාන්න. ඒ වගේම ඔය පාලම් ප්‍රොජෙක්ට් එක පටන් ගෙන අවුරුදු ගානකට පස්සෙ තමයි වැඩ නිම කරන්න පුලුවන් වුනේ. ඇත්තටම වජිර ඇමතිතුමා ඒ පාලම් ලබා දීම පිළිබඳව ස්තූති කරන්න ඕන.

ඒ වගේම අප කොට්ඨාසයේ වීපී පහන් මේ වන විට යථා තත්වයට පත් කිරීමට අවශ්‍යතාවය තියෙනවා. ඒ පිළිබඳවත් අවදානය යොමු කරන්න කියලා මතක් කරමින්, ලබන්නාවූ අවුරුද්ද සියලුම දෙනාට සුබ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී නන්දන නිශාන්ත මහතා**

සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. සභාපතිතුමාට යන්න ඕන ඇති මට විනාඩි දෙකක් දෙන්න. එදා සම්බන්ධීකරණ කමිටුව තියෙයි කියලා ඉක්මනින් ගියා. අද සභාපතිවරුන්ගෙ රැස්වීම තියෙනවයි කියලා ඉක්මනින් යනවා. ප්‍රශ්නයක් නැහැ ජනතාවට සේවය කරන්නනෙ. අපි අලුත් මන්ත්‍රීතුමියගෙ මුහුන හරියට දැකලත් නැහැ. හෙට කොහේදි හරි හම්බ වුනොත් කතා කරන්න බැරි වේවි. මොකද ඔබතුමියගෙ මූන පේන්නෙ නැහැනෙ. ඒ හින්දා සමාවෙන්න කොහේදි හරි හම්බ වෙලා කතා නොකර හිටියොත්. නමුත් අපි ඔබතුමියට සුබ පතනවා.

ඒ වගේම කණගාටු වෙනවා. අපේ විජිත් සහබන්දු මන්ත්‍රීතුමා ගැන. ඒ හේතුව තමයි මට ආරාධනා නොකිරීම පිළිබඳවවත්, ඒ මොනවත් හින්දා නෙවෙයි. තියෙන ප්‍රශ්නෙ. ඔබතුමාට කොන්දක්

නොතිබිච්ච එක ගැන. සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමාට කියන්න. මේක වැරදියි කියලා එච්චරයි මම කියන්නෙ. ඒ ගැන කතා කරන්නෙ නැහැ.

ඊලගට සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති සම්පත් මැතිතුමා පිළිබඳවත් මගේ ගෞරවයක් තියෙනවා. ඒ කියන්නෙ එයාගෙ, අපේ දේශපාලන වශයෙන් ප්‍රශ්න තියෙන්න පුලුවන්. පියසේන ගමගේ ඇමතිතුමා එදා නෙළුවට, තවලමට වැඩ කරන කොට එක කාපට් අඟලක් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දැම්මෙ නැහැ. ඒක වගකීමෙන් කියන්නෙ. මේ බල ප්‍රදේශය තුල කොහේ හරි කාපට් කරලා තියෙනවනම් මම මන්ත්‍රීකමෙන් අයින් වෙනවා. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ කොහෙවත් කාපට් දැම්මෙ නැහැ. මේ සුභාෂි මන්ත්‍රීතුමිය මොනව කිව්වත් අපි ඇවිල්ල තමයි කාපට් දැම්මෙ. එතකොටත් මේ ජොෂ්ඨ මන්ත්‍රීවරු හිටියා. අපේ සුභාශි මන්ත්‍රීතුමිය අවතක්සේරු කළත්, නොකළත් ඒක මම දන්නෙ නැහැ. එතුමියගෙ තත්වයක්. රීජ් එක හරහා ඒක කළා. ඊට පස්සෙ සුසන්ත මන්ත්‍රීතුමාලගෙ විලේ පාර කළා. ඒකත් ඒ කාලෙ කළේ. හිනිදුමට නෙළුවට කරන ටික මෙහේට ගෙනැල්ලා. නාගොඩට කරන එක පිළිබඳව දේශපාලන කුහක කමකින් තොරව ඒ පිළිබඳව සම්පත් මන්ත්‍රීතුමා අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙ සභාපතිවරයට ගරු කරනවා. අගය කරනවා. එතුමා එදා යටලමත්තට ගිහින් පාලම විවෘත්ත කරන්න ඇත්තෙ කවුරු හරි දීපු මොට්ට උපදේශයක් නිසා වෙන්න ඇති. ඒ ගැන නැවත නැවතත් මම කතා කරන්නෙ නැහැ.

ඊලගට ගරු සභාපතිතුමනි, ඔබතුමාට තියෙන බලය තව කෙනෙකුට පවරනවනම්, තමුන්නාන්සෙලා අපි මේ මන්ත්‍රීවරු ඡන්දයක් දීලා. අයවැයට අත උස්සලා. නැත්නම් වෙනත් විදිහට යෝජනාවල් ඉදිරිපත් කරලා. තමුන්නාන්සෙට මහජනතාවගෙ බලය එනවා මේ පනතෙ දැන් මේ ලක්රුවන් මන්ත්‍රීතුමා අපේ සුසන්ත මහත්තය කෙස් පැලෙන තර්ක ඉදිරිපත් කරල තියෙනවා. බලය පෙන්නුවා. දැන් කමිටු දාල එක එකාට බලය දෙන්නෙ මොකටද සභාපතිතුමා. මිනිස්සු තරහ වෙයි කියලා, පතිනායක මන්ත්‍රීතුමාට උත්තරය දෙන්න බැරුව ලත වෙනවා. ගයාන් මන්ත්‍රීතුමා කතා කළා. ඒකට උත්තරයක් දුන්නෙ නැහැ. නිලධාරීය ගස සම්බන්ධයෙන් ගත් තීරණය ක්‍රියාත්මක කරන්න මාස හයක් අවුරුද්දක් යනවා. සභාපතිතුමා. මොනවද ගහ වැටෙනකම් ඉන්නවද? අන්තිමට මන්ත්‍රීවරුන්ගෙ ගෙවල්වලට උදේට මිනිස්සු ඇවිල්ලා කියනවා. මේ කටයුතු කරන්නෙ නැහැ කියලා. ඊට පස්සෙ මේ ගමේ මිනිස්සු අපිත් එක්ක තරහ වෙනවා. අපි ගාවට බෝලෙ එන්න කලින්, තමුන්නාන්සෙ ගාවට එවල තියෙන්නෙ. තමුන්නාන්සෙ ඒකට හරියට සෙල්ලම් කරල නැහැ. හරියට උත්තරේ දීල නැහැ. උත්තරේ දුන්නනම් මොකද මාස ගණන් අවුරුදු ගණන් එක එක තැන්වලට යන්නෙ. ප්‍රාදේශීය ලේකම් ගාවට යනවා. දැන් කමිටු දානවා. බලන්න හැම තැනම ඒ වගේ.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා මට ඒකට පොඩි උත්තරයක් දෙන්න ඉඩදෙන්න. මාපලගම වැඩිහිටි සමිතියේ ගස් ප්‍රශ්නෙ. එකේ දැන් ගිහිල්ලා බලන්න. වැඩිහිටියො කරපු දේ හරිද කියලා. ගහට ඉතා ආසන්නයෙන්ම මේ තාප්පෙ බැඳලා. දැන් අනතුර ලගට ගිහිල්ලා ඒක අනවසර ඉදිකිරීමක්. මම අර මිනිස්සුන්ට ගහ බැඳලා අවශ්‍ය කටයුතු කරන්න කිව්වා. ඒ කර්තව්‍ය සිදු කරල නැහැ. ඊට පස්සෙ දෙගොල්ල බේර ගන්න බැහැ. මේ සම්බන්ධයෙන් එක්කෙනෙක් තව එකක් කියනවා. එක එක මන්ත්‍රීවරුන්ගෙන් අදහස් එනවා. මේ දෙපැත්ත බැලන්ස් කරලා, අන්තිමට බැරිම තැන තමයි දැන් මම කමිටුවක් දැම්මෙ. ජනාධිපති ලගට වෙනකම් මේ ප්‍රශ්නෙ ගිහිල්ලා තියෙනවා. එක්කෙනෙක් කියනව මේක අනවසර ඉදිකිරීමක් කියලා. අනිත් එක්කෙනා කියනවා ගහ අනතුරු දායකයි කියලා. මන්ත්‍රීවරු දැන් ගිහිල්ලා බලන්න. කවුද හරි කවුද වැරදි කියලා.

**ගරු මන්ත්‍රී නන්දන නිශාන්ත මහතා**

සභාපතිතුමා, මගේ ඉඩමේ මායිමට මායිම තියෙනවනම්, මගේ මායිමේ තාප්පෙ බඳින්නෙ නැතුව, ගහ ආපස්සට ගන්න කියලද කියන්නෙ. එහෙම කොහොමද බැරි මගේ මායිමේ තාප්පෙ බඳින්න බැරිනම් මොනවද සභාපතිතුමා ඔය කියන කතා. මේ නිලධාරියෙක් තීන්දුවක් දුන්නට පස්සෙ, මන්ත්‍රීවරු කවුරු හරි කියන ඒවට තීරණ වෙනස් කරන්න බැහැ. ඔබතුමා තීරණ වෙනස් කරන්න එපා. සභාපතිතුමා එහෙනම් නිලධාරි යවන්න එපා. මන්ත්‍රීවරුන්ට ගමේ දේවල් විසඳන්න කියන්න. සභාපතිතුමා ඔයා මොනව කිව්වත් ඔයා අද ෆේල්. එක එක නිලධාරි කොහොම හරි තීන්දුවක් දුන්නම, තීන්දුව ක්‍රියාත්මක කර ගන්න බැරි තත්වයක් තියෙන්නෙ. මේ මන්ත්‍රීවරු කණගාටු වෙනවා. මොකද සභාපතිතුමා, තීන්දුවක් අරගත්තනම්, තීන්දුව තීන්දුව විදිහට තියෙන්න ඕන. මම ගරු කරනවා ඒ අතින් විලේගේ සභාපතිතුමා හරි හෝ වැරැද්ද එයා ඒක කළා. ඔයා හැම තිස්සෙම බලන්නෙ මිනිස්සු තරහ නොකර ගන්න. මිනිස්සු තරහ කර ගන්න එක නෙවෙයි මෙතන තියෙන ප්‍රශ්නෙ . නීතිය ක්‍රියාත්මක කරන්න. තාක්ෂණ නිලධාරීතුමිය ගිහිල්ලා, අද බැම්මක් තහනම් කළා. මෙතන මම කියන්නෙ ඒක වැරැද්දක්. නමුත් අද තට්ටු ගණන් බිල්ඩින් ගහල තියෙනවා. තල්ගස්වල ඉඳලා ඌරලට යනකම්, අර පැත්තෙ උඩුගමට යනකම්, මේ පැත්තෙන් උනන්විටියට වැලිවිටියට යනකම් එක බිල්ඩින් එකක් තහනම් කරල තියෙනවද? දුප්පත් බැරි මිනිහටම තමයි මේ හැම නීතියම තියෙන්නෙ. කරන්න බැරි මිනිහට තමයි. ඔයත් එක්ක ඉන්න මන්ත්‍රීවරයට හිතවත් නැත්නම් ඒ මිනිහට වැඩක් කරන්න බැහැ. මේ සමාජෙ මහ කැත විදිහට ජඩ විදිහට දේශපාලනය ක්‍රියාත්මක වෙන්නෙ. ඔබතුමා නැහැ කිව්වත්, මේක තමයි ඇත්ත. වැඩිය ඕන නැහැ. ඔබතුමාගෙ ගෙදර ඉස්සරහ තොටු පොළත් වැරදියි. මට මේක උදේ එනකොට කිව්වා. ඔහෙලට ජේනනෙ නැද්ද කියලා මේක. මම කතා නොකර ඉන්න හැදුවෙ. මොකද ලැජ්ජයි මට. ඇත්තටම වැරදියි ඒක. ඒ තොටුපොළ ඕන කෙනෙකුට ගියාම ජේනව වැරදියි කියලා. මම කියන්නෙ සභාපතිතුමා වැරැද්ද වැරැද්දමයි. සභාපතිතුමා නෙවෙයි කවුරු කළ වුනත් වැරැද්ද වැරැද්දමයි. අද පාරයි තොටුපොළයි තියෙන විදිහ දැක්කම වැරදියි. එච්චරයි. ඒක ධර්මසිරි මන්ත්‍රීතුමාත් මෙතන කතා නොකර ඉදීවි. ගයාන් මන්ත්‍රීතුමත් කතා නොකර ඉදීවි. ලක්රුවන් මන්ත්‍රීතුමත් කතා නොකර ඉදීවි. මමත් කතා නොකරන්න ආවෙ. නමුත් කතා කරන්න වුනා. සභාපතිතුමා, නිලධාරියෙක් තීන්දුවක් ගත්තම, ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න දෙන්න. බැරි මිනිහට එකක්, ඔයාලට පක්ෂ එක්කෙනාට තව එක විදිහක්. මේ විදිහට කරන්න එපා. අවංකවම අපි කණගාටු වෙනවා. ඔබතුමා විපක්ෂෙ ඉන්න කොට කොහොමද කතා කළේ. විලේගේ සභාපතිතුමත් එක්ක හැප්පුනේ කොහොමද කියලා. අද ඔබතුමා සභාපතිවෙලා මොනවද කරන්නෙ. ඇත්තටම කණගාටුයි.

පැමිණිලි කරන කොට, දුප්පත් මිනිහගෙ විතරක් තහනම් කරන්න එපා. මම කියන්නෙ ඒකයි. මිනිස්සු බයයි. දුප්පත් මිනිහගෙ තාප්පෙ රාජ්‍ය නිලධාරියෙක් ඇවිල්ලා තහනම් කළාම, ඒ මිනිහට බය හිතෙනවා. නමුත් ලොකු මිනිහා තට්ටු ගණන් ගහනවා. එක සත පහකට ගණන් ගන්නෙ නැහැ. මොකක්ද අපි කරපු දේ මොකුත් නැහැ. බැරි මිනිහා අපේ ගෙවල්වලට ඇවිල්ලා තව මන්ත්‍රීවරුන්ගෙ ගෙවල්වලට ගිහිල්ලා කියනවා. නිලධාරිත් දැනගන්න ඕන. දැන් අර ජයවීර මන්ත්‍රීතුමා කිව්වා පොලීසිය කතා කරපු විදිහට එල්ලිල මැරිලයි කියලා. ඒ වගේ මිනිස්සු ගම්බිම්,ගෙවල් දොරවල් දාලා යනවා. මේ බැරි මිනිස්සුන්ට මේ වගේ කරන්න එපා. නීතියනම් නීතිය හැමෝටම එක වෙන්න ඕන. ඔබතුමන්ලා එහෙම කරන්නෙ නැහැ. මම කියන්නෙ මම විලේගේ මන්ත්‍රීතුමාගෙ මොන අඩුපාඩුව තිබුනත් නිලධාරි මොනව හරි කිව්වනම්, එතනදි එයා ඒක කළා. මම හරි කැමතියි ඒකට. ඔබතුමා නීතිය ක්‍රියාත්මක කරන්න. අපට මොන දෙයක්වත් එපා. අපි ඉල්ලන්නෙත් නැහැ. අපිට මේ අවුරුදු තුනට අපේ සභාපතිතුමා මොකුත්ම දීලා නැහැ. මෙතුමට මම මොකුත්ම කියන්නෙත් නැහැ. මම කොරිපස් එකක් ඉල්ලුව. මට කිව්වා විජිත් සහබන්දු මහත්තයට පොඩ්ඩක් මතක් කරන්න කියලා. ඇත්තටම එදායින් පස්සෙ මම කිව්වෙ නැහැ. මමත් මන්ත්‍රීවරයෙක්. එයාට තියෙන අයිතිවාසිකම් තමයි මට තියෙන්නෙත්. මම මොකටද ආපහු කියන්නෙ. අද වෙනකම් මම කිව්වෙ නැහැ. ඔබතුමා කල්පනා කරන්න විලි ලැජ්ජ නැතුව මට විජිත් සහබන්දු මහත්තයට කියන්න පුලුවන්ද? මට කොරි

පස් එකක් එවන්න කියලා. අපි එවැනි තැනකට පත් කරන්න එපා. ලයිට් එකක් ඕන්නම් ඉල්ලන්න කියලා, මම ඒකත් ඉල්ලුවෙ නැහැ. අපට එපා සභාපතිතුමා ඒක ගැටලුවක් නැහැ. නමුත් ඔබතුමා කිව්වා විපක්ෂෙන් උදවු කරන්නෙ නැහැ කියලා. අජිත් එඩේර ආරච්චි මන්ත්‍රීතුමා සභාපතිධූරය හෙබ වූ කාලයේ චෙක් අත්සන් කරන්න ඉස්සර බලය තිබුනෙ ලේකම්තුමියට නෙවෙයි සභාපතිවරයට. එතුමට චෙක් එකක් අත්සන් කරන්න බලය දීලා, ඒ පක්ෂයේ මන්ත්‍රීවරු අත ඉස්සුවෙ නැහැ. අත උස්සල එතුමට චෙක් අත්සන් කරන්න බලය දුන්නෙ අපි. අපි එහෙම මේක කඩා කප්පල් කරන්නවත්, කෙනෙක් අපහසුතාවයට පත් කරන්නවත් කටයුතු කරන්නෙ නැහැ. නමුත් ඔබතුමා කරන දේවල් නිසා අපි අපහසුතාවයට පත්වෙනවා. මොකද ඔබතුමන්ලා ඒ නීතිය ක්‍රියාත්මක නොකළහම, මිනිස්සු අපි මූණ ගැහෙන්න එනවා. අපි ඒකට කතා කළහම මෙතන ඉන්න මන්ත්‍රීවරු ගිහිල්ල කියනවා. ඔයාට විරුද්ධව අරයා කතා කළා කියලා. ඒ මිනිහ අපිත් එක්ක පෞද්ගලික අමනාපකම් ඇති වෙනවා. අද දවසෙ මේ හැම මන්ත්‍රීවරයම නැගිටලා කතා කළොත්, නැගිටල කතා කරපු හැම මන්ත්‍රීවරයෙක් එක්කම ගෙදරට යන කොට මනුස්සයෙක් තරහ වෙනවා. මේක තමයි ඇත්ත. මේ තත්වෙට පත් කළේ ඔබතුමා. මම දන්නෙ නැහැ අනිත් මන්ත්‍රීවරුත් එහෙම තමයි. කියන්නෙ නැතුව ඇති. නමුත් ඔබතුමත් එක්ක පෞද්ගලික ප්‍රශ්නයක් නෙවෙයි මට තියෙන්නෙ. තනතුරත් එක්ක ප්‍රශ්නයක් තියෙනවා. අද ඔයාට විරුද්ධව ඡන්දය දුන්නනම්, ඒ ඔබතුමා හැසිරෙන විදිහත් එක්ක ගරු සභාපතිතුමා. තරංග මන්ත්‍රීතුමා කිව්වා. මාත් ඔයාලට විරුද්දව ඡන්දෙ දෙන්නෙ නැහැ. ඒක වෙන කතාවක් ඒ කියන්නෙ ඔබතුමාට විරුද්දව ඡන්දෙ දීල වැඩක් නැහැ මොකද? ඒ මගේ ප්‍රතිපත්තිය. නමුත් ඔයා හැසිරෙන විදිහ සභාපතිතුමා අවංකවම කණගාටුයි. ඒ නිසා රජයේ නිලධාරියා තීන්දුවක් ගත්තනම්, ඒ තීන්දුවට පිටින් යන්න එපා. එයා මොකක් හරි හේතුවක් නිසා එක කියන්නෙ. ඊට පස්සෙ ඒ නිලධාරි ඒක කිව්වම අර මනුස්සය අපේ ගාවට එනවා. අපි අසරණයි. දැන් මේ මිනිස්සු පෞද්ගලිකව තරහ වෙනවා. තවත් කතා කරන්නෙ නැහැ. ඔබතුමාට යන්න පරක්කු වෙන විත්තිය පෞද්ගලිකව මට තේරෙනවා. ඒ හින්දා සමාවෙන්න. කණගාටුව ප්‍රකාශ කරනවා සමාවෙන්න. මේ තත්වෙට කතා කළාට. නැවත වාරයක් මම කියන්නෙ. අපි හැදුවනම් අපි මහන්සි වුනානම් ඒක අපි තෘප්තියක් ලබනවා. ඒකට අයිතිවාසිකම් කියන්න අපිට ඕන නැහැ. ඒ වගේම අපේ යුතුකම තමයි. ජනතාවයි රජයයි අතර තියෙන සම්බන්ධතාවය යා කරලා, සංවර්ධනය ගමට ගේන එක. ඔබතුමාලගෙ දක්ෂතාවය. අපේ ආණ්ඩුවට ඒ දක්ෂතාව තිබුණා. අපේ එක එක්කෙනාගෙ හැකියාවන් මත ඒ දේවල් කරනවා. ඒක තමයි අපෙන් වෙන්න ඕන. මෙතනට ඇවිල්ලා රංඩුවෙලා. මෙතනට ඇවිල්ලා හිත් අමනාප කරගෙන යනවට වඩා. ඔබ මොනව හරි සහයෝගයක් ඉල්ලනවනම් ඒ සහයෝගය ලබා දෙනවා. ඒ වගේම ගයාන් මන්ත්‍රීතුමාට මම කණගාටුව ප්‍රකාශ කරනවා. එදා උත්සවයට එන්න බැරිවීම පිළිබඳව. එතුමා මට ආරාධනය කළා. මම නැවත වාරයක් සමාව ඉල්ලනවා. එන්න නොහැකිවීම සම්බන්ධව. ඔබ සියලු දෙනාටම 2021 අවුරුද්ද හොඳ වෙයි කියලා ප්‍රාර්ථනා කරමින්, සියලු දෙනාටම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඔය තොටුපොළ හැදූවෙ අද ඊයෙ නෙවෙයි. දැන් අවුරුදු ගානකට උඩදී.

ඒවගේම ගරු මන්ත්‍රීතුමනි, සියලු දෙනාගෙ හිත හොඳ කරන්න ගිහිල්ලා තමයි මටත් මේ වැරදිලා තියෙන්නෙ. මීට පස්සෙ මම ඒක කරන්නෙ නැහැ. කවුරුත් මේ හක්කෙ බුදු රැස් බොක්කෙ දඩමස් අපේ මේ සියලු දෙනාගෙම එච්චරයි. අපි සියලු දෙනාම කටින් තමයි හැමදේම කරන්නෙ. අනවසර ඉදිකිරීම් හැම තැනම තියෙනවා. පැමිණිලි කරොත් විතරයි අපට ඒක කරන්න පුලුවන්.

ඔබතුමා කිව්වා මම නීතිය ක්‍රියාත්මක කරන්නෙ නැහැ කියලා. වැඩිය ඕන නැහැ. අද ගරු මන්ත්‍රීවරු සභාවට ඇවිල්ල තියෙන විදිය බලන්න. සභාවට එනවනම්, එන්න ඕන පිළිවෙලක් තියෙනවා. අද

කවුද එහෙම ඇවිල්ල තියෙන්නෙ. කීප දෙනයි. ඉතිං මටත් පුලුවන්, ඒ නීතිය ක්‍රියාත්මක කරන්න. එතන තමයි වැරැද්ද.

ඒවගේම ගමේ සංවර්ධන කටයුතු කිරීමේදී මම ඒ කටයුත්ත කරන්නෙ ඇත්තටම කොට්ඨාසෙ මන්ත්‍රීවරයා මූලික කරලා. එයාලත් එක්ක ඔයාල සම්බන්ධ වෙලා ගමේ පොදු වැඩ කරන්න.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම අපේ සියලුම මන්ත්‍රීතුමන්ලාට ලබන්නාවූ නව වසර සුබ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම සුබ නත්තලක් වේවා. ඒ වගේම අලුතින් පැමිණි මන්ත්‍රීතුමියටත් අපේ සුභාශිංසන එකතු කරනවා. ඒ වගේම රංජිත් මන්ත්‍රීතුමාගෙ අක්කගෙ පුතාගෙ හදිසි අභාවය ගැන අපි එතුමාටත් කණගාටුව ප්‍රකාශ කරනවා. ගරු සභාපතිතුමාට පහුගිය වසර කීපය තුල නොයෙක් අපවාද චෝදනා එල්ල වුනා. ඒත් එතුමා යම් හැකිතාක් ජනතාව වෙනුවෙන් ලබාදිය හැකි සේවාවන් එතුමා කළා. මම හිතන්නෙ ලබන වර්ෂය එතුමාට සුබ වසරක් වේවි. මොකද ප්‍රතිපාදන ලැබෙමින්පවතින නිසාත්, සංවර්ධන යෝජනා විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වීමට තියෙන නිසා ලබන වර්ෂය එතුමාට, සියලුම මන්ත්‍රීවරුන්ට ඉතාම වාසනාවන්ත වර්ෂයක් උදාවේවිය කියල අපි බලාපොරොත්තු වෙනවා.

ඒවගේම අපේ විපක්ෂ නායකතුමා කිව්වා. යටලමත්ත පාලම විවෘත්ත කිරීම ගැන. ඇත්තටම මන්ත්‍රීතුමනි, ඒ දින තුනකට කලින් විවෘත්ත කළේ කොන්ක්‍රීට් එකේ නියම කාලෙට අනුව. ගරු සභාපතිතුමනි, ඔබතුමත් දන්නවා. සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමාට ජනතාව ඉල්ලීම් කරල තිබුනා. පාලම් හදලා නිකන් තියෙනවා. මිනිස්සුන්ට කොරිපස් ටික ගෙනියන්න විදිහක් නැහැ. අලුතින් කාපට් පාරවල් හදලා සංවර්ධන කටයුතු වලට යන්න විදිහක් නැහැ. ගෙයක් හදන කොට වැලි එක ගෙනියන්න විදිහක් නැහැ. මේව විවෘත්ත කරන්න කියලා ඉල්ලීම් තියෙනවා.

ඒ වගේම අපේ නියෝජ්‍ය සභාපතිතුමා ඉන්නවා. ඒ පිළිබඳ කතා කරාවි. මොකද සම්පත් මැතිතුමාට ඉරිද දවසෙ නිවාඩු. ලබන ඉරිදත් එන්න විදිහක් නැහැ කිව්වා. ඒක නිසා කඩිනමින් එතුමා පාලම විවෘත්ත කරන්න තීරණය කළා. එතුමා ඒක ඇවිල්ල කළා. ඒක ඔබතුමාලට අපි විශේෂයෙන් නන්දන මන්ත්‍රීතුමාට අපි ස්තූති වන්ත වෙනවා. ඇත්තටම නෙලී මන්ත්‍රීතුමියගෙන් අහන්න. එදා මගේ පෝන් එකේ ඔක්කොම අංක ඩිලීට් වෙලා. ඇත්තටම මේ නෙලී මන්ත්‍රීතුමිය දන්නවා. එතුමියගෙත් ගෙදරට ගියා. ගෙදරට ගියාම නන්දන මන්ත්‍රීතුමා, ඇත්තම කතාව. මම නෙලී මන්ත්‍රීතුමියගෙන් ඇහුවා ඔබතුමාගෙ නම්බර් එක මොකක්ද කියලා. ඒ පාර කිව්වා. නෙලී මන්ත්‍රීතුමිය කතා කළාය කිව්වා. ඔබතුමා එන්නෙ නැත කිව්වා. අපේ නායකතුමා නැති නිසා එන්නෙ නැත කිව්වා. මම කිව්වා එහෙනම් කතා කරලා, කරදර කරලා වැඩක් නැහැ කියලා. අපි ගමේ සංවර්ධන කටයුත්තක් කළා. ඒකට මූලික වුන නිසා ඔබතුමාට ගමට අපි ස්තූති කළා. ඔබතුමාගෙ ඉතුරු ඉල්ලීම් ටිකත් කරල දෙන්නම් නන්දන මන්ත්‍රීතුමා. ගමට සංවර්ධන කටයුතු ගේන්න මූලික වෙලා ඔබතුමාලා කටයුතු කිරීම ගැන අපි නැවතත් නන්දන මන්ත්‍රීතුමාට ස්තූති වන්ත වෙනවා. මම හිතන්නෙ අපේ නන්දන මන්ත්‍රීතුමාගෙ ශක්තියෙන්ම තමයි අපේ ගමට ඒ යෝජනා ගෙනාවෙ. විවේචන කරන අවස්ථාවෙලදිත් මම එතුමා වෙනුවෙන් කතා කරල තියෙනවා. ඔය පාලම් ගැන කතා කරන විට එහෙම කියන්න එපා අපේ ගමට ආපු සම්පතක් කියලා අපි කියල තියෙනවා. ඒ නිසා යම් අඩුපාඩු වෙන්න ඇති. ඒ වුනත් උපරිම සහයෝගයෙන් අපිට ගමට ලබා දෙන්න පුලුවන් දේවල් ලබා දුන්නා. ඒ වගේම සම්පත් අතුකෝරාල මන්ත්‍රීතුමා ඒ අවස්ථාවෙ නිර්ලෝභී වුනා. එතුමා ඒකෙ ගරුත්වය ගන්න ගියේ නැහැ. මේක දෙගොඩ බැදලා වෙන රජයක් වෙන කෙනෙක් වුනානම් මේ අපරාදෙ ආයෝජනයක් කියලා. දෙපැත්තටම සල්ලි වියදම් කළේ නැහැ. ඒක අතරමග කඩාකප්පල්

කරන්නෙ නැතුව. එතුමා මේ රජය ආව දවසෙ ඉඳලා. ඒ පාලමේ ඉතිරි වැඩ කරන්න. සහයෝගය ලබා දුන්නා. හැම සම්බන්ධීකරණ කමිටුවකම ඒ අඩුපාඩු සොයලා බලලා, එතුමන්ලා ආරම්භ කළ පාලම වැඩ අවසන් කරන තෙක් එතුමා සහයොගය දීලා. ඒ වගේම එතුමා නිර්ලෝභීව කතා කළා. නන්දන මන්ත්‍රීතුමාගෙ නම කිව්වා. අපේ මීට ඉහත හිටපු දේශපාලන නායකයො එහෙම කළේ නැහැ. ඒ සඳහා ඉඩකඩම් දීපු අය, උදවු කරපු අය සියලුම දෙනාට ආදි කතෘන්ට කරන්න තියෙන ස්තූති කරමින් තමයි ඒ කටයුත්ත කළේ. නෙලී මන්ත්‍රීතුමියත් හිටියා. ඔබ සියළුම දෙනාට ස්තූති වන්ත වෙමින්, ඒ වගේ උප සභාපතිතුමා අපේ ජොෂ්ඨ උපසභාපතිතුමා ඒ පිළිබඳ කියන්න තව අඩුපාඩුවක් තියෙනවනම් කියාවි. ඒ පිළිබඳත් මතක් කරමින්, සියලු දෙනාටම සුබ නව වසරක් ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබ සැමට සුබ අනාගතයක්.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

ගරු සභාපතිතුමනි, පොඩි අතපසු වීමක් වුනා. පසුගිය දිනවල උඩුගම ආලෝක විහාරස්ථායේ විහාරාධිකාරී වැයිහේනේ ඥාණාලෝක ස්වාමීන් වහන්සේ අපවත් වුනා. ඒ වෙනුවෙන් සභාවේ සභාපතිතුමා ඇතුලු අපේ ධනංජය මන්ත්‍රීතුමා, උප සභාපතිතුමා,සමන් මන්තීතුමා,තරංග මන්ත්‍රීතුමා ඒ සියලු දෙනාම සම්බන්ධ වුනා. සම්බන්ධ වෙලා ඒ අවශ්‍ය කරන ආදාහන පූජෝත්සවය වෙනුවෙන් සභාව වෙනුවෙන් කරන්න පුලුවන් හැකි සියලුම දේවල් ඒ සම්බන්ධ වෙලා කළා. ඒ වෙනුවෙන් පන්සල වෙනුවෙන් පන්සලේ නායක හාමුදුරුවො වෙනුවෙන් මේ වෙලාවෙ සභාපතිතුමා ප්‍රමුඛ ඒ සහයෝගය ලබාදුන් සියලු දෙනාටත් පැමිණි සියලු දෙනාටත් මම මේ අවස්ථාවේදී ස්තූතිය ගෞරවය පුද කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, පහුගිය දිනවල බල්බ් නැති අවස්ථාවක මම මුතුහෙට්ටිගම ඉලෙක්ට්‍රිකල්ස් එකෙන් එල්.ඊ.ඩී. බල්බ් 10 ක් අරන් දුන්නා. දැන් මේ අවුරුද්ද ඉවර වෙන්නත් යනවා. ඔබතුමාගෙ අවසරය මත ඒක කළේ. අපේ අවන්ත මහත්තයත් රියදුරු කැලුම් මහත්තයත් සම්බන්ධ වෙලා තමයි ඒක වුනේ. ඒ මුදල ඉතාම ඉක්මනින් එතුමට ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි අද සභාවාරය උනුසුම් සභාවරයක් වෙලා. අද අයවැය යෝජනාව ඉදිරිපත් කරලා. එය සම්මත වුන අවස්ථාවෙදිත්. වෙනත් කරුණු යටතේ කරුණු කීපයක් පිළිබඳව සඳහන් කරන්න. මම සූදානම් වෙනවා. ඒ වගේම මගේ කතාවෙදි මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. යම් යම් ප්‍රශ්නවලට මැදිහත් වෙන්න. මම හිතන්නෙ මෙතන කතා කරපුව හොඳ හෝ නරක පිළිබඳව, ගරු මන්ත්‍රීතුමන්ලා හොඳ අවබෝදෙන් කටයුතු කරාවි. මේ දේශපාලන ක්‍රියාවලියෙදි විවිධ අවස්ථාවලදි ආණ්ඩු පත්වෙනවා. පරදිනවා. නව ආණ්ඩු බිහිකරනවා. ඉතිං ඔහොම ක්‍රමවේදයන් යන කොට ඒ රජයන් පටන් ගත්ත වැඩ, ඊලග රජය ඊලග ආණ්ඩුව තමයි විවෘත්ත කරන්නෙ. නැවතුන තැනින් ආරම්භ කරන්නෙ. ඉතිං ඔහොම තමයි තත්වය. එකදිගට ආණ්ඩු ගියේ නැහැ. පහුගිය කාලෙ තුල ඒ නිසා මේ ප්‍රශ්නෙ වුනේ.

දැන් අපි මුලින්ම අපේ ගරු අලුත් මන්ත්‍රීතුමියට මේක හොඳ අත්දැකීමක්. ඔබතුමිය බය වෙන්න එපා මෙතනින් යනකොට ඔක්කොම එකම සහෝදරයො. වගේ එලියට යන්නෙ. ඒ නිසා මෙතන කතා කරන සිද්දධීන් අනුව අපි හැසිරෙන්නෙ නැහැ. ගමට ගියාම. මේ එකම මවකගෙ දරුවො වගේ තමයි හැසිරෙන්නෙ. ඒ පිළිබඳ ඔබතුමියට කාලයක් යන කොට අත් දැකීම් ලැබේවි. මේ කතා කරපු සියල්ලම අපට සුහදත්වයෙන් විසඳ ගන්න පුලුවන්. සියලු දෙනා උගත් බුද්ධිමත් මන්ත්‍රීවරු පිරිසක් තමයි ඉන්නෙ.

ඉතිං මුලින්ම මම සඳහන් කරන්න කැමතියි. යටලමත්තෙ පාලම පිළිබඳව. මටත් ආරාධනා කළා, මම ගියා. ගරු නිශාන්ත මන්ත්‍රීතුමා, වජිර අබේවර්ධන ඇමතිතුමා ඇතුලු ඒ දේශපාලනේ ආණ්ඩුවට එතන කතා කරපු කාන්තාවක් ඒ ගමේ ඒ ප්‍රදේශයේම තරුණ මහත්මියක්, දීර්ඝ කතාවක් කළා. මේ සියලු ඉතිහාසෙ පිළිබඳවම කතා කරලා ප්‍රසංසාව ලැබුනා. නිශාන්ත මන්ත්‍රීතුමාගෙ සම්බන්ධ වීම තමයි ඇත්තටම අඩුව වුනේ. සම්බන්ධ වුනානම් හොඳයි. ඒ වගේම සිද්දියක් මටත් වුනා. දැන් උඩලමත්තෙ මාමනදොල පාලම මහ ගංවතුරට ගියපු පාලමක් වශයෙන් ආවෙ. ඒ පාලමට දිග පළල මනින්න ටේප් එක ඇල්ලුවෙ මම. ඒ පාලමට අයත් භූමිය නිරාකරණය කරන්න. ඉඩම් කට්ටි කරුවන් ගෙනැල්ලා. නඩුවක් තියෙන ඉඩමක විත්ති කරුවන් හයදෙනෙක් ප්‍රාදේශීය ලේකම් ලගට ගෙනැල්ලා. කැමැත්ත දීලා අත්සන් කරලා ලියුම ගත්තෙත් මම. ඒ වගේම ඒ පාලම් ව්‍යාපෘතියෙ හම්බන්තොටින් ඇවිල්ලා. ඒ ව්‍යාපෘතියෙ මහත්තුරු ඇවිල්ලා. ඒවා අධීක්ෂණය කරද්දි නිතරම සම්බන්ධ වුනේ මාත් එක්ක. මාත් එක්ක ලියුම් ගනුදෙනු කරපු ෆයිල් එකක් මම තියාගෙන ඉන්නවා. මේකෙ ඉතිහාසෙ කවුරුවත් ඇහුවොත් කියන්න. ඒ වෙලාවෙ ඒ පාලම වජිර මහත්තය ඇවිල්ලා ආරම්භ කරන කොට මට ආරාධනා කළේ නැහැ. නමුත් මම කණගාටුවක් ඇතිකර ගත්තෙ නැහැ. මට මිනිස්සු කිව්වා මොකද කරන්නෙ. මම කිව්වා ඔයාල යන්න. ඒ වගේම අපේ ඉන්ද්‍රපාල සහෝදරයා, අපේ බුලත් කොලෙන් ඡන්දෙ ඉල්ලපු සහෝදරයා ස්තූති කතාව කළේ. මම කිව්වා ඔයාල ගිහිල්ලා මේකට සහයෝගය දෙන්න. මොන ආණ්ඩුව හරි ඒක කරගෙන යනවනම් ඇත්තටම ඒක හොඳ වැඩක්. ඉතිං නිශාන්ත මන්ත්‍රීතුමාලා, වජිර ඇමතිතුමාල, ඒ ආණ්ඩුව කරපු කාර්යයක් නම්, ඒකට ඇත්තටම ඒ ප්‍රසංසාව ඕන වෙලාවක දෙන්න අපි කැමතියි. අපේ රජය ඊලග අවස්ථාවෙ පැරදුනොත්, ඒ අවස්ථාවෙ අපි කරපු වැඩ කරගෙන යන්න. හොඳ වැඩනම් කරගෙන යන්නෙ. ඊලග ආණ්ඩුව උත්සුක වෙනවා. මොකද ජනතාවගෙ අවශ්‍යතාව. ඒ නිසා අපට දේශපාලන බේදයක් නෙවෙයි. ඒ සියලු ලකුණු දාන්න කැමතියි. ඊලගට දැන් මේ අවස්ථාව වෙනවිට අපි දැක්කා. යහපාලන ආණ්ඩුව තියෙන කාලේ ගරු සභාපතිතුමාට දීර්ඝ වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලියුම් එනවා. සංවර්ධන සැලසුම් ඇස්තමේන්තු ගන්න. යෝජනා මම දන්නෙ නැහැ. ඔබතුමාට දැන් එහෙම එන්නෙ නැද්ද? ඒවා සභාවෙ නොකියන වරද වෙලා තියෙන්නෙ. දැන් මේ කාපට් පාරවල් කීපයක්ම පහුගිය දවස්වල කෝටි ගණන් වලින් මේ ප්‍රදේශයේ වැඩ ආරම්භ කළා. මම හිතන්නේ පන් කොටි ගණනක් ගයාන් මන්ත්‍රීතුමාගෙ වැඩේ. මම දන්නෙ නැහැ බෝඩ් එක දැක්කෙ ඒක විතරයි. එහෙම කෝටි ගණනක වැඩක් එකක්වත් මෙතන කියවෙන්නෙ නැහැ. ඒකයි මේ අඩුපාඩුව වෙලා තියෙන්නෙ. ඉදිරියෙදි තව විශාල සංඛ්‍යාවක් දැන් ප්‍රාදේශීය සභාවටත් ඇවිල්ලා තියෙනවා. කිලෝ මීටර් 15 ක්. ඔබතුමා ලියුම කියෙව්වෙ නැහැ. මම හිතන්නෙ ඒ අඩුපාඩු ගොඩක් තියෙනවා මෙතන. ඒ වගේම නිවාස ඉදිකිරීම පිළිබඳව දැන් කතා කළා. ඒවා ප්‍රශ්නයක් නැහැ. ගම්වල සාමාන්‍ය ජනතාව වෙනුවෙන් කරන්න ඕන. මොන රජය පත්වුනත්, ඒව ජනතාව වෙනුවෙන් කරන්න ඕන. ඒවා කළ යුතු වැඩ. ඒ නිසා ඒ පිළිබඳ මම කතා කරන්න කැමති නැහැ.

විශේෂයෙන්ම උඩුගම පොළ පිළිබදව දැන් ඔබතුමා සභාවෙ කිව්වා. පොළ සංවර්ධනයට මුදලක් වෙන් කරනවයි කියලා. දැන් උඩුගම කොට්ඨාසයට මන්ත්‍රීවරු පහක් ඉන්නවා. ඒ අයගෙ අධීක්ෂණයෙන් මේ කටයුතු කරනවයි කියලා ඔබතුමා කිව්වා. ඒක හොඳ වැඩක්. මොකද දැන් අපි දැක්කා. තල්ගස්වල පොළට ප්ලෑන් එක ඇන්දෙ කුරුනෑගල පුද්ගලයෙක්. මුලු රටේම ඒ අවස්ථාවෙදි පොළවල්වලට ප්ලෑන් ඇන්දෙ ඒ කුරුනෑගල පුද්ගලයා. කෝටි ගානක්,ලක්ෂ ගානක් ඒ මනුස්සයට යන්න ඇති. ටෙන්ඩර් කරලා ඒ අමාත්‍යාංශවලින් අරගෙන ඒ එක පුද්ගලයා. මෙතන අපේ භූමි ප්‍රමාණය සැලැස්ම විතරයි යැව්වෙ. ඒ මිනිහා ප්ලෑන් එක ඇඳලා මෙහේ එවලා මෙහේ පටන් ගත්තා. ඒක හරවලා ඇන්දෙ මිනිස්සුන්ට යන්න බැරිනිසා. අපි මැදින් පාරක් දැම්මා. මෙතනට ඇවිල්ලා ප්‍රායෝගිකව නෙවෙයි. ඔය නිලධාරීන් කරන්නෙ. භූමි බාගය පෙන්නුවහම ප්ලෑන් එක යැව්වම ප්ලෑන් එක ඇඳලා එවනවා. මේකෙ මිනිස්සුන්ට යන්න පුලුවන්ද බැරිද කියලා ප්‍රශ්නයක් තියෙනවා. ඉතිං උඩුගම පොලත් අපි සකස් කරද්දි හේමචන්ද්‍ර විලේගේ මන්ත්‍රීතුමා ගරු

සභාපතිවෙලා හිටියා. අපි එතුමට කිව්වා. දැන් නිශාන්ත මනත්‍රීතුමත් සාක්ෂි දරනවා. එතුමත් එවෙලෙ ඒ යෝජනාව අනුමත කළා. ක්‍රීඩාංගනයට අවශ්‍ය භූමි භාගය තියලා. ක්‍රිකට් පිටියකට අවශ්‍ය භූමි භාගය තියලා. මේ පොළ ඉදිකරන්න කියලා. නමුත් ඒක එහෙම කළේ නැහැ. අද ක්‍රිකට් ගහන්නත් නැහැ. පොළත් නැහැ. ක්‍රිකට් ගහන්න තිබුන භූමි භාගයත් අඩු වුනා. අර වැටක් ගහලා. අපි කිව්වා තව ඕක ගන්න පුලුවන් එහාට. එහාට ගන්න පුලුවන් කියන්නෙ, අපේ භූමි භාගය මැන්නහම, අර කෙටල ගාලෙනුත් පර්චස් ගානක් අපට ආවා. සමන් මන්ත්‍රීතුමා දන්නවා. ඒක එහෙට ගත්තෙ නැහැ. ක්‍රීඩා කරන්න ඕන ක්‍රීඩකයන්ට අවශ්‍ය භූමි භාගෙන් තමයි ගත්තෙ. ඒක කොයිතරම් කිව්වත් ඒක වුනේ නැහැ. එතකොට උඩුගම පුරහල හදද්දි අපි කිව්වා. පෙනුමක් එන්න මොන්ටිසෝරියත් අස්කරලා එතනට ගන්න. උඩිපැත්තෙන් පාරක් ඇවිල්ලා. පුරහලට තට්ටු දෙකේ බිල්ඩින් එකක් හදලා. උඩ තට්ටුව පුරහලට ගන්න. යට කෑලි ටික කඩ කාමරයි මොන්ටි සොරියට කෑල්ලකුයි ගන්න කියලා. ඒක කළෙත් නැහැ. මේව මම හිතන්නෙ අපේ තියෙන දුර්වලකම්. අපේ අධීක්ෂණය නැතිකම. ඒ අවශ්‍ය සුදුසු පුද්ගලයන් ඒ සඳහා සම්බන්ධ කර නොගැනීම නිසා තමයි මේ දේ වුනේ. මේ හැම දෙයක්ම වෙන්නේ එහෙමයි. ඒ නිසා අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. උඩුගම පොළ සංවර්ධනය කරනවනම් අපට කියන්න. අපි කියන්නම් මෙන්න මෙහෙම කරන්න. මේ විදිහට මේ විදිහට කරන්න කියලා. දැනටම පොළට ඇතුල් වෙන්න,පාරවල් හයක් පාවිච්චි කරනවා. මේක තරංග මන්ත්‍රීතුමා දන්නවා. හය පලකින් ඇතුල් වෙනවා. පිට්ටනියෙ දැලත් කඩලා. වාහන පාර්ක් කරලා. දැල කඩලා ගිහිල්ලා තමයි වෙළෙන්දො බඩු බාන්නෙ. හය පලකින් ඇතුල් වෙනවා. හය පලකින් පිට වෙනවා. ඉස්සෙල්ලම මේක එක තැනකින් ඇතුල් වෙන්නයි. එක තැනකින් පිට වෙන්නයි. හදිසි දොරටුවකුත් එක්ක තමයි මේ පොළ හදන්න ඕන. නැත්නම් මේක දියුනු වෙන්නෙ නැහැ. මොකක්ද එකක් වගේ එහාට මෙහාට යන විදිහට තමයි පොළ තියෙන්නෙ. ඉස්සෙල්ල ස්ථිර ආරක්ෂිත වැටක් එක්ක පොළ වෙනම භූමිය වෙන් කිරීම තමයි මෙතනදි වෙන්න ඕන.

ඊලගට විශේෂයෙන්ම මම දැක්කා. පහුගිය දවස්වල මම උප කාර්යාලයට ගියාම පැත්තකට කරපු ටැක්ටරයකින් රෝදයක් ගලවලා. ඒකෙ ඇණ ටිකයි රිම් එකයි වෙනම තියෙනවා. මම ඇහුවම මුරකාරයගෙන් අලුත් ටැක්ටරයකට ගත්තයි කිව්වා. මේ පැත්තකට කරපු ටැක්ටරේ රිම් එකයි. දැන් ඔහොම ගිහිල්ලා තමයි ජේ.සී.බී. එකේ කෑලි නැතිවුනේ. කෑලි කෑලි ගලවනවා. ඒව හයි කරන්නෙ නැහැ. දැන් අර හයිකරපු ටැක්ටරේ ටයර් එක අරකට හයි කරන්න ඕන එහෙමනම්. ඒක එතනට සවිකරලා තමයි අරගන්න ඕන. මම දන්නෙ නැහැ එහෙම වුනාද කියලා. මම දන්නවා එහෙම වෙලා නැති විත්තිය. දැන් හොද ටැක්ටර් දෙකක් තියෙනවා. හොඳ ලෑන්ඩ් මාස්ටරයක් තියෙනවා. ලෑන්ඩ් මාස්ටරේ ස්ටීරියන් තියෙන්නෙ. බූම් එක තියෙන ලෑන්ඩ් මාසටරය දැන් අපි කෘ කැබ් එකේ රියදුරත් සමග තව දෙන්නෙක් යනවා ලයිට් හයි කරන්න. දැන් අපේ කාර්මික ශිල්පියට හෝ යන සහායකයට රියදුරු බලපත්‍රයක් ගන්න කියන්න. කවදාවත් ලංකාවෙ කොහේවත් ලෑන්ඩ් මාස්ටරයක් පැත්තකට කරල තියෙනවා දැකල තියෙනවද? ලෑන්ඩ් මාස්ටරයක් කියන්නෙ ඩීසල් ලීටරයක් දැම්මහම දවසක් වැඩ කරන්න පුලුවන් වාහනයක්. වෙන කිසිම වියදමක් යන්නෙ නැහැ. ඒවා ඉන්ජින් රෙපෙයාර් ලොකුවට එන්නෙ නැහැ. ටේලර් එක දිරල පැත්තකට කළොත් ඒව රෙපෙයාර් කරනවා මිසක් ඉන්ජින් රෙපෙයාර් එන්නෙ නැහැ. ඒ නිසා ඒ ටැක්ටරය හදන්න. දැන් මේ ලක්ෂ තිහක් හතලිහක් තියෙනවා. ඒ ටැක්ටරේ හදලා, ඒකට වහලක් හයි කරලා, ඉනිමගත් දීලා, දෙන්නෙක් ලයිට් හයිකරන්න. යවන්න. මෙතන තුන්දෙනෙක් එක්ක කෘ කැබ් එකක් යවනවයි කියන්නෙ වියදමත් වැඩියි. කෘ කැබ් පාවිච්චි කරන්නත් බැහැ. ඒ වගේ ක්‍රමවේදයක් ඇති කරන්න. ඒ නිසා ඔබතුමාට කියනවා. මේ ගිනුමෙ තියෙන සල්ලිවලින් ඔබතුමාගෙ දැක්මක් ඇති යම යම් දේවල් කරන්න, ගන්න ඕන කියලා. එහෙම කරන්න යන්න එපා. එහෙම කරන්න ගියොත් අර වක්කඩේ හකුරු හැංගුව වගේ තමයි. දැන් එහෙම වුනා. ලක්ෂ 72 කින් පටන් ගත්ත ප්‍රාදේශීය සභාව, දැන් මාස දෙක තුනකට කලින් එක්කෝටි ගානක් තිබුනා. අද ගිණුමෙ තියෙන්නෙ කීයද? බැලුවහම මේ සල්ලි තියා ගැනීමෙන් අපට කිසි සෙතක් නැහැ. දැන් හෙට අනිද්දා කොරෝනා වසංගතයක් වෙනවා. ඒක

නැහැ කියන්න බැහැ. දැන් ඒ සම්බන්ධව සහබන්දු මහත්තයත් කතා කළා. කොවිඩ් වසංගතය ගමට එනවා. ඕක වලක්වන්න බැහැ. නමුත් අපට ඒවත් එක්ක හැසිරෙන්න වෙනවා. අපිට ඒවත් එක්ක හැසිරිලා අපේ ජන ජීවිතය ගොඩනගා ගන්න වෙනවා. ඒව එනවයි කියලා පැත්තකට වෙලා ඉදලා. පාසල් වහලා මොන්ටිසෝරි වහලා, කඩ පොළවල් වහලා, මේ රට දියුනු කරන්න බැහැ. රට ආපස්සට යන එක තමයි වෙන්නෙ. ඒක නිසා අපි ඒවත් එක්ක අනුගත වෙලා කටයුතු කරන්න ඕන. ඩෙංගු ආවා, ඒවත් එක්ක අනුගත වුනා. තවත් සාස් කියලා වෛරස් ආවා. ඒවත් එක්ක අනුගත වුනා වගේ මේකත් එක්කත් අනුගත වෙලා අපට වැඩ කරන්න වෙනවා. දැන් කොළඹ නගර සභාව වගේ කෝටි ගණන් අපි ගාව නැහැ. කොළඹ නගර සභාවෙ කොයිතරම් දේවල් බෙදනවද. හික්කඩුව නගර සභාව කොයිතරම් දේවල් මිනිස්සුන්ට බෙදනවද. ගාල්ල නගර සභාවෙ එල්.ඊ.ඩී. බල්බ් 5000 ක් ව්‍යාපෘතිය පටන්ගෙන 5000 ක් හයිකරලා තියෙනවා. ඉතිං අපේ බල්බ් 50 ක් හයිකරලා නැහැ. අපි දුප්පත් ප්‍රාදේශීය සභාවක්. සල්ලි තියාගෙන හිටියොත් සල්ලි නැතිවෙනවා මිසක් ජනතාවට ප්‍රදේශයට සෙතක් වෙන්නෙ නැහැ. ඔබතුමා මම කියන්නෙ උපකාර්යාලෙ තියෙන ප්‍රධාන ටැක්ටර් දෙකයි ලෑන්ඩ් මාස්ටරයයි හදලා ප්‍රයෝජනයට අරගන්න. ප්‍රයෝජනයට අරගෙන ජනතා වෙනුවෙන් සේවය කරන්න කටයුතු කරන්න. ඒවගේම උඩුගම පාරෙ තියෙන ටිපර් එක අපට අගෞරවයක්. උඩුගම තියන්නෙ නැතුව ඔබතුමා වෙන ගරාජ් එකකට ගෙනිහින් දාන්න. අපට අගෞරව කරන්න එපා. කියලා ඉල්ලීමක් කරමින්, සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින්, අලුත් මන්ත්‍රීතුමියටත් සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මගේ කතාව මෙතකින් නිමා කරනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උපසභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුනි. මන්ත්‍රීවරියනි. මම නැවත වරක් සියළුම මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට ස්තූති ප්‍රණාමය පුද කරනවා. 2021 අයවැය සම්මත කිරීමට දායක වීම සම්බන්ධව. මෙවර අයවැයෙන් ඉදිරිපත් කර ඇති යෝජනාවන් 2021 වර්ෂයේ ඉටු කිරීමට සියළුම මන්ත්‍රීවරුන්ගේ සහය නොමදව ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. මා සභාපති වූ පසු ඉදිරිපත් කල තෙවැනි අයවැය මෙය වුවද, මම මෙම සභාවට තේරී පත් වී 2002 වර්ෂයේ සිට මේ දක්වා ඉදිරිපත් වූ සෑම අයවැයක් පිළිබඳව අතීතාවර්ජනා කිරීමට බලාපොරොත්තු නොවුනත් සෑම අයවැයකදී ඉදිරිපත් කරන යෝජනා සෑම ඉටු කිරීමට නොහැකි වූ බවද සඳහන් කරනුයේ කණගාටුවෙනි. මන්ද අප බලාපොරොත්තු වන සියළු දේ පසුකාලීනව ඇති වන සමාජ දේශපාලන වෙනස්වීම්වලදී වෙනස්වීම්වලට භාජනය වන බැවිණි. කොහොම නමුත් අනාගතය සුභවාදීව දකිමු. තවද පසුගිය කාල වකවානුවේදී අප සභාව විසින් ක්‍රියාත්මක කල සමාජ සත්කාර සහ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව වැඩියමක් ප්‍රකාශ කිරීමට නොයමි. මන්ද ඒ පිළිබඳව අපගේ මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වූ බැවිනි. නමුත් යම් යම් අදහස්වලට පිළිතුරු දීමට මා බැඳී සිටින බැවින් ඒ පිළිබඳව පැවසීම යුතුකමක් හා වගකීමක් සේ සළකමි.

ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලාගේ අදහස්වලට මම ගරු කරනවා. ඇහුම්කන් දෙනවා. නමුත් සමහර ඉල්ලීම් ඉටු කිරීමට යාමේදී නොයෙකුත් නීතිමය ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වන බව මම අත්දැකීමෙන් දන්නවා. ඒ අනුව සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී දෙපැත්තටම සාධාරණය වන ලෙස කටයුතු කිරීමේදී තමයි යම් යම් අඩුපාඩු සිදු වන්නෙ. උදාහරණයක් ලෙස එක පාර්ශවයකට එක මන්ත්‍රීතුමෙක් කතා කරන විට අනෙක් පාර්ශවයට වෙනත් මන්ත්‍රීවරයෙකු කතා කරනවා. මම මේ දෙගොල්ලන්ගෙම දිහා බලලා සාධාරණය ඉටු කිරීමටයි යන්නෙ. හරියට දැලි පිහියෙන් කිරි කනවා වගේ වැඩක්. මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා අපි ඇවිල්ලා අවුරුදු 03 ක් වෙනවා. මොනවද කළේ? නිතරම ප්‍රකාශ කරන දෙයක් තමයි. සභා අරමුදලේ මුදල් තියෙනවා. ඒවා ඔබතුමන්ලාට බල ප්‍රදේශයේ සංවර්ධනය උදෙසා ලබා දෙන්න කියලා ඔබතුමන්ලා ඉල්ලනවා.

මමත් කැමතියි ඉල්ලීම් ඉටු කිරීමට නමුත් මතක තියාගන්න ගරු මන්ත්‍රීවරුනි, ඔබ අපි මේ සභාවට මෙවර ඇවිදින් අවුරුදු 03 ක් වුනාට පළමු අවුරුදු දෙක සභාවත්, රජයත් පාර්ශව දෙකක සිටි බව. නමුත් ඔබතුමන්ලා අහන්න පුළුවන් ඇයි රජය නැතිවුනාට පළාත් සභාව තිබුනෙ අපේ නේද කියලා. ඔව් තිබුණා තමයි. නමුත් අපට පළාත් සභාවෙන් අය විය යුතු දඩ මුදල්, මුද්දර ගාස්තු ඒ හිටපු මහ ඇමතිතුමාවත්, හිටපු ආණ්ඩුකාරතුමාවත්, දුන්නෙ නැහැ. ඔබතුමන්ලා ප්‍රකාශ කරන වර්තමානයේ අප සභා අරමුදලේ ඇති මුදල් ලබාදීමට කටයුතු කළේ වර්තමාන ආණ්ඩුකාරතුමා. මේ වසරේ හයවෙනි මාසයේ සිට ඒ ලැබීම් ලබා ගැනීමට මගේ උනන්දුවත්, මුදල් ලේකම්තුමාගේ මැදිහත් වීමත් ප්‍රධාන සාධකය වුණා. ඔබතුමන්ලා දන්නවා ඊට පසුව අපි අපේ ජනාධිපතිවරයෙක් පත් කර ගෙන අලුත් විදියට සිතන නව ගමනක් යන්න ආරම්භ කළා. ඒ අනුව වර්තමාන ජනාධිපති අතිගරු ගොඨාභය රාජපක්ෂ මැතිතුමා සමඟ නව රජයක් පත් කර ගැනීම කටයුතු කර ගෙන ඉදිරියට යන අතරේ තමයි මුළු ලෝකයටම වසංගතයක් වූ කොවිඩ් 19 ආවෙ. නමුත් අපි මේ සියළු බාධා කම්කටොලු මැඩ ගෙන අපට පුළුවන් ආකාරයේ සංවර්ධන ක්‍රියාදාමයන් අපේ ගම්වල සිදු කර ඇති බවත්, ඉදිරියට කරන බවත් කියන්න කැමතියි.

ඒ අනුව මේ වන විට සෑම ගමකම කටුමැටි ගෙයක් හිමි නිවාස හිමියෙකුට නව නිවාස තනාදීමට රුපියල් ලක්ෂ 06 ක මුදලක ආධාරයක් නැවත අය කරගැනීමකින් තොරව ලබා දී, එම වැඩ කටයුතු අපේ අධීක්ෂණය යටතේ සිදු වෙනවා. ඊළඟට වැසිකිළි කැසිකිළි පහසුකම් නොමැති සියළු දෙනාට ඒ පහසුකම් ලබා දීමට රු. 40000.00 ක් වැනි මුදලක් ආධාර වශයෙන් ලබා දීමට මේ වන විට කටයුතු සිදු කරලා තියෙනවා. මේ ක්‍රියාදාමය ඉදිරි වර්ෂ වලදී නොකඩවා ක්‍රියාත්මක වන බව සතුටින් ප්‍රකාශ කරනවා. ජලය නොමැති සෑම නිවසකටම ජලය ලබා දීමට ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක වන බවත්, ඒ හා සම්බන්ධ ක්‍රියාවලට ඉදිරියේදී සභාවක් හැටියට සක්‍රීයව දායකත්වය ලබාදීමටත් කටයුතු කරනවා. මේ වන විට සෑම ගමකම අපේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම්, යෝජනා අනුව ලක්ෂ 20 ක මාර්ග සංවර්ධනය මෙන්ම අනෙකුත් අවශ්‍යතා ඉටු කර දී ඇති බව, ඒවගේම අපේ බල ප්‍රදේශයේ මාර්ග කිලෝමීටර් 15 ක් මේ වන විට කාපට් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන බවත් ඔබතුමන්ලා දන්නවා. ඒ අනුව මේ වන විට ක්‍රියාත්මක මාර්ගයන් විදිහට ගම්මැද්දේගොඩ පඤ්ඤාලෝක මාවත කිලෝමීටර් 1 ½ ක් රු. ලක්ෂ 200 යි. මූලන අන්නාසිගලහේන පාර ලක්ෂ 350යි. කුඹුරුහේන පාර ලක්ෂ 200 යි. දාවුල්හේන පාර ලක්ෂ 150 යි. යටලමත්ත මාමනදොල පාර කිලෝමීටර් 5 ½ යි. ලක්ෂ 500 යි. ඉහත මාර්ග සඳහන් කරන්න පුළුවන්. කෘෂිකාර්මික පැත්තෙන් ගත්කල සෑම ගමකටම කෘෂි තවානක් ලබාදීලා ඒ ගමේ සෑමට තමන්ගේ වත්තේ තම පරිභෝජනයට අවශ්‍ය එළවළු වගා කරගැනීමට ආධාර ලබාදීම. මේවා ක්‍රියාත්මක කිරීමේදී යම් යම් ගැටළු ඇති බව දන්නවා. නමුත් ඉදිරියේ මේ සියළු කාරණා සැළකිල්ලට ගෙන කටයුතු කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ සියළු දේ පිළිබඳ දැඩි විමසිල්ලෙන් බලාහිදිනා කෙනෙක් ඉන්නවා. ඒ තමයි අපට නායකත්වය දෙමින් මේ සෑම කටයුත්තකටම පූර්ණ දායකත්වය මෙන්ම ආශිර්වාදය දෙන පාර්ලිමේන්තු මන්ත්‍රී, අපේ ආසන සංවිධායක සම්පත් අතුකෝරාල මැතිතුමා මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමා. මේ අනුව අප බල ප්‍රදේශයේ ඉදිරි සංවර්ධන කටයුතුවලදී මහජන සහාය ලබා ගැනීමටත්, ඔවුන්ගේ යෝජනා ගැනීමටත්, බල ප්‍රදේශයේ සියළුම ප්‍රජා නායකයින් මෙන්ම දේශපාලන අධිකාරිය, රාජ්‍ය නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ විශාල සංවර්ධන ක්‍රියාවලියක් සිදු කිරීමට ගමට පිළිසඳරක් සංකල්පය තුල කිරීමට කටයුතු යොදා ඇති බවත් ප්‍රකාශ කිරීමට කැමතියි.

ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සභාව පිළිබඳ ප්‍රකාශ කරන්න කැමතියි. අපේ උප සභාපතිතුමාගෙන් ප්‍රකාශ වුන පරිදි සභාවේ යම් යම ක්‍රියාකාරකම් මගෙත් අප්‍රසාදයට පත්වයි ඇත්තේ. විශේෂයෙන්ම කියන්න ඕන. අපේ සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ හිඟකම. මාර්ග සේවයට කම්කරුවන් ඉන්නේ 03යි, 04යි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට

කම්කරුවන් 02 යි. කුණු අදින ට්‍රැක්ටරයට කම්කරුවන් 02 ක් ආදී වශයෙනි. කාර්මික නිලධාරීන් 02 යි. මේ අයගෙනුත් බොහෝ දිනවල බොහෝ දෙනෙක් තමන්ගේ නිවාඩු ලබා ගෙන සේවයට වාර්තා කරන්නේ නැහැ. අතිකාල පිළිබඳව මම වෙනම සාකච්ඡාවක් කැඳවා එහි වන අඩුපාඩු නිවැරදි කිරීමට බැලුවා. නමුත් සේවක හිඟය නිසා එය ක්‍රියාත්මක කිරීමට අපහසුයි. වාහන පිළිබඳව අධීක්ෂණයේදී වෙනත් නිලධාරීන් නොමැති නිසා අපේ සභාවේ වාහන නිරීක්ෂණයට යොදවා ඇත්තේ නිලධාරිණියක්. මේවා මේ විදියට සිදුවන නිසයි ඔබතුමන්ලා ප්‍රකාශ කරන සිදුවීම් වෙන්නෙ. ට්‍රැක්ටරයේ ටයර් පිළිබඳව ප්‍රකාශ වුන නිසා කියන්නෙ. දැනට කුණු අදින ට්‍රැක්ටරයේ ටයර් ගෙවී ඇති බැවින්, දැනට අළුත්වැඩියා කිරීමට යෝජිත ට්‍රැක්ටරයේ ටයරය මාරුකිරීමක් කොට කුණු අදින ට්‍රැක්ටරයේ ටයර ආපිඩැග් ගැසීමට කටයුතු කර ඇත.බූම් එක තියෙන, ලයිට් හදන්න ගිය ලැන්ඩ් මාස්ටරය මේ වන විට අක්‍රීයව තියෙන්නෙ. එයට පසුගිය වර්ෂවලදී කල අළුත්වැඩියා වියදම අධික නිසා තමයි එය නැවත පරිහරණය නොකර ඉන්නෙ. එය මිළදී ගත් කර්මාන්තශාලාවේ අය අළුත්වැඩියාවන් සඳහා අධික මුදලක් අය කරනවා. හැදුවත්, ඊට පස්සෙ නැවත කැඩිලා. ඊට ලාභයි දැනට ක්‍රියාත්මක වන ක්‍රමවේදය. ඊළඟට පොළවල් පිළිබඳ ඔබතුමන්ලා ප්‍රකාශ කළා. මේ වන විටත් ඒ සඳහා මුදල් වෙන්කිරීම කර අවසන්. උඩුගම පොළ පිළිබඳව සංවර්ධනයේදී ගරු උප සභාපතිතුමා මැදිහත්ව කටයුතු කිරීමට උනන්දු වෙන්න. එමෙන්ම මම එය ඔබතුමන්ට භාර කරනවා. තවද, අප බල ප්‍රදේශයේ විදුලි පහන් නියමිත ආකාරයට ක්‍රියාත්මක වෙනවානම්, ඒවගේම අලුත් වීථි පහන් සවිවනවා නම්, ඔබතුමන්ලා මෙන්ම මමද කැමතියි.සෑම දේම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සහ නීතිමය පහසුකම් අවශය බව අපි කවුරුත් දන්නවා. ඔබතුමන්ලා දන්නවා. පසුගියදා ජනාධිපතිතුමා පැමිණි වෙලාවෙ උඩුගම, නාගොඩ, මාපලගම, තල්ගස්වල, යටලමත්ත ආදී නගරවල එල්ඊඩී විදුලි පහන් සවි කළා. ඒ විදුලි පහන් ලබා ගත්තෙ සභා අරමුදල්වලින් නොව අපට පළාත් සභාවෙන් වෙනම මුදලක් ලැබුණා. උඩුගම උත්සවය තිබුනා. විහාරස්ථානයේ වැසිකිලි පද්ධතිය සෑදීමට. අපි එම කටයුත්ත සභාවෙ සේවකයන් යොදවා, කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණයෙන් සිදු කල නිසා ඇස්තමේන්තු මුදල ඉතිරි විය. එම මුදලින් තමයි එල්ඊඩී විදුලි පහන් ගත්තෙ. ඒ අවස්ථාවෙදිත් මේ පිළිබඳව ගැටළුවක් පැන නැගුන බව ඔබතුමන්ලාට මතක ඇති. ඉදිරියේද අලුත් එල්ඊඩී වීථි පහන් ප්‍රමාණයක් මිළදී ගෙන බල ප්‍රදේශයේ අවශ්‍ය සියළුම ස්ථානවල මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් සහ අධීක්ෂණය යටතේ සිදු කිරීමට මම බලාපොරොත්තු වෙනවා. එයට ඔබතුමන්ලාගේ සාධාරණ ඉල්ලීම් ඉදිරිපත් කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ඒවගේම ගරු විපක්ෂ මන්ත්‍රීවරු එතුමන්ලාට යම් යම් කමිටුවලට කැඳවීමක් නොකරන බව ප්‍රකාශ කළා. මම හිතන්නෙ එය නිලධාරීන්ගේ වගකීමක්. මම මේ වෙලාවෙ ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා ඒ සෑම සාකච්ඡාවකටම එන්න කියලා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා නම් කිව්වත්, නොකිව්වත් එනවා. එය හොඳ දෙයක්. මට මතක් වෙනවා. 2003 මහ ගංවතුර මම එදා විපක්ෂ මන්ත්‍රී. මගේ ගේත් වහළ මට්ටමට යටවෙලා. නමුත් මම අනිත් අසරණ වූ අයට උපකාර කරන්න මට වූ විපත් පිළිබඳව නොසලකා කටයුතු කළා. දවසක් නාගොඩ හංදියේ හේමකුමාර නානායක්කාර ඇමතිතුමා වාහනයක ඇවිත් යට වූ ළිං ඉසීම සඳහා එහි පැමිණ සිටි පාක්ෂිකයින්ට සහ මන්ත්‍රීවරුන්ට වතුර මෝටර් බෙදාදීම් කළා. ඒ අවස්ථාවේ මමද එම ස්ථානයේ සිටියා. මටත් එම මෝටරක් ඉල්ලා ගෙන නාගොඩ ප්‍රදේශයේ යට වූ ළිං ඉස දෙන්න කියලා එතන හිටපු අය කිව්වා. නමුත් මම දන්නවා ඔවන් මට නොදෙන බව. ඒ බව මම ඒ අයට කිව්වම, ඒ ඇසුනු ඇමතිතුමා මා සමඟ වචන හුවමාරුවක් වුණා. මමද ඒ අවස්ථාවේ මානසිකව වැටී සිටි බැවින් මමද ඇමතිතුමා සමඟ වාදයකට පැටලී ගහ ගැනීමේ තත්වයට ගියා. මොකද මමත් මහජන නියෝජිතයෙක් නිසා. පසු කලෙක ඇමතිතුමා හමු වූ වෙලාවක ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කළා. ඊට පසුව ඇමතිතුමා කෘෂිකර්ම ඇමති කාලෙ මට හුඟක් උදව් උපකාර කළා.

ඒ වගේම අනවසර විදිහට මාපලගම මලාමුර ඇල්ලට ඇත පෙදෙස්වලින් මිනිස්සු නාන්න එනවා. පොලීසියෙනුත් ගිහිල්ලා එලෙව්වා. කොරෝනා ප්‍රශ්නය නිසා ගයාන් මන්ත්‍රීතුමාට කියලා නෑම තහනම් කියලා, බෝඩ් වගයක් ගැහුවා. ඒකෙ බිලත් ඇවිල්ලා තිබුනා. සභාවෙන් මලාමුර ඇල්ල සංවර්ධනය කිරීම සඳහා යෝජනා දාල තියෙන්නෙ. ඒක ඉස්සරහට යථාර්ථයක් වේවි.

ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා මතක තියා ගන්න. මේ වෙනකොට රටේ සංවර්ධනය සිදු වෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා, මේ පාලම් පිළිබඳව කතා කළා. ඇත්තටම පාලම් විවෘත්ත කිරීම හොඳයි. නමුත් අපේ සම්පත් මන්ත්‍රීතුමත් දැනුවත් වුනා. වජිර අබේවර්ධන ඇමතිතුමාලා, නන්දන මන්ත්‍රීතුමාල මේ පිළිබඳව ඇත්තටම හුගක් මහන්සි වුන බව. පාලම්වල අතීතයට යන කොට ටිකක් දිගට යනවා. නමුත් මේක යථාර්ථයක් බවට පත්කරන්න පුලුවන් වුණා. ඒවගේම අපටත් සහබන්දු මන්ත්‍රීතුමා කිව්ව වගේ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තියෙද්දි මම ප්‍රාදේශීය සභා සභාපති වුනා. අපේ ලොකු බලාපොරොත්තුවක් තිබුනෙ ආදාහනාගාරයක් ල බා ගැනීම පිළිබඳව. ඒකෙදි බලය තිබුන ආණ්ඩුවෙ මැති ඇමතිවරුත් මට හුගාක් උදවු කළා. ලක්ෂ 200 ක් මට දුන්නා. නමුත් අපට ඉඩමෙ අයිතිය නැති නිසා ඒක අපට ලබා ගන්න බැරිවුනා. ඊලගට ගයන්ත ඇමතිතුමත් අපට උදවු කළා. ඉතිං ඒවා අපි අමතක කරන්නෙ නැහැ. ඒක මම ප්‍රසිද්දියෙම කියල තියෙනවා. ඒක නැහැ කියන්නෙ නැහැ. මොකද අපට උදවු කරපු අය මතක තියෙනවා. වර්ථමානයේත් අපට අපේ ඇමතිවරු උදව් කරලා, ඒ වැඩකටයුතු කරන්න ලබන ජනවාරිවල විතර අපට මුදල් ලබා දෙන්න කටයුතු කරාවි. මම හිතන්නෙ ඒක යථාර්ථයක් බවට පත්කර ගන්න පුලුවන් වෙයි.

ගරු මන්ත්‍රීවරුනි, මම හිතනවා මම සභා නීති රීති ක්‍රියාත්මක කළානම් හරි කියලා. මම ඒ නීති රීති ක්‍රියාත්මක නොකල නිසා තමයි මේ අය තමතමන්ට ඕන විදියට හැසිරෙන්නෙ. මට මගේ බලතල පාවිච්චි කරන්න පුළුවන්. නමුත් එහෙම කලොත්, අන්තිමට ඔයාලා මාව විවේචනය කරනවා. ඉතිං ඒක නිසා කරුණාකරලා මන්ත්‍රීවරු සභාව හැල්ලුවට ලක් කරන්න එපා. මමත් නීතිය ක්‍රියාත්මක නොකරන නිසා වරද පිළිගන්නවා. අයවැය ඉවරයි. ඒක ප්‍රශ්නයක් නැහැ. මම අයවැය සම්බන්ධයෙන් ඕන දේකට බලාපොරොත්තුවෙන් තමයි අද මෙතනට ආවෙ. අයවැය පැරදුනත්, දිනුවත් මම නිමල් වික්ටර් නාගොඩවිතානම තමයි. මම මෙතනින් එලියට බහින්නෙත්, ආ විදිහටම තමයි. අනේ මට පක්ෂව ඡන්දය දෙන්න කියලා මම එහෙම කිව්වෙත් නෑ. කියලත් නෑ. ඉස්සරහට කියන්න බලාපොරොත්තුත් නෑ. මොකද මම වැරදි කරන්නෙ නැති නිසා. මම සියලුම මන්ත්‍රීවරුන්ට එක හා සමානව වැඩ කරනවා. නමුත් මම කියනවා. මන්ත්‍රීවරු 15 දෙනා මූලික කරගෙන තමයි හැම දේම කරන්නෙ. අනිත් අය අපහසුතාවයට පත් කරන්න නෙවෙයි. ඒක තමයි මම අර ගමේ මන්ත්‍රී එක්ක කතා කරන්න කියන්නෙ. ඒ එක්කම හැබැයි මන්ත්‍රීවරුත් දැනගන්න ඕන. සියලුම දෙනා පොදු වැඬේදි සුහඳව කටයුතු කරන්න.

ඒවගේම නෙරංජලී මන්ත්‍රීතුමිය කිව්වා දින පොතක අවශ්‍යතාවය. ඇත්තටම දිනපොතක් අවශ්‍යයි. මම ආණ්ඩුකාරතුමත් එක්ක ඒ සම්බන්ධව කතා බහ කරන්නම්. ඒ වගේම ජයවීර මන්ත්‍රීතුමා පොලීසිය පිළිබඳව සඳහන් කළා. නමුත් පොලිස් නිලධාරිනුත් එහෙම අසාධාරණ වැඩ කරන්නෙ නැහැ. අපි වරදක් කළොත් තමයි පොලිසියත් මේ වගේ කටයුතු කරන්නෙ. පොලීසියෙත් යම් යම් අකටයුතුකම්, අසාධාරණකම් කරන නිලධාරි ඉන්නවා. නමුත් සමස්ථ පොලීසියම එහෙම වෙන්නෙ නැහැ. මොකද මම දැනගත් ආකාරයට ඒ සිදුවීමෙදිත්, ඒ ළමයා බයිසිකලය නවත්තන්නෙ නැතුව ගිහිල්ලා. ඒ ළමයගෙත් තියෙන පොඩි බය වීමක් නිසා වෙන්න ඇති. අවසාන වශයෙන් අපිට ලබාදුන් සහයොගය පිළිබඳව උප සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලට ස්තූති වන්ත වෙමින්, විශේෂයෙන්ම අද අයවැය ඉදිරිපත් කිරීමට කටයුතු කළ ලේකම්තුමිය ඇතුලු ඒ නිලධාරී මඩුල්ල ඇතුලු සියලු දෙනාට ප්‍රණාමය ස්තූතිය පුද කරමින්, විශේෂයෙන්ම ලබන 2021 වර්ෂය අපි කාටත් සෞභාග්‍යමත් හොඳ දේශයක් වශයෙන් ඉදිරි අනාගතේ දකින්න වාසනාව ලැබේවා. ඒ වගේම මම විශේෂයෙන් කියන්න ඕන. අපි නිතරම කියනවා. කොරෝනා වසංගත

තත්වය ඉන්දියාවෙ තියෙනකම්, අපට යහපත් නැහැ. ඒ නිසා මේ කොරෝනා වසංගත තත්වය අපේ බල ප්‍රදේශයෙන් තුරන් කරන්නට, ඔය සියලු දෙනාගේම ආරක්‍ෂාවත් ලබාගෙන, ඒ ශක්තිය අපට දෙන්න. යම් යම් අඩුපාඩු තියෙනවනම් ඒවා විසදා ගන්න අපට ශක්තිය දෙන්න. එහෙමනම් ලබන 2021 වර්ෂය සියලු දෙනාට සුබ අලුත් අවුරුද්දක් වේවා. ඒ වගේම ලබන වර්ෂයෙදි අපි සියලු දෙනාම හොඳ ගමනක් යන්නට සියලු දෙනා එක්ව කටයුතු කරන්න වාසනාව, ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. සැමට සම්මා සම්බුදු සරණ ප්‍රාර්ථනා කරනවා. බොහොමත්ම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-